31 වන කාණ්ඩය
4 වන කලාපය

සඳුද
1984 නොවැම්බර් 19

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

1984 නොවැම්බර් 16 වන සිකුරාද
*[වැඩ කටයුතු ඉදිරියට ගෙනයෑම]*

**විසර්ජන පනත් කෙටුම්පත, 1985 [ දෙවන වෙන් කළ දිනය ]**
දෙවන වර කියවීම – විවාදය කල් තබන ලදී.

---

1984 නොවැම්බර් 19 වන සඳුද

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 1985 [ තුන්වන වෙන් කළ දිනය ] :**
දෙවන වර කියවීම – විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 31
இல. 4

திங்கட்கிழமை
19 நொவம்பர் 1984

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

வெள்ளிக்கிழமை, 16 நொவம்பர் 1984

[நிகழ்ச்சித் தொடர்]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1985 [ஒதுக்கப்பட்ட இரண்டாம் நாள்] :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

திங்கட்கிழமை, 19 நொவம்பர் 1984

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1985 [ஒதுக்கப்பட்ட மூன்றும் நாள்] :
இரண்டாம் மதிப்பு—விவாதம் தொடர்கிறது

---

Volume 31
No. 4

Monday
19th November 1984

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT
(Uncorrected)

## PRINCIPAL CONTENTS

**Friday, 16th November 1984**
[ *Continuation of Proceedings* ]

APPROPRIATION BILL, 1985 [Second Allotted Day] :
Second Reading – Debate adjourned

---

**Monday, 19th November 1984**

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 1985 [Third Allotted Day] :
Second Reading – Debate continued

2–A 080212–3,250 (84/11)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1984 නොවැම්බර් 16 වන සිකුරාද**

**வெள்ளிக்கிழமை, 16 நொவம்பர் 1984**

*Friday, 16th November 1984*

***[1984 නොවැම්බර් 16 වන සිකුරාද නිල වාර්තාවේ 410 වන තීරුවේ සිට ඉතිරි වැඩ කටයුතු]***

***[1984 நொவம்பர் 16 வெள்ளிக்கிழமைய அதிகார அறிக்கை பத்தி 410 இலிருந்து நிகழ்ச்சித்தொடர்]***

*[Continuation of Proceedings from Col. 410 of* OFFICIAL REPORT *for Friday, 16th November 1984.]*

## විසර්ජන පනත් කෙටුම්පත, 1985
### ஒதுக்கீட்டுச் சட்ட மூலம், 1985
### APPROPRIATION BILL–1985

එන්. ඒ. සෙනෙවිරත්න මහතා
(திரு. என். ஏ. செனெவிரத்ன)
(Mr. N. A. Seneviratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රකාශ කරමින් සිටියේ ගරු මුදල් ඇමතිතුමා දේශීය වෙදකම තහාලීම සඳහා මේ අයවැය ලේඛනයේ ඉදිරිපත් කර ඇති හොඳ පිළිවෙලවල් පිළිබඳවයි. එතුමාගේ කථාවේදී එතුමා කිව්වා රටේ ආර්ථිකයේ ලෙඩ සුව කරන වෛද්‍යවරයෙක් කියා මුදල් ඇමතිවරයා. මට කියන්න පුළුවන් අපේ වර්තමාන මුදල් ඇමතිතුමා විශේෂයෙන් මේ රටේ හා සමාජයේ ආර්ථිකයේ ලෙඩ පිළිබඳව මනා අවබෝධයක් ඇතිව ලෙඩ සුව කිරීමට දක්ෂ වෛද්‍යවරයෙක්ය කියා. එතුමා අපට සාමාන්‍යයෙන් හඳුන්වන්න පුළුවන් වන්නේ බටහිර වෛද්‍යවරයෙක් වශයෙන් නොව ආයුර්වේද වෛද්‍යවරයෙක් වශයෙනුයි. අපි බලමු එතුමා ලෙඩ සුව කරන්න සොයා ගත්තේ මොන විධියේ බෙහෙත්ද කියා. අපේ සිංහල වෙද මහත්වරුන් ලෙඩ සුව කරන්න සොයාගත්තේ ගස්වල මුල්, පොතු, කොළ, මල් යනාදී වර්ගයි. අන්න ඒ වාගේ අපේ මුදල් ඇමතිතුමාත් ආර්ථිකයේ ලෙඩ සුව කරන්න බැලුවේ ගමේ රටේ ප්‍රදේශයේ සමාජයේ ප්‍රශ්න අවබෝධයක් තියාගෙනය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

1977 පෙර සිටි මුදල් ඇමතිවරුන් මේ රට පිළිබඳව කිසිම හැඟීමක් නැතිව මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් පිළිබඳව කිසිම අවබෝධයක් නැතිව ඒ අය දුරු න්‍යායයන් අනුව අයවැය ලේඛන ඉදිරිපත් කළා ; ප්‍රතිපත්ති සකස් කළා. අපි විශේෂයෙන් වගකිවයුතු කාර්යයක් කරන, රටක් පාලනය කරන පාලකයන් වශයෙන් ජනතාවගේ සිතුම් පැතුම්, රටේ පවතින පරිසරය, ජනතාවගේ හැඟීම් අවබෝධ කරගෙන ආර්ථික සැලසුම් සකස් කිරීම ඉතාම වැදගත්ය කියන එක මේ අවස්ථාවේදී කියන්නට කැමතියි. වෙනත් රටවල ඇති කළ දේවල් ඒ තත්ත්වයෙන්ම මේ රටට ගෙන ඒමට උත්සාහ ගැනීමත්, ඒ අදහස් උදහස් මේ රටේ ආර්ථිකයට ඇතුළු කිරීමට යාමත් නිසා මේ රටේ ආර්ථිකයට පසුගිය කාලය තුළ විශාල පාඩු සිදු වුණ බව තමුන්නාන්සේලාට පෙනෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් ලෝකයේ සමහර රටවල ජනසතු ව්‍යාපාර පවත්වාගෙන යනවා. ඒ ජනසතු ව්‍යාපාර, ඒ ප්‍රතිපත්ති මතම, ඒ ආකාරයෙන්ම මේ රටේ ඇති කිරීමට යාම නිසා අද මේ රජයටත් සමහර සංස්ථාවල් නිසා විශාල ප්‍රශ්න ඇති වී තිබෙනවා. ඒ නිසා රටක් පාලනය කරන පාලකයින් වශයෙන්, පිටරට න්‍යායයන්ට ගැති නොවී මේ රටේ යථා තත්ත්වය අවබෝධ කරගෙන, මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් පිළිබඳ අවබෝධයක් ඇති කරගෙන රටට අවශ්‍ය සැලසුම් ඇති කිරීම ඉතාමත් වැදගත්ය කියන එක අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

ඊළඟට විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යයක් හැටියට මහවැලි ව්‍යාපාරය හඳුන්වන්නට පුළුවනි. 1977 දී මේ රජය බලයට පත් වන විට මහවැලි යෝජනා ක්‍රමය සැලසුම් කර තිබුණේ අවුරුදු තිහකින් අවසන් කරන්නටයි. යම්කිසි කාර්යයකට අත ගහනවිට, සැලසුමක් ඇතිව, කිසිම භයක් නැතිව ඒකට අත ගැසීම එක්සත් ජාතික පක්ෂයේ අපේ නායකයන්ගේ පුරුද්දක් වී තිබෙනවා. අවුරුදු තිහකින් ඉවර කරන්නට තිබුණු මහවැලි යෝජනා ක්‍රමය අවුරුදු හයකින් අවසන් කළ යුතුය කියා අතිගරු ජනාධිපතිතුමා තීරණයක් ගත්තා. ඒ කාර්යය සාර්ථක කරන්න අමාරුයි කියා ඒ තීරණය ගත්ත අවස්ථාවේදී සමහර උදවිය කල්පනා කළා. සමහර අය හිත යටින් හිනා වුණා. නමුත් අතිගරු ජනාධිපතිතුමාගේ නිර්භීත තීරණයත්, මුදල් ඇමතිතුමාගේ මුදල් සෙවීමේ ක්‍රමත්, ඒ කාර්යය භාරව සිටි මහවැලි සංවර්ධන ඇමතිතුමාගේ දක්ෂතාවත් උඩ එම කටයුත්ත අවුරුදු හයෙන් සම්පූර්ණ කරන්නට හැකියාවක් ලැබෙන තත්ත්වයකට ගෙන ඒමට මාර්ගය සැලසුණු බව අපි ඉතාමත් සන්තෝෂයෙන්, ඉතාමත් ආඩම්බරයෙන් කියනවා. ඒ නිසයි රජයකට ප්‍රතිපත්ති තිබෙන්නට ඕනෑ. එය ඉතා වැදගත් කාර්යයක් හැටියට සලකන්නට ඕනෑ.

පාලනය කරන්නට රටක් තිබෙන්නට ඕනෑ බව ආණ්ඩු පක්ෂය වුණත්, විරුද්ධ පාර්ශ්වය වුණත් කල්පනා කරන්නට ඕනෑ. පාලනය කරන්නට ජනතාවක් රටේ ඉන්නට ඕනෑ. ඒ රටේ ජනතාවගේ සිතුම් පැතුමුත් අවශ්‍යතාවනුත් සලකා බලායි රටේ පාලන තන්ත්‍රය සකස් කරන්නට වෙන්නේත්, ආර්ථිකය හැඩගස්වන්නට වෙන්නේත්. ඒ තත්ත්වයට නොබැස්සොත් රටේ අනාගතය ඉතාම අඳුරු තත්ත්වයකට පත් වන්නට පුළුවන් බව අපි විශේෂයෙන් කියන්නට කැමතියි. මේ රටේ යම් යම් අවස්ථාවලදී ගත්, යම් යම් අදූරදර්ශී පියවරවල් නිසා අද අපි නොයෙක් විපාක විඳිනවා. ඒ විපාකවලින් බේරීමට නම් පාලකයන් විසින් සෑම විටම දූරදර්ශී පියවරවල් ගැනීම අත්‍යවශ්‍යය කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරනවා.

ඊළඟට ගරු මුදල් ඇමතිතුමා විසින් මහජන ආධාර වැඩි කිරීමට කටයුතු සලස්වා තිබෙනවා. ඇත්ත වශයෙන්ම එය එතුමා ගත් ඉතාමත්ම වැදගත් පියවරක්ය කියන එක අපට සඳහන් කරන්නට පුළුවනි. සමහර පවුල්වලට, දුප්පත් උදවියට අද රුපියල් විස්සක, තිහක මහජන ආධාරයක් ලබා ගෙන ජීවත් වෙන්නට අමාරු තත්ත්වයක් තිබෙනවා. ඒ මුදල වැඩි කර, ආදායමක් නොලබන ඉතා දිළිඳු පවුල්වලට ආධාර කිරීමේ ක්‍රමයක් මේ අයවැයෙන් සකස් කර තිබීම ඉතාමත් වැදගත්ය කියන එක අපට මේ අවස්ථාවේදී සඳහන් කරන්නට පුළුවනි. ඊළඟට ගරු මුදල් ඇමතිතුමා පෝෂණය සම්බන්ධයෙන් හුඟක් දුරට කල්පනා කර තිබෙනවා. රටකට පෝෂණය ඉතාමත් අවශ්‍යයි. අද මන්දපෝෂණයෙන් ඉතා සැලකිය යුතු පිරිසක් පෙළෙනවා. ඒ අයගේ පෝෂණ තත්ත්වය දියුණු කිරීමට මේ අයවැයෙන් මුදල් වෙන් කර තිබීම ඉතාමත්ම වැදගත් කාලෝචිත ක්‍රියාවක්ය කියන එක අපට මේ අවස්ථාවේදී ඉතාමත් සන්තෝෂයෙන් සඳහන් කරන්නට පුළුවනි.

ඊළඟට තවත් කාරණයක් කිව යුතුව තිබෙනවා. මේ රජයේ 8 වන අයවැය ලේඛනය අලියා ගිලපු දිවුල් ගෙඩියක් වගේ පුස්සක්ය කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කියා තිබෙන බවක් පත්තරයක සඳහන් වී තිබෙනවා මම දැක්කා. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අලියා ගිල්ල දිවුලක් වාගේයයි එතුමා කිව්වා නම් එය බොහෝම සාධාරණයි. මේ අය වැය ලේඛනයෙන් සහනයක් තිබෙන්නේ හතළිස් පන්දහක් බදු ගෙවන ජනතාවට පමණක්යයි එතුමා කියනවා. මම එක් කරුණක් පෙන්නා දෙන්න කැමතියි. තීරු බදු අහෝසි කිරීම නිසා රබර් මිල කිලෝවකට රුපියල් දහතක් වන ස්ථාවර තත්ත්වයකට පත්කර තිබෙනවා. මෙයින් සහනය සැලසෙන්නේ කාටද ? කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු ඉඩම් හිමියන් හතළිස් පන්දහක් සිටිනවා. සුළු ඉඩම් කට්ටි හතළිස් පන් දහක් තිබෙනවා. පවුල් විසි පන්දහක් මෙයින් ජීවත් වෙනවා. ඒ හතළිස් පන්දහට මේ අනුව සහන සැලසෙන බව මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. මේ අනුව අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය හරිදැයි මම අහන්න කැමතියි. මේ අය වැය ලේඛනයෙන් මේ රටේ බදු ගෙවන්නන්ට පමණක් නොව මේ රටේ ගොවියාට පමණක් නොව මේ රටේ කම්කරුවාට පමණක් නොව ව්‍යාපාරිකයාට පමණක් නොව මේ රටේ සෑම තරාතිරමකම පුද්ගලයකුටම සහනයක් සැලසෙන අයුරු අනාගත සංවර්ධනයක් රටේ ඇති වන අයුරු ගරු මුදල් ඇමතිතුමා එය ඉදිරිපත් කර තිබෙනවා.

ඊළඟට මම පෙන්නා දෙන්න කැමතියි අපේ වර්තමාන රජය විසින් ආරම්භ කරන ලද යෝධ සංවර්ධන ව්‍යාපාර පිළිබඳ කරුණු කීපයක්. වෙන කොයි රජයද මේවාගේ යෝධ ව්‍යාපාර ආරම්භ කළේ ? සිංහල රාජාවලියේ සිට 1977 තෙක් ඇතිවුණු සංවර්ධනයත් 1977 න් පසු ඇතිවුණු සංවර්ධනයත් ගැන සලකා බලන විට මේ අවුරුදු හත තුළ ඇති වුණු සංවර්ධනය ඉතා විශාල බව කියන්න කැමතියි. එයින් ප්‍රයෝජනය ගත්තා ජන සංඛ්‍යාව ඉතා විශාලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. ජී. සෙනෙවිරත්න මහතා]

පත්තරවලට නොයෙක් ප්‍රකාශ කිරීමෙන් මේ රටේ ජනතාව රවටන්න පුළුවන්යයි සමහර දේශපාලනඥයන් කල්පනා කරනවා. මම හිතන හැටියට මේ රටේ වාමාංශික දේශපාලනඥයන් කළ අන්තිම මෝඩකම හාල්සේරුව ගැන කතාකර බඩු මිල ගැන කතා කර මේ රටේ ජනතාවගේ හිත දිනා ගන්නට පුළුවන්යයි කල්පනා කිරීමයි. ජනතාව දේශපාලනඥයන්ට වඩා බුද්ධිමත්. මේ රටේ ජනතාව නිතරම අවදිවයි ඉන්නේ. දේශපාලනඥයෙක් යම් ප්‍රකාශයක් කරන විට එය රටට ලැදිව කරන ප්‍රකාශයක්ද රට ගැන ලැදිකමක් නැතිව කරන ප්‍රකාශයක්ද යන වග ජනතාව දන්නවා. මේ රටේ ඉන්නේ ඒ විධියේ බුද්ධිමත් ජනතාවක්. අපි ජනතාවගේ බුද්ධිය ගැන සැක හිතන්න හොඳ නැහැ. ජනතාව බුද්ධිමත් නැත යන හැඟීමෙන් යම් - යම් ප්‍රකාශ කිරීම සම්පූර්ණයෙන්ම වැරදි බව මම කියන්න කැමතියි. ඒ නිසා අප කතා කරන්නේ මේ රටේ බුද්ධිමත් ජනතාවකට බව විශේෂයෙන්ම කල්පනා කරන්න ඕනෑ.

මේ රජයෙන් ජනතාවට සිදු වන සේවය ඔවුන් හොඳටම දන්නවා. ජනතාව එය ඔප්පුකර තිබෙනවා. සමහර අය නිතරම ඉලෙක්ෂන් එකක් ඉල්ලනවා. නමුත් ඉලෙක්ෂන් දුන්නාම මොකද වෙන්නේ ? වැඩි ඡන්ද එක තැනක දහ සය දහයි අනෙක් තැන නම දහයි. ඡන්දය ඉල්ලන විට එය දෙනවා. තරග කර පරදිනවා දහස් ගණන්වලින්. තවත් මේ අය ඡන්ද ඉල්ලන්නේ මොකටද ? ඡන්දය දුන්නාම එය දිනා ගන්නට බැරි නම් ඒ වෙනුවෙන් තව තවත් සල්ලි නාස්ති කිරීම කාලෝචිත කරුණක් නොවන බවයි මගේ හැඟීම.

ග්‍රාමීය සංවර්ධනය සඳහා මේ තරම් අත හිත දුන් වෙනත් රජයක් ලංකාවේ කවදාවත්ම තිබුණේ නැහැ. ඉදිරියට ඇති වෙයයි කියන්නත් බැහැ. විදුලි බල යෝජනා ක්‍රම ගමට ගෙන ගියේ වර්තමාන ජනාධිපතිතුමාගේ මේ රජය බව මම ආඩම්බරයෙන් සඳහන් කරනවා. විදුලිය සිහිනයක්ව තිබුණු වත්තිය උඩරට ගම්බද ප්‍රදේශවල ජනතාවට විදුලි බුබුළු දැකගන්නට ලැබුණේ මේ රජයෙන් බව මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. මේ රජයේ ප්‍රතිපත්ති නිසයි එය ලැබුණේ. අපේ කාලය තුළදී මේ රටේ දිය හැකි සෑම නිවසකටම විදුලි බලය ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. රජයකින් ඉටු විය යුතු සේවාවන් මේවායි.

ඊළඟට, උළු ගෙයක් ගැන හීන දැක - දැක, උපන් ද සිට මැරෙනතුරු පොල්අතු වහළ යට සිට මියයන්නට තිබුණු පුද්ගලයන්ට උළු ගේක ජීවත් වීමේ වාසනාව ලැබුණේ මේ රජයේ ගරු අගමැතිතුමාගේ නිවාස ප්‍රතිපත්තිය මත බව මම ආඩම්බරයෙන් සඳහන් කරනවා. මේ විධියට ජනතාවගේ අවශ්‍යතා සපුරණ ජනතාවට අවශ්‍ය දේ අවශ්‍ය වේලාවට ලබා දෙන ප්‍රතිපත්තියක් ඇති රජයක් 1977 සිට මේ දක්වා මේ රටේ තිබෙන්නේ.

අලියා ගිල්ල දිවුල් ගැන කරන ප්‍රකාශවලට හෝ මැතිවරණ නැහැ. මැතිවරණ ඕනෑ කියන කෑගැසීම්වලට මේ රටේ ජනතාව මුලා නොවන බව අපි කියනවා. සමහර අය අවුරුදු හතළිහක් තුළ කෑගැසුවා. ඒ අයගේ දේශපාලන අනාගතය කෙළවර වුණේ ගෙවල්වලින්. එක්සත් ජාතික පක්ෂ රජයේ අතීතය, එක්සත් ජාතික පක්ෂයේ අතීතය මේ රටේ ජනතාව දන්නවා. එක්සත් ජාතික පක්ෂයේ වර්තමානය මේ රටේ ජනතාව දන්නවා. ඒ තුළින් ජනතාව නිගමනය කරනවා, එක්සත් ජාතික පක්ෂ රජයකින්ය මේ රට දියුණු කරන්න පුළුවන් වන්නේ කියා. එයයි, බුද්ධිමත් ජනතාවගේ ක්‍රමය. මේ රටේ සිටින්නේ බුද්ධිමත් නොවන ජනතාවක් නොවෙයි. ඒ බුද්ධිමත් ජනතාව අවශ්‍ය වේලාවේදී ඒ ආණ්ඩුව පෙරළුවා. 1977 දී පත්වූ මේ ආණ්ඩුවට 1982 දී නැවත වරක් විශිෂ්ට ජයග්‍රහණයක් මේ රටේ ජනතාව ලබා දුන්නේ ඇයි ? මේ රටේ ප්‍රශ්න විසඳිය හැකි එකම නායකත්වය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ නායක ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ළඟය කියා අපේ රටේ ජනතාව කල්පනා කළා. විරුද්ධ පාර්ශ්වය කොපමණ බොරු කීවත්, මොනවා කීවත් ඒ කිසිවක් අසන්නේ නැතිව එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය නැවත වරක් සනාථ කළේ අන්න ඒ නිසයි කියන එක මම මේ අවස්ථාවේදී ඉතාමත් සන්තෝෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය මීට පෙර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම 9 ක් ආරම්භ කර තිබෙනවා. තවත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම විශාල ප්‍රමාණයක් ආරම්භ කරන බව ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ සඳහන් වුණා. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයක් ඇති කිරීමට දැන් කටයුතු කරගෙන යනවා. මේ යෝජනා ක්‍රමයේ මුල් තැන දී තිබෙන්නේ කර්මාන්තවලටයි. ලංකාවේ මෙතෙක් ඇති කළ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමවලින් කර්මාන්ත අංශයට මුල් තැන දුන් එකම යෝජනා ක්‍රමය කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති කරන යෝජනා ක්‍රමය බව මම ඉතා සන්තෝෂයෙන් සඳහන් කරනවා. මෙම යෝජනා ක්‍රමය හැකි ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සලස්වන ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙනුත් මැති ඇමතිවරු වෙනුවෙනුත් මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සෑම ප්‍රදේශයකම වාගේ ඉඩම් හිඟය ඉතාමත් බැරෑරුම් තත්ත්වයකින් පවතින බව මම සඳහන් කරන්න කැමතියි. මේ ප්‍රශ්නය විසඳීම සඳහා මේ රජය විසින් යෝධ ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. මහවැලි යෝජනා ක්‍රමයෙන් පමණක් අක්කර ලක්ෂ ගණනක් අස්වද්ද මේ රට ස්වයංපෝෂිත කිරීමට දක්ෂ පුද්ගලයින්ට අවස්ථාවක් සලස්වන්න යනවා. මහවැලි යෝජනා ක්‍රමය යටතේ දැන් කෑගල්ල දිස්ත්‍රික්කයට ඉඩම් බෙදාගෙන යනවා. මෙහි පළමුවෙනි අදියර යටතේ ඉඩම් කට්ටි 900 ක් කෑගල්ල දිස්ත්‍රික්කයට ලබා දී තිබෙනවා. මම හිතන හැටියට ගරු මහවැලි සංවර්ධන ඇමතිතුමාගේ බලාපොරොත්තුවක් තිබෙනවා, මහවැලි යෝජනා ක්‍රමය යටතේ එම ඉඩම්වල ලක්ෂ ගණනක් පදිංචි කරවන්න. මේවායින් ඇතිවෙන ප්‍රයෝජන මේ රටේ අනාගත පරම්පරාවට ඇතිවෙන ප්‍රයෝජන බව ඉතා ආඩම්බරයෙන් අපි සඳහන් කරනවා. ඇත්තවශයෙන්ම මේ අන්දමින් දූරදර්ශීව කටයුතු කිරීමට මේ රජයට හැකි වූයේ මේ රටේ ජනතාව රජය කෙරෙහි තැබූ ප්‍රබල විශ්වාසය කියන එක අප ඉතාමත් ආඩම්බරයෙන් සහ සන්තෝෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා ගරු මුදල් ඇමතිතුමා මේ වතාවේදී ඉදිරිපත් කළ අයවැය ලේඛනය මේ රටේ මුළු මහත් ජනතාවගේ සුභසිද්ධියත් මේ රටේ සංවර්ධනයත් ඇති කිරීමට ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයක් බව සඳහන් කරමින් මට මේ අවස්ථාව සලසා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

අ. භා. 1.47

ගාමිණී ලොකුගේ මහතා (කැස්බෑව)
(திரு. காமினி லொகுகே — கெஸ்பாவ)
(Mr. Gamini Lokuge-Kesbewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 8 වෙනි අයවැය ලේඛනයේ දෙවනවර කියවීමේ විවාද අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව සලසාදීම ගැන පළමුකොට තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වෙනවා.

මේ රජය 1977 දී රට භාරගත් අවස්ථාවේ සිට මේ දක්වා අයවැය ලේඛන 8 ක් ඉදිරිපත් කර තිබෙන බව අපි කල්පනා කරන්න ඕනෑ. එහෙමනම් අපි ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ රටේ ආර්ථිකයේ තිබුණු පැලැස්තර අවුරුද්දෙන් අවුරුද්ද ගලවා ඒවා සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් යෙදීම ගැන. ඒ වාගේම මෙම අයවැය ලේඛනය මේ රටේ ආර්ථිකය හොඳ ගමන් මගකට යොමු කළ අයවැය ලේඛනයක්ය කියා මම ප්‍රකාශ කරන්න කැමතියි. අපි මේ අයවැය ලේඛනය ගැන කථා කරන කොට මේ අයවැය ලේඛනයෙන් රටේ ජීවත් වෙන මහජනතාවගේ යහපත පිණිස මොන විධියේ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද, මේ අයවැය ලේඛනයෙන් මහජනතාවට මොන විධියේ සහනයක් දී තිබෙනවාද යන්න ගැන කල්පනා කරන්නට ඕනෑ. අද සමහර උදවිය කල්පනා කරනවා අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේ මහජනතාවට දිව්‍ය ලෝක සැප සම්පත් ලබා දෙන්නය කියලා. සමහර උදවිය අයවැය ලේඛනයකින් නොවූවමනා ලාභ ප්‍රයෝජන හෝ අති විශාල දේවල් බලාපොරොත්තු වෙනවා. නමුත් සමස්ථයක් හැටියට අපේ මේ අයවැය ලේඛනය අරගෙන බැලුවොත් මෙයින් මුළු රටේම පොදු මහජනතාවට යම්කිසි යහපතක් යම්කිසි සේවාවක් සලස්වන බව පෙනී යනවා ඇති. මෙම අයවැය ලේඛනයට ඇතුළත් කර තිබෙන කරුණු එකින් එක අරගෙන බැලුවොත් මේ රටේ වාසය කරන මහජනතාවටත් අපේ ආර්ථික දේහයටත් යම්කිසි සේවාවක් සහ යම්කිසි ශක්තියක් මේ අයවැයෙන් දෙන බව පෙනී යනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික අංශයේ රක්ෂාවල යෙදී සිටින ඒවාගේම යම් යම් ස්වයං රක්ෂා කරගෙන ජීවත් වන විශාල සංඛ්‍යාවක් මේ රටේ ඉන්නවා. මීට ප්‍රථමයෙන් අපේ අයවැය ලේඛනයකින් රාජ්‍ය අංශයේ සේවය කරන උදවියට බදු සහන ලබා දුන්නා. ඒවාගේම අවුරුදු ගණනාවකට පසු 1977 න් පසුව තමයි රටේ රැකීරක්ෂා කරන මහජනතාවටත් රාජ්‍ය අංශයේ සේවකයන්ටත් පඩි වැඩිවීම් ලබා දුන්නේ. අප බලයට පත්ව පසුගිය කාලය තුළ ඉදිරිපත් කරන ලද සෑම අයවැය ලේඛනයකින්ම රාජ්‍ය අංශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැම කොටසකටම යම්කිසි දීමනාවක් යම්කිසි පහසුවක් ලබා දුන්නා. 1970 සිට 1977 වන තෙක් අයවැය ලේඛන හතක් ඉදිරිපත් වුණා. ඒ සැම අයවැය ලේඛනයක්ම අරගෙන බැලුවොත් ඒ සැම එකකින්ම සැමදම රටේ පොදු මහජනතාවට යම්කිසි අමාරුවක්, යම්කිසි අසහනයක්, යම්කිසි කරදරයක් වූ බව පෙනී යනවා ඇති. නමුත් අපේ රජය බලයට පත් වූවාට පසු 1977 සිට මේ දක්වා ඉදිරිපත් කරන ලද සැම අයවැය ලේඛනයකින්ම රටේ සාමාන්‍ය මහජනතාවට මධ්‍යම පන්තියේත් පහළ මධ්‍යම පන්තියේත් උදවියට නොයෙකුත් සහනයන් සහ පහසුකම් ලැබී තිබෙනවා. දැන් මේ අයවැය ලේඛනයෙන් පෞද්ගලික අංශයේ රු. 24,000/= ක් දක්වා වාර්ෂික ආදායමක් ලබන්නා වූ උදවිය ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙනවා. එයින් පෞද්ගලික අංශයේ සේවක මහත්වරුන්ට විශාල යහපතක් අත් වී තිබෙනවා. එපමණක් නොවෙයි. සුළු ව්‍යාපාර කරගෙන යන උදවියටත් ස්වයං ව්‍යාපාර, කුඩා කර්මාන්ත කරගෙන යන උදවියටත් එමගින් විශාල සහනයක් ලැබෙනවා. වර්ෂයකට රු. 24,000/= ක් කිව්වාම මාසයකට රු. 2,000/= ක්. පෞද්ගලික අංශයේ වැඩ කරන උදවිය ආදායම් බදු ගෙවන්නට ආදායම් බදු වාර්තා ඉදිරිපත් කරන්නට ලොකු අකැමැත්තක් දක්වනවා. ඒවා හරියාකාර පෙන්නුම් කරන්නට බියක් දක්වනවා. නමුත් මෙවැනි සහන සලස්වන විට ඒ අය නිවැරදි ආදායම් වාර්තා ඉදිරිපත් කරනවා. එසේ නිවැරදි ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම ඒ අයගේ ව්‍යාපාර පවත්වාගෙන යෑමට ලොකු පහසුවක් වෙනවා. ඒ උදවියගේ ව්‍යාපාරවලට ආධාර උපකාර ලබා ගන්නට බැංකුවලින් ණය පහසුකම් ලබා ගන්නට එය උපකාරී වෙනවා. මේ තත්ත්වය රටපුරාම ප්‍රචලිත කිරීම සුදුසුය කියා මා කල්පනා කරනවා. මේ දී තිබෙන සහනයන් අනුව සුළු ව්‍යාපාරිකයන් හරියාකාර ආදායම් වාර්තා ඉදිරිපත් කළොත් එය ඒ අයගේ ව්‍යාපාරික කටයුතුවලට විශාල පහසුවක් වන බව පෙන්නුම් කර දෙන්නට ඕනෑ. ඒ නිසා අපට කියන්න පුළුවන්, රාජ්‍ය අංශයට අමතරව පෞද්ගලික අංශයේ සේවය කරන අයටත් මේ අයවැයෙන් විශාල සහනයක් ලැබී තිබෙනවාය කියා.

මේ අයවැය ලේඛනයේ වැදගත්ම අංගය වන්නේ විදේශ විනිමය උපයන කර්මාන්තවලට, විදේශ විනිමය වුවමනා කරන කර්මාන්තවලට දී ඇති සහනයි. අද මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ, දියුණු කරන්න පුළුවන් වන්නේ විදේශ විනිමය ඉපැයුවොත් පමණයි. එම නිසා මේ රජය බලයට පත් වුණාට පස්සේ විදේශ විනිමය උපයන, විදේශ විනිමය උපයන්න උත්සාහ කරන, ඒ ගැන උනන්දු වන හැම කෙනකුටම අයවැය ලේඛන මඟින් සහන ලබා දී තිබෙනවා.

නමුත් මේ අයවැය ලේඛනයෙන් සහන ලබා දී තිබෙන්නේ විදේශ විනිමය උපයන්නන්ට පමණක්ම නොවෙයි. සියයට 75 කට වඩා දේශීය අමුද්‍රව්‍ය පාවිච්චි කරන කර්මාන්තවලටත් විශාල සහනයක් ලබා දී තිබෙනවා. එවැනි කර්මාන්ත සඳහා කලින් දී තිබුණු අවුරුදු පහේ බදු සහනය අවුරුදු 10 ක් දක්වා දික් කොට සියයට 50 බදු සහනයක් දී තිබෙනවා. එහෙම නම් එවැනි කර්මාන්ත මේ රටේ දියුණු වීමට එය විශාල රුකුලක් වෙනවා නේද? ඒ හැරෙන්න ඒ මඟින් මේ රටට විදේශ විනිමයත් ලැබෙනවා. එපමණකුත් නොවෙයි. ඒ කර්මාන්ත දියුණු වීම මේ රටේ රැකියා ප්‍රශ්නයටත් පිළියමක් වෙනවා.

මේ වගේ ප්‍රශ්න දිහා අපි බැලිය යුත්තේ, මේ වගේ තත්ත්වයන් ගැන අපි කල්පනා කළ යුත්තේ, කථා කළ යුත්තේ මේ රට කෙරෙහි, මේ රටේ ජනතාව කෙරෙහි ආදරයක් ඇති පුද්ගලයන් වශයෙන් මිස මේ ආණ්ඩුව කෙරෙහි ඇති අකමැත්ත නිසා ආණ්ඩුව අප්‍රසාදයට පත් කිරීමේ අභිලාශයෙන් මහජනතාවට වැරදි අවබෝධයක් ලබා දීමේ අටියෙන් නොවන බවත් මතක් කරන්න කැමතියි.

මේ කර්මාන්ත දියුණු වුණොත් අපේ රටට විදේශ විනිමය ලැබෙනවා පමණක් නොවෙයි, එමගින් අපේ ජනතාවට වැඩි - වැඩියෙන් රැකියා අවස්ථාත් උදා වන අතර ආදායම් මාර්ගත් උදා වන බව නැවතත් අවධාරණයෙන් මතක් කරන්න කැමතියි.

අපි කර්මාන්ත ගැන කථා කරනවා නම් ඒවා සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වන්නත් සිදු වන බව අපි කල්පනා කරන්න ඕනෑ. යම්කිසි කර්මාන්ත හිමියෙක් තම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන අපනයනය කරනවා නම් ඒ කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ රේගු බදුවලින් තොරව නිදහසේ ගෙන්වන්නත් මේ අයවැය ලේඛණය මඟින් අවසර දී තිබෙනවා. එහෙම නම් මේ රටට ආදරයක් ඇති, මේ රටේ ආර්ථිකය දියුණු කරන්න වුවමනාවක් ඇති පුද්ගලයන් වශයෙන් ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පළ කරන්න ඕනෑ. එතුමාගේ මේ අයවැය යෝජනා ක්‍රියාත්මක වීම තුළින් මේ රටේ ආර්ථිකය ශක්තිමත් වන, දියුණු වන, ගමන් මඟකට අඩිතාලම දමා තිබෙන බව අපට කියන්න පුළුවනි. එහෙම නම්, ඒ අන්දමට එතුමා කල්පනා කර තිබෙනවා. ඈත ගම්බද පළාත්වලට, රැකියා විරහිත පළාත්වලට යම් යම් පහසුකම් නොමැති පළාත්වලට කර්මාන්ත ව්‍යාපාර සඳහා අද කාර්මිකයෝ ඇදී යනවා. එතුමා ඒ ගැනත් කල්පනා කර තිබෙනවා. එවැනි පළාත්වල කර්මාන්ත ඇති කරනවා නම්, කර්මාන්ත දියත් කරනවා නම්, ඒ කර්මාන්තවලට යම් යම් සහන දෙන්න ඕනෑ.

මේ කර්මාන්ත ව්‍යාපාර කාටවත් පවත්වාගෙන යන්න බැහැ, ඒවායින් යම්කිසි ලාභයක් නොලැබෙනවා නම්. කවුරුවත් ව්‍යාපාරයක යෙදෙන්නෙ නැහැ, එයින් ලාභයක් නැත්නම්. අද බැංකුවලින් ණය ලබාගෙන, වෙනත් ආයතනවලින් ණය ලබාගෙන තමයි, කර්මාන්ත පවත්වාගෙන යන්නේ. එසේ කරන්නේ යම්කිසි ආදායමක්, යම්කිසි ලාභයක් ලබන්නයි. එහෙම නම් එතුමා ඒ අංශය ගැන කල්පනා කර ඒඅය උනන්දු කරවන්න ඕනෑ, දැනට රැකියා නොමැති ප්‍රදේශවල රජය පිළිගත් කර්මාන්ත ආරම්භ කරනවා නම් ඒ කර්මාන්තවලට යම් යම් සහන දෙන්න ඕනෑ. එවිට කාටද එහි ප්‍රයෝජනය ලැබෙන්නේ ? මේ ප්‍රයෝජනය ලැබෙන්නේ අපේ ගැමි පළාත්වල, රැකියා විරහිත පළාත්වල මහජනතාවටයි. සාමාන්‍ය පංතියේ මහජනයාටයි ඒ ලාභ ලැබෙන්නේ.

මම අද පුවත්පතක දැක්කා, මේ අයවැය යෝජනාවලින් මේ රටේ බදු ගෙවන 45,000 කට පමණයි සහන සැළසෙන්නේ කියා අපේ විපක්ෂනායකතුමා ප්‍රකාශ කර තිබෙනවා. එතුමා කල්පනා කර නැහැ, මේවායින් ඇතිවන ඵල ප්‍රයෝජන නිසා ගම්බද අහිංසක උදවියට මොන තරම් සහන ලැබෙනවාද, ඒ අයට මොන තරම් රැකියා ලැබෙනවාද කියා. ඒ මඟින් ඒ අයගේ ජීවන තත්ත්වය නගාසිටුවන්න කටයුතු කරන්න අවස්ථාව ලැබෙනවාද කියා. අද මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, අපේ විදේශ විනිමය. එහෙම නම් අපි හැමවිටම කල්පනා කරන්නට ඕනෑ, මේ රටට විදේශ විනිමය උපයන්නේ කොහොමද කියා. ඒ නිසා අපි කල්පනා කරන්නට ඕනෑ ; විදේශ විනිමය උපයන කර්මාන්තවලට උදව් දෙන්න. මේ අයවැය යෝජනා දිහා බැලුවාම ඒ හැම එකක්ම ඉදිරිපත් කර තිබෙන්නේ මේ රටේ පොදු මහජනතාවට ප්‍රයෝජනවත් වන ආකාරයටයි.

පොහොර සඳහා බදු සහන ඇතිකර තිබෙනවා. ඒ සඳහා වන තීරු බද්ද අයින් කර තිබෙනවා. මේ රටේ වැඩි ජනතාවක් අද ජීවත්වන්නේ ගොවිතැනින්. අපි පසුගිය දවස්වල මින්නේරිය ජනපදයේ අතුරු මැතිවරණයට ගියා. ඒ පළාත්වල මහජනයාගෙන් සියයට හැත්තෑපහක් පමණ ජීවත්වෙන්නේ ගොවිතැනින්. එනිසා පොහොර සහනාධාරය දෙන අතර, තීරු බද්දත් ඉවත් කිරීමෙන් ඒ අයට පහසු මිලකට පොහොර ලැබෙනවා. එහෙම නම් ගොවිතැන් සශ්‍රීක වෙනවා. ගොවිතැන්වලින් වැඩි ආදායමක් ලැබෙනවා. අද මේ රටට විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ග තේ, පොල් හා රබර්. නමුත්නාත්සේලා සියලුදෙනාම දන්නවා පසුගිය කාලයේ මේ රටේ තිබුණු වතු ජනසතු කළත් ඒවාට හරියාකාර පොහොර නොයෙදීම නිසා අද ඒවායේ තත්ත්වය පහත වැටී තිබෙන බව. ඒ කෘෂිකාර්මික වගාවන්ට නියම ආකාරයට පොහොර වැටුනොත්, ඒවා දියුණු වුණොත්, ඒවා අපනයනයෙන් විදේශ විනිමය ලැබෙන්නේ මේ රටටයි. "පොහොර මිල අඩු කිරීම, පොහොරවල තීරු බදු ඉවත් කිරීම " කියන තැන්වල පුංචි වචන කීපයක් පමණක් තිබුණත්, ඒවායේ අර්ථය අති විශාලයි. ඒ මාර්ගයෙන් මේ රටට විශාල විදේශ විනිමයක් ලැබෙනවා. එවිට ආර්ථිකය ගොඩනැගෙනවා.

ඒ වාගේම මේ රටේ සාමාන්‍ය මහජනතාව ගැන කල්පනා කර, මහජනතාවගේ ඕනෑ එපාකම් ගැන කල්පනා කර, මේ රටේ රැකියා ප්‍රශ්නය විසඳන්න මේ හැම යෝජනාවක්ම ඉදිරිපත් කර තිබෙනවා. මේ කාරණා ගැන කල්පනා කරන විට අපට කියන්නට පුළුවන් මේ අයවැය ලේඛනය මේ රටේ මහ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කළ, ඒ අයට යම්කිසි සහනයක් සලසා දෙන්නට ඉදිරිපත් කළ අයවැය ලේඛනයක්ය කියා. මේ රටේ සිරිතක් වශයෙන් තිබෙනවා, අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනකොට, මහජනයා අතර කුතුහලයක් ඇති වීම. බඩු මිල වැඩි වෙයිද, අඩු වෙයිද ආදී වශයෙන් මේ රටේ ආන්දෝලනයක් ඇති වෙනවා. නමුත් මේ ඉදිරිපත් කළ අයවැය ලේඛනයේ ඇතුළත් යෝජනා එකින් එක අරගෙන බැලුවාම මහජනයා අතර ඇතිවුණු කුතුහලය නැති වුණා. මහජනයාට ඒ ගැන අවබෝධයක් ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ලොකුගේ මහතා]

මේ රජය ඉදිරිපත් කළ හැම අයවැය ලේඛනයකින්ම මහජනයාට යම්කිසි සහනයක් මිස මහජනයාට යම්කිසි අසාධාරණයක් සිදු වන්නේ නැති බව ජනතාව කල්පනා කරනවා. මේ රජයට විරුද්ධ සමහර උදවිය කල්පනා කරන්නට පුළුවන්, මහජනයා උසිගන්වන්නට ඕනෑය කියලා. අයවැය ලේඛනයකින් ඒ අය බලාපොරොත්තු වෙනවා මහජනයා උසි ගන්වන්නට. රාජ්‍ය අංශයේ සේවය කරන උදවිය උසි ගන්වන්නට පුළුවන්, "තමුන්නාන්සේලාට ලැබුණු පඩි වැඩි වීම මදි. තමුන්නාන්සේලාට මීට වඩා සහනාධාර ලැබෙන්නට ඕනෑ කියලා". නමුත් බුද්ධිමත් මහජනයා පිළිගන්නවා, මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව දෙන්නට පුළුවන් උපරිම සහන ප්‍රමාණය මේ රජයෙන් දෙනවාය කියලා.

1970-1977 යුගය හෝ ඊට එහා යුග ගැන කල්පනා කළොත් රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ සේවය කරන අයගේ අයිතිවාසිකම් ගැන, පඩි වැඩිවීම ගැන ඒ අය කවුරුවත් එද කල්පනා කළේ නැහැ. පඩි වැඩි කිරීමට කවදාවත් කල්පනා කළේ නැහැ. නමුත් මේ රජය බලයට පත් වුණාට පස්සේ තමයි මේ විධියට කටයුතු කර මහජනයාට සෙතක් සැලසුණේ. අපි කියන්නේ නැහැ, අපි සර්ව සම්පූර්ණ වෙලාය කියා. ආර්ථිකය හොඳ තත්ත්වයකට හොඳ නැතුවොත් තමයි, ඒ සියල්ලම සර්ව සම්පූර්ණ කරන්නට පුළුවන්.

මම ගරු මුදල් ඇමතිතුමාට අදහසක් හැටියට ඉදිරිපත් කරන්නට කැමතියි, අපි මේ අයවැය ලේඛනයේදී එක අංශයක් හැර හැම අංශයක් ගැනම කල්පනා කරලා ඇති බව. අපි විදේශ විනිමය උපයන උදවිය හැමෝටම උදව් කර තිබෙනවා. හැමෝටම සහනාධාර දී තිබෙනවා. අපි කල්පනා කර බලන්න ඕනෑ, රජයට විදේශ විනිමය වියදම් කරන්නට වීම වළක්වන උදවියටත් යම්කිසි සහනයක් සලසන්නට ඕනෑය කියලා. අද මේ රටේ ගොවිතැන් කරන උදවිය විශේෂයෙන් වී නිෂ්පාදනය කරන උදවිය, මිරිස් නිෂ්පාදනය කරන උදවිය බොහොම දුක් කම්කටොළු මධ්‍යයේ තමයි ඒ කටයුතු කරන්නේ. නමුත් ඒ අය නිපදවන හැම වී බුසලකින්ම, හැම මිරිස් කරලකින්ම විදේශ විනිමය යම්කිසි ප්‍රමාණයක් මේ රටේ ඉතිරි වෙනවා. එසේ නම් අපි ඒ අය ගැනත් කල්පනා කරන්නට ඕනෑ.

පසුගිය අතුරු මැතිවරණ කාලයේදී මින්නේරිය ජනපදය හිඟුරක්ගොඩ ප්‍රදේශය ආදී ප්‍රදේශවල කටයුතු කරනකොට අපි දක්කා ඒ අය කොයිතරම් අමාරුවෙන්ද ඒ අයගේ කුඹුරු ගොවිතැන් කරන්නේ කියලා ; ඒ අය කොයිතරම් අමාරුවෙන්ද ඒ අයගේ හේන් ගොවිතැන් කරන්නේ කියලා. ඒ අයට පහසුකම් නැහැ ; සමහර පළාත්වල විදුලිය නැහැ ; ඒ අයගේ ගෙවල් දොරවල්වල අද කොළඹ රටේ ජීවත්වන උදවියගේ වගේ ටී. වී. නැහැ ; ගුවන්විදුලි යන්ත්‍ර නැහැ. නමුත් ඒ අය නිපදවන හැම වී බුසලකින්ම, හැම මිරිස් කරලකින්ම, මේ රටේ යම්කිසි විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි වෙනවා.

එසේ නම් අපි ඒ අංශය ගැනත් කල්පනා කරන්නට ඕනෑ. මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ අංශයේ උදවිය ගැන කල්පනා කරලා, යම්කිසි සහන වැඩ පිළිවෙළක් ඇති කරන්නටය කියා. පිටරට ගිහිල්ලා අවුරුද්දක් හෝ ඉඳලා විදේශ විනිමය උපයාගෙන එන කෙනෙකුට වුවත්, තීරු බදු නිදහස් වෙළඳ සැල්වලින් යම්කිසි සීමාවකට බඩු බාහිරාදිය මිලයට ගන්නට පුළුවන්කම අද තිබෙනවා. ඒ අයට යම්කිසි බඩු ප්‍රමාණයක් තීරු බදු නැතිව ගන්නට පුළුවන්. එහෙනම් අපේ රටේ ඈත පළාත්වල සිටින ගොවිතැන් කරන ගොවි මහත්වරුන්ටත් ඒ විධියේ බඩු ලබා ගතහැකි ක්‍රමයක් ගැන කල්පනා කරනවා නම් වැදගත් වෙනවා. ඒ අයටත් ටී. වී. එකක් ගන්න, ඒ අයටත් හොඳ ගුවන්විදුලි යන්ත්‍රයක් ගන්න, ඒ අයගේ ළමයින්ටත් හොඳ ඔරලෝසුවක් ගන්න, ට්‍රැක්ටරයක් ගන්න, ක්‍රමයක් සලසන්න ඕනෑ. ඒ අය නිපදවන වී ප්‍රමාණය අනුව, මිරිස් ප්‍රමාණය අනුව, තීරු බද්දෙන් තොරව ඒ බඩු ලබා ගැනීමේ යම්කිසි ක්‍රමයක් ඇති කළොත් ඒ අය මීටත් වඩා සන්තෝෂ වෙනවා ; ඒ අය මීටත් වඩා හොඳින් රටට සේවයක් කරනවා.

ඔවුන්ගේ සේවාවට අපි කෘතගුණ සැලකිය යුතුයි. අද ඒ අය ඈත පළාත්වල බොහොම දුක් ගැහැට කම්කටොළු මධ්‍යයේ ජීවිත ගත කරනවා. එසේ නම් ඒ අය නිපදවන අස්වැන්න ප්‍රමාණය තක්සේරු කරලා, ඒ අයත් විදේශ විනිමය ඉතිරි කර දෙනවාය කියලා කල්පනා කරලා, ඒ අයටත් අවශ්‍ය බඩු ලබා ගැනීමට යම්කිසි සහන ක්‍රමයක් ඇති කළොත් හොඳ යයි ගරු මුදල් ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

එමෙන්ම මම තවත් එක කරුණක් ගැන කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේ සිගරට්ස්වලට බදු වැඩිකර තිබෙනවා. සිගරට්ස් මිල වැඩි කළ විට සාමාන්‍ය මහජනයාටත් පාඩුවක් සිදු වෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඛනිජ තෙල් සංස්ථාව අධික ලාභයක් ලබන නිසා තමුන්නාන්සේ සියයට 20 ක බද්දක් අය කරනවා. එසේ නම් දුම්කොළ සමාගම ගැනත් ඒ ආකාරයේම කල්පනාවක් ඇති කරන්නැයි මා ඉල්ලා සිටිනවා.

දුම්කොළ රාත්තලකට ගෙවන බද්ද වැඩි කළ විට මහජනයාගේ පාවිච්චිය සඳහා සකස් කරන සිගරට්ටුව ගැන ඒ අය කල්පනා කරන්නේ නැහැ. මොන විධියට හැදුවත් ජීවම බොන්නට ජනතාවට සිදු වෙනවා. සිගරට්එකේ තත්ත්වය ගැන කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා දුම්කොළ සමාගමත් සමඟ තරඟකාරී ව්‍යාපාරයක් මේ රටේ ඇති කරන්නට පුළුවන් වන අන්දමේ බදු ක්‍රමයක් ඇති කරන්න යයි මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. නිපදවන සිගරට් එකකට යම්කිසි බද්දක් අය කළොත් ඒ අය ජනතාවට හොඳ සිගරට් එකක් දේවි. එමෙන්ම දුම්කොළ කිලෝවකට බද්දක් අය කිරීම වෙනුවට සිගරට් එකකට යම්කිසි බද්දක් අය කළොත් තරඟකාරී ව්‍යාපාරයක් ඇති වන්නට පවා ඉඩකඩ තිබෙනවා. වෙනත් කෙනෙක් හොඳ සිගරට්ස් හැදුවොත් ජනතාව ඒවා බොනවා ඇති.

අද දුම්කොළ සමාගම කරන්නේ ඒකාධිකාරී ව්‍යාපාරයක්. ඒ අය පිරිවැටුම් බද්ද ගෙව්වත් හරියට ලාභාංශ පෙන්වන්නේ නැහැ. සමාජසේවා කටයුතු, ක්‍රීඩා කටයුතු, ඒ අයගේ ඉහළ පන්තියේ සේවකයින්ට වරප්‍රසාද දීම් ආදී නොයෙකුත් ක්‍රමවලින් රජය ගෙවන බද්ද ඔවුන් අඩු කර ගන්නවා. සංස්ථාවකට ඒ කටයුත්ත කරන්නට බැහැ. එහෙනම් ඛනිජ තෙල් සංස්ථාවෙන් බදු අය කරන ආකාරයටම දුම්කොළ සමාගමේ ලාභාංශත් රජයට ගන්නට පුළුවන් ක්‍රමයක් ගැන කල්පනා කරන්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඒ සමාගම සම්බන්ධයෙන් පමණක් මම එවැනි ඉල්ලීමක් කරන්නේ එය තනි ඒකාධිකාරයක් පවතින සමාගමක් නිසයි. එවැනි යම් පියවරක් ගත්තොත් ඒ සමාගමත් සමඟ තරඟකාරී තවත් සමාගමක් ඇති වන්නට පුළුවන්. ඒ නිසා තවත් සමාගමකට ඇවිත් තරඟ කරන්නට පුළුවන් වන විධියේ යම්කිසි බදු ක්‍රමයක් දුම්කොළ සමාගම සම්බන්ධයෙනුත් ඇති කරන්න.

සිගරට්ස් මේ රටේ සාමාන්‍ය ජනතාව එදිනෙදා පාවිච්චි කරන දෙයක්. ඒ නිසා සිගරට්ස් මිල වැඩි කිරීම මේ රටේ සාමාන්‍ය ජනතාවට යම්කිසි ප්‍රමාණයකින් බලපානවා. තෙල් මිල වැඩි නොකර ඛනිජ තෙල් සංස්ථාවෙන් රජය බද්දක් ලබා ගන්නා ක්‍රමයටම දුම්කොළ සමාගම සම්බන්ධයෙනුත් ඒ ආදායම රජයට ගන්නා යම්කිසි ක්‍රමයක් ඇති කළොත් මීට වඩා යහපතක් සැලසෙයි කියා මා හිතනවා.

මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ රටේ ආර්ථික ශක්තිය ඉතාම දුර්වල අඩියකට පත් වී තිබුණු යුගයකදී ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් පිහිටවූ මේ රජයේ මුදල් ඇමති ධුරය භාරගෙන පැලැස්තරවලින් පිරී තිබුණු ආර්ථිකයේ එම පැලැස්තර එකින් එක ගලවාදමා අද හොඳ යහපත් තැනකට ගෙනැවිත් තිබෙනවා. යහපත් ගමනක් යන්නට පුළුවන් සැලැස්මක් ඇති කර තිබෙනවා. එහෙමනම් ඒ ගැන අපි සන්තෝෂ වෙන්නට ඕනෑ. අනාගතයේදී මේ රටේ ආර්ථිකය ශක්ති සම්පන්න කර පොදු මහජනතාවට මීට වඩා සුඛිත මුදිත ජීවිතයක් ගත කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරන්නට තමුන්නාන්සේට ශක්තියත් ධෛර්යයත් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.10

එස්. බී. විජේකෝන් මහතා (මින්නේරිය)
(திரு. எஸ். பீ. விஜேகோன் — மின்னேரியா)
(Mr. S. B. Wijekoon Minneriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමනි, ඇමතිවරුනි, මන්ත්‍රීවරුනි, මින්නේරියේ නව මන්ත්‍රීවරයා වශයෙන් මම මේ ගරු සභාවේදී පවත්වනු ලබන ප්‍රථම කථාව මෙයයි. එමෙන්ම මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා, මගේ ඒ ප්‍රථම කථාව අයවැය විවාදයට සම්බන්ධ වීම ගැන.

1932 දී දිවංගත අතිගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමා විසින් ආරම්භ කරන ලද මින්නේරිය ව්‍යාපාරයේ ආරම්භක ගොවියෙකුගේ දරුවෙකු ලෙස ඉපදී මින්නේරියේ හැදී වැඩී මින්නේරියේ ඉගෙන ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිත්තේරියේම රජයේ රැකියාවක් කර මිත්තේරියේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් මේ ගරු සභාවට එන්නට ලැබීම ගැන මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා.

මේ ව්‍යාපාරය ආරම්භ කරන කොටම අතිගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ බලාපොරොත්තුවක් තිබී තියෙනවා, කවද හරි මිත්තේරියේම උපදින දරුවකුට මිත්තේරියේ පාලනය භාර දෙන්නට. ඇත්තවශයෙන්ම එතුමාගේ ඒ බලාපොරොත්තුව, එතුමාගේ ජන්ම ශත සංවත්සර සමරන මේ කාලයේදී ඉටු කිරීමට පුරෝගාමී වූ, කල්පනාකාරී වූ පුද්ගලයකු ගැන මේ අවස්ථාවේදී මා සඳහන් කරන්නට ඕනෑ. එතුමා නම් අපේ අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමායි. ඇත්තවශයෙන්ම මිත්තේරියේ ගොවියකුගේ දරුවකුට මිත්තේරිය ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් පත්වීමේ අවස්ථාව ලබා දුන්නේ අතිගරු ජනාධිපතිතුමායි. ඒ පිළිබඳව මිත්තේරියේ ජනතාව වෙනුවෙන් එතුමාටත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ගරු ඇමතිවරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත් මේ අවස්ථාවේදී මා ස්තූතිවන්ත වෙනවා.

මේ සමගම මෙම ගරු සභාවේ මිත්තේරිය ආසනය නියෝජනය කිරීමට මට අවස්ථාව ලබා දුන් මිත්තේරි ජනතාවටත් මගේ ස්තූතිය පුද කරන්න ඕනෑ. ඒ අතරම මිත්තේරිය ආසනයේ ජයග්‍රහණය සඳහා එක්සත් ජාතික පක්ෂයේ ගරු ඇමතිවරුන්, ගරු නියෝජ්‍ය ඇමතිවරුන් ඇතුළු ගරු මහජන මන්ත්‍රීවරුන් ඉතාම වෙහෙස මහන්සි වී ඒ ප්‍රදේශයේ පැවතුණු තත්ත්වයට ධෛර්ය සම්පන්නව මුහුණ දී මට සහයෝගය දැක්වූ බව මතක් කළ යුතුව තිබෙනවා. අන්න ඒ නිසා එතුමන්ලාටත් මගේ ආදර ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

මිත්තේරිය අතුරු මැතිවරණය ගැන කථා කරන විට මා හිතන හැටියට මෙය ලංකාව පුරාම දෝංකාරය දුන් අතුරු මැතිවරණයක් බව සඳහන් කළ යුතුමයි. මිත්තේරියේ සිද්ධ වෙන්නේ මොනවාද කියා බොහෝ දෙනෙක් බලා ගෙන සිටියා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවලින් මේ රටේ කරන ලද සංවර්ධන ව්‍යාපාර දෙස බලන මහජනතාව, විරුද්ධ පක්ෂයේ නොයෙකුත් විවේචනවලට නොබියව මුහුණ දී එක්සත් ජාතික පක්ෂයට වැඩි ඡන්ද 9176 කින් ජයග්‍රහණයක් ලබා දුන් බව ප්‍රකාශ කරන අතර මිත්තේරිය ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් ඒ ප්‍රදේශයේ ජනතාවට මගේ උපහාරය නැවත වරක් පුද කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිත්තේරිය අතුරු මැතිවරණයේදී විරුද්ධ පක්ෂය, රජයට විරුද්ධව ප්‍රචාර ගෙන ගිය කාරණා කිපයක්ම තිබුණා. එක් චෝදනාවක් තමයි, රජය ඒකාධිපතිවාදී ස්වරූපයකින් පාලනය ගෙන යන යනවාය කීම. තවත් චෝදනාවක් තමයි, රජය කිසිම සංවර්ධන වැඩ පිළිවෙළක් ගෙන යන්නේ නැතැයි කීම. තවත් චෝදනාවක් තමයි, ත්‍රස්තවාදීන් මැඩලීම සඳහා දැඩි ක්‍රියා මාර්ගයක් අනුගමනය නොකරනවා යයි කීම. නමුත් මෙයට පිළිතුරු වශයෙන් එම අතුරු මැතිවරණයේදී අපේ මැති ඇමතිවරුන් ජනතාවට ප්‍රකාශ කර සිටියා, ත්‍රස්තවාදය මැඩලීමට මේ රජය ගෙන යන ක්‍රියා මාර්ගය පිළිගන්නේ නැති නම්, අපට ඡන්දය දෙන්නට එපාය කියා. ඒ වාගේම අපේ රජය ප්‍රජාතන්ත්‍රවාදී නොවෙයි නම් අපට ඡන්දය දෙන්නට එපා යයි කිව්වා. ප්‍රජාතන්ත්‍රවාදී නම් අපට ඡන්දය දෙන්නය කියා කිව්වා. සංවර්ධන ප්‍රතිපත්ති හරියාකාර ගෙන යන්නේ නැතිනම් අපට ඡන්දය දෙන්න එපාය කිව්වා. සංවර්ධන ප්‍රතිපත්ති හරියාකාර ක්‍රියාත්මක කරනවා නම්, අපට ඡන්දය දෙන්නටය කිව්වා.

ඇත්තවශයෙන්ම මේ රටේ ජනතාව ඉතාම බුද්ධිමත් පිරිසක්. එමනිසා මිත්තේරියේ ජනතාව තීරණය කළා, රජය ගෙන යන ප්‍රතිපත්ති නිවැරදියි, රජය ප්‍රජාතන්ත්‍රවාදීයි, ත්‍රස්තවාදය මැඩලීමට ගෙන යන ක්‍රියා මාර්ගය නිවැරදියි කියා. එමනිසා තමයි, මිත්තේරිය අතුරු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්නට හැකි වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ආසනය දිහා බලන විට එම ප්‍රදේශයේ කිසියම් සංවර්ධන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළා නම්, ඒ හැම ව්‍යාපාරයක්ම ක්‍රියාත්මක කළේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් බලයේ සිටි අවස්ථාවල බව මතක් කරන අතරම දැනට එම ප්‍රදේශවල දකින්නට ලැබෙන සංවර්ධන ව්‍යාපාර එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව විසින් ආරම්භ කළ ඒවා බවත් පෙන්වා දෙන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මිත්තේරිය ආසනයේ අක්කර තිස් දහසක පමණ කුඹුරු ප්‍රමාණයක් වගා කරනවා. මේවා ක්‍රියාත්මක වන්නේ, ඇලහැර ව්‍යාපාරය, මිත්තේරිය වැව යටතේ ඇති මිත්තේරිය ව්‍යාපාරය, ගිරිතලේ ව්‍යාපාරය යනාදී විශාල පරිමානයේ වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේයි. මේ යෝජනා ක්‍රම ඇති කර තිබෙන්නේ, දිවංගත නායකයන් වූ අතිගරු ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යතුමා, ගරු ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා, ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා ආදීන් සහ වර්තමාන ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ආදී නායකයන්ගේ ප්‍රධානත්වයෙන්ය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ඒ කාලයේදී එතුමන්ලා එකතු වී මිත්තේරිය සංවර්ධනය කිරීමට සෑහෙන මහන්සියක් අරගෙන තිබෙනවා. මිත්තේරියේ ගම් ඇති වුණේ, නිෂ්පාදනය වැඩි වුණේ, පාරවල් දියුණු වුණේ, පාඨශාලා ඇති වුණේ, වෙනත් දියුණු තත්ත්වයන් ඇති වුණේ, අපේ එක්සත් ජාතික පක්ෂය නිසා බව, අපේ නායකයන් නිසා බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය තුළින් පමණයි, අපට මෙවැනි පැහැදිලි සංවර්ධනයක් දකගන්න ලැබුණේ. ඒ වාගේම අපේ ශ්‍රමයේ ඉතිහාසය ගැන බලන විට අද වර්තමානයේ—1977 න් පස්සෙ යුගයේ—මිත්තේරිය ප්‍රදේශයේ විශාල සංවර්ධනයක් ඇති වී තිබෙනවා, අපේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය තුළින්.

මේ අවස්ථාවේදී හුඟාක් දුරට විරුද්ධ පාර්ශවයේ විවේචනයට ලක් වුණු කාරණයක් තමයි, මහවැලි ව්‍යාපාරය. නමුත් අද වියළි කලාපය මෙවැනි දියුණු තත්ත්වයකට පත් වී තිබෙන්නේ මහවැලි ව්‍යාපාරය නිසාය කියා මම ප්‍රකාශ කරන්න කැමතියි. අද මිත්තේරිය, කවුඩුල්ල සහ පොළොන්නරුව වැනි ප්‍රදේශවල වර්ෂාව මද වුණත් ඉතාමත් සාර්ථකව කුඹුරු ගොවිතැන් කරගෙන යනවා. මෙයට හේතු වී තිබෙන්නේ මහවැලි ව්‍යාපාරයයි. මහවැලි ව්‍යාපාරය තුළින් ඒ ප්‍රදේශයේ වැව්වලට ජලය ලබා දී තිබෙනවා. ඒ නිසා කිසිම ප්‍රශ්නයක් නැතිව ගොවි ජනතාව අද තමන්ගේ කුඹුරුවල මාස් කන්නයේ වැඩ ආරම්භ කර තිබෙනවා.

ඒ සමගම මම මතක් කරන්න ඕනෑ, මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් මිත්තේරිය ආසනයේ බී කලාපයේ වැඩ කරගෙන යන බව. පසුගිය අයවැය ලේඛනවලින් මහවැලි ව්‍යාපාරයට ලබා දුන් රුපියල් කෝටි ගණන් මුදල් වියදම් කර තමයි ඒවා කර තිබෙන්නෙ. මේ අනුව 1977 සිටම සංවර්ධන ව්‍යාපාර වශයෙන් වැඩි හරියක් කෘෂිකර්ම ව්‍යාපාරවලට මුදල් වියදම් කර කෘෂිකර්ම ව්‍යාපාරය මේ තත්ත්වයට ගෙනැවිත් තිබීම ගැන මිත්තේරියේ ජනතාව ඉතාමත් සතුටට පත් වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ නිසාම තමයි අද ගොවි ජනතාවට කිසිම ප්‍රශ්නයක් නැතිව ඒ ප්‍රදේශයේ කුඹුරු වැඩ කරන්නට පුළුවන් වී තිබෙන්නෙ.

කෘෂිකර්මයේ දියුණුව පිළිබඳව උදාහරණයක් ගත්තොත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අස්වැන්න පෙන්වා දෙන්න පුළුවන්. එදා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අස්වැන්න ලැබුණේ අක්කරයකට බුසල් 50 ත් 60 ත් අතර ප්‍රමාණයක්. නමුත් 1977 න් පසුව ඇති කළ නොයෙක් දියුණු ක්‍රම නිසා 1982/83 මාස් කන්නයේ අස්වැන්න අක්කරයකට බුසල් 103 ක් දක්වා වැඩි කර ගැනීමට ගොවි ජනතාවට පුළුවන් වී තිබෙනවා. මෙය නිකම්ම ඇති වුණු එකක් නොවෙයි. රජයේ සංවර්ධන ව්‍යාපාර යටතේ ගරු මුදල් ඇමතිතුමා කෘෂිකර්ම සංවර්ධනයට වෙන් කළ මුදල්වලින් ක්‍රමානුකූල සැලැස්මක් අනුව කරගෙන ආ වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් බව මට කියන්න පුළුවනි. කෘෂිකර්ම දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය කාලයේ උසස් වර්ගයේ බිත්තර වී නිෂ්පාදනය කරගන්නට පුළුවන් වී තිබෙනවා. පොහොර වර්ග අවශ්‍ය වෙලාවට ලබා දී තිබෙනවා. කෘෂිකර්ම ව්‍යාප්ති සේවයට විශාල මුදලක් වියදම් කර කෘෂිකර්ම ව්‍යාප්ති සේවය ගම්බද ජනතාවට ලබා දී තිබෙනවා.

ඒ වාගේම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමට කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය නමින් අලුත් ආයතනයක් ඇති කර තිබෙනවා. ඒ අධිකාරිය තුළින් ඒ ප්‍රදේශයේ තිබෙන කෘෂිකර්මයට සම්බන්ධ හැම ආයතනයක්ම සම්බන්ධීකරණය කර කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු කර ගැනීමට ගොවි ජනතාවට සෑහෙන පහසුකම් ලබා දී තිබෙනවා. මෙන්න මේ වැඩ සඳහා මේ රජය කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් රුපියල් කෝටි ගණනක් වියදම් කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. විජේකෝන් මහතා]

ගරු මුදල් ඇමතිතුමා මේ රටේ ආර්ථිකය දියුණු කිරීමට අවශ්‍ය මුදල් ලබා දී තිබෙනවා. කෝටි ගණනක් වියදම් කර කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ඇති කළේ කෘෂිකර්මය නගා සිටුවීමටයි. ඒවායේ ප්‍රතිඵල අද ගොවි ජනතාව ලබාගෙන තිබෙනවා. කලකට පෙර අක්කරයකට වී බුසල් 50ක් 60ක් ලබා ගත් ගොවි ජනතාව 1977 සිට ක්‍රමයෙන් වැඩි කරගෙන 1984 වන විට අක්කරයකට වී බුසල් 103 දක්වා වැඩි කර ගත්තේ ගරු මුදල් ඇමතිතුමා මෙන්න මේ ආකාරයට සංවර්ධනයට මුදල් ලබා දීමේ ප්‍රතිඵලයක් වශයෙනුයි. ඒ නිසා 1977 සිට මේ දක්වා ක්‍රමානුකූලව සැලැස්මක් අනුව ගොවි ජනතාවගේ අභිවෘද්ධිය තකා කෘෂිකර්ම ක්ෂේත්‍රයට විශාල මුදලක් ලබා දීම ගැන ගොවියෙකුගේ දරුවෙක් වශයෙන් මමත් ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්ත වශයෙන්ම 1985 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනය දෙස බලන විට මට ඉතාමත්ම සතුටට පත් විය හැකි කාරණයක් තිබෙනවා. පොදුවේ කෘෂිකර්මික සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍යාංශයටත්, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයටත්, කෘෂිකර්ම ක්ෂේත්‍රය හා සම්බන්ධ අනිකුත් අමාත්‍යාංශවලටත් විශාල මුදලක් ගරු මුදල් ඇමතිතුමා විසින් ලබා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම කෘෂිකර්මය මුල් කරගත් ආර්ථිකයක් තිබෙන ශ්‍රී ලංකාව වැනි රටක කෘෂිකර්මය හා සම්බන්ධ අමාත්‍යාංශවලට එවැනි විශාල මුදලක් ලබා දීම සතුටට කාරණයක්.

ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනයෙන් පොහොර සම්බන්ධයෙන් වූ තීරු බදු ඉවත් කර තිබෙන බවත් ඒ එක්කම මම කියන්නට ඕනෑ. එය ඉතාමත්ම සතුටට කාරණයක්. ඒ සම්බන්ධයෙන් ගොවි ජනතාව ගරු මුදල් ඇමතිතුමාට ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා ඒකාන්තයි. ඒ එක්කම පොහොර සඳහා තිබෙන සහනාධාරයත් ඉවත් නොකර පොහොර අඩු මිලට—[බාධා කිරීමක්].

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

මේ කාරණය සම්බන්ධයෙන් මම කරුණු පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. පොහොර සඳහා දැන් සියයට හැත්තෑ පහක සහනාධාරයක් දෙනවා. ඒකේ කිසිම වෙනසක් වෙන්නේ නැහැ. අයවැය ලේඛනවලින් වෙනස් වෙන දේවල් ගැන මිසක් වෙනස් නොවන දෙවල් ගැන කියන්න බැහැ. වෙනස් නොවන දේවල් ගැන සඳහන් කරන්නට ගියොත් මගේ අයවැය කථාව පැය හතරකින් නොවෙයි, දවස් හතළිහකින්වත් ඉවර කරන්නට බැරි වෙයි. ඒ නිසා වෙනස් නොවන දේවල් ගැන අපි කථා කරන්නේ නැහැ.

එස්. බී. විජේකෝන් මහතා
(திரு. எஸ். பி. விஜேகோன்)
(Mr. S. B. Wijekoon)

ගරු මුදල් ඇමතිතුමනි, ඒක මගේ අදහසක් පමණයි. කෙසේ වුණත් ගොවි ජනතාව වෙනුවෙන් පොහොර මිල අඩු වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

හැබැයි, එතැනදීත් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මගේ අමාත්‍යාංශය නොවෙයි ; සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයයි. එම අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය වික්‍රම වීරසූරිය මැතිතුමා ප්‍රකාශයක් කර තිබෙනවා, අද පත්තරයක මම දැක්කා. එය හරිද වැරදිද කියන්න මම දන්නේ. නැහැ. ජාත්‍යන්තර වෙළඳ පොළේ පොහොර මිල වැඩි වී තිබෙන බවක් එතුමා කියා තිබෙනවා. එහෙම වැඩි වුණොත් ඒක මට අඩු කරන්නට බැහැ. මට අඩු කරන්නට ක්‍රමයක් නැහැ. හැබැයි, දැනට දී තිබෙන සහනාධාරය මම කිසිසේත් වෙනස් කරලා නැහැ. එය එහෙමම තිබෙනවා.

එස්. බී. විජේකෝන් මහතා
(திரு. எஸ். பி. விஜேகோன்)
(Mr. S. B. Wijekoon)

බොහොම ස්තුතියි ! ගරු මුදල් ඇමතිතුමනි, ඒ සමගම ඔබතුමාගේ අයවැය ලේඛනයෙන් අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. එය ඉතාමත් වැදගත්. කෘෂිකර්මය දියුණු කිරීමට විශාල මුදලක් වැය කරනවා වගේම මේ රටේ දරු දැරියන්ගේ අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වැය කිරීම පිළිගත යුතු දෙයක්. ඒ වාගේම මහජනයා ඉතාමත් කැමති වන දෙයක්. ආර්ථිකය දියුණු වන විට අපේ රටේ ජනතාවගේ බුද්ධියත් දියුණු වන්නට ඕනෑ. ඒ නිසා මෙවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන අපි ඉතාමත් සන්තෝෂ වෙනවා. ඒ මන්ද කියනවා නම්, බුද්ධිමත් ජනතාවක් මේ රටේ ඇති වෙන්නට ඕනෑ. ඒ නිසා අධ්‍යාපනය දියුණු වෙන්නට ඕනෑ. 1977 සිට 1984 දක්වා මේ රටේ ජනතාව නොකඩවාම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති පිළිගෙන තිබෙන්නේ ජනතාවගේ බුද්ධිය වැඩිවීම නිසයි. අද රට ගමන් කරන්නට ඕනෑ කොයි මාර්ගයේද කියන එක මේ රටේ ජනතාව කල්පනා කරනවා. ඒ කල්පනා කිරීමේ ශක්තිය අද ජනතාවට ඇති වී තිබෙනවා. අධ්‍යාපනයේ දියුණුව නිසා මේ ශක්තිය ජනතාවට ඇති වී තිබෙන බව මම මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

අවසාන වශයෙන් මම ගරු මුදල් ඇමතිතුමාට අදහසක් ඉදිරිපත් කරන්නට කැමතියි. පොළොන්නරුව කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක්. අද ඒ දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්තය හුඟක් දුරට සාර්ථකව කරගෙන යනවා. ගොවි ජනතාව ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරනවා. අද ගොවි ජනතාවට තිබෙන එකම අපහසුව කෘෂිකාර්මික උපකරණ හා කෘෂි රසායන ද්‍රව්‍ය මිල අධික වීමයි කියන එක මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානයට යොමු කරවන්නට කැමතියි. තමුන් ඉදිරියේදී මේ සඳහා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට මම කැමතියි.

ඒ එක්කම කෘෂිකාර්මික සංවර්ධනයෙන් ප්‍රදේශයේ ගොවි ජනතාවටත් රටටත් විශාල යහපතක් සිදු වන බව විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි. මේ සම්බන්ධයෙන් තවත් කළ යුතු දේ බොහෝ ඇතත් ඒ සියල්ලම එක වරම කරන්න පුළුවන්කමක් නැහැ. අනාගතයේදී ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ අනාගතය නගාසිටුවීමට ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන අතරට දැන් එතුමා 1985 සඳහා ඉදිරිපත් කළ අයවැය ලේඛනයක් එක් වී තිබෙනවා. ඒ ගැන පොදුවේ මිත්තේරියේ ජනතාවගේත් පෞද්ගලිකව මගේත් ස්තුතිය එතුමාට පුද කරමින් මගේ පළමුවැනි කතාව මෙයින් සමාප්ත කරනවා. ස්තුතියි.

අ.භා. 2.27

වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)
(Mr. Weerawanni Samaraweera Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂ රජයේ අටවැනි අයවැය ලේඛණය පිළිබඳ විවාදයේදී කතා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මෙය මේ අටවැනි අයවැය ලේඛනය පිළිබඳව නොයෙක් අන්දමේ මති - මතාන්තර අදහස් - උදහස් රටේ සියලුම ජන කොටස් අතර මතු වන වේලාවක් බව තමුන්නාන්සේ දන්නවා. මේ රටේ දේශපාලන ඉතිහාසයේ අට වතාවක් එක දිගටම, අඛණ්ඩව අයවැය වාර්තා ඉදිරිපත් කිරීමට ගරු මුදල් ඇමතිතුමාට හැකියාවක් ඇති වීම ගැන අපි එතුමාට ප්‍රශංසා කරන්නට ඕනෑ. මෙයින් අප සියලුදෙනාටම එක කරුණක් පැහැදිලි වෙනවා. එනම්, 1977 දී මේ රටේ ආරම්භ වුණු සංවර්ධනය පිළිබඳව මේ රටේ ජනතාව තුළ කිසියම් විශ්වාසයක් ඇති වී තිබෙන බවයි.

රටේ දේශපාලන ඉතිහාසය දෙස ජනතාව බලා ඉන්නේ ඉතාම බුද්ධිමත්වයි. රට කරවන පාලක පක්ෂය ජනතාවගේ සිතුම් - පැතුම් පිළිබඳ අවබෝධයක් ඇතිව රට ආණ්ඩු කරනවාද නැත්නම් ඔවුන් ඒ අවබෝධයෙන් ඈත් වී — ජනතා සිතුම් පැතුම් වලින් ඈත් වී - රට කරනවාද යන්න පිළිබඳ හැඟීමක් රට ඉදිරියේත් පාලකයන් ඉදිරියේත් ප්‍රකාශ කිරීමට මේ රටේ ඡන්ද දායක-දායිකාවන්ට 1977 න් පසු අවස්ථා රාශියක් ලැබුණා. මේ රජය ජනතාවගේ සිතුම් පැතුම්වලින් ඈත් වී සිටිනවායයි විරුද්ධ පක්ෂය කොයි තරම් කෑ ගැසුවත් ඒ කතාවේ කොයි තරම් දුරට සත්‍යතාවක් තිබෙනවාදැයි බැලීම සඳහා ඒ කතාව ජනතාව ඉදිරියට ගෙන ගිය අවස්ථාවන් මේ රටේ කොතෙකුත් තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතුරු මැතිවරණ ඉල්ලා කෑ ගසන අවස්ථාවලදී, මහා මැතිවරණ ඉල්ලා කෑගසන අවස්ථාවලදී එක අවුරුද්දේ දෙවතාවක් ඒ සඳහා අවස්ථා ලබා දුන්නා. මැතිවරණ පැවැත්තුවේ නැත ; ජනතාවගේ අධිතිය රවටා ගත්තායයි කී නිසා ආසන දාහතරක අතුරු මැතිවරණ ඇති කර ඒ සඳහා අවස්ථාවක් ජනතාවට ලබා දුන්නා ; විපක්ෂය කියන ඒ කතාවේ සත්‍යතාවක් තිබේද නැද්දැයි පෙන්වීම සඳහා ජනතාවට ඒ අවස්ථාව ලබා දුන්නා. විපක්ෂය නිරුත්තර වුණා.

මේ රටේ දේශපාලන ඉතිහාසයේ මේ වකවානුවේ මේ රජය තරම් අපේ ජනනායකයා තරම් ප්‍රශ්නවලට ගැටළුවලට මුහුණ දුන්—ජාත්‍යන්තර වශයෙන්, රටේ අභ්‍යන්තර වශයෙන්, දේශපාලනික වශයෙන්, ජාතිවාදී අරගල වශයෙන්, ආර්ථික වශයෙන්, ගැටළුවලට භාජන වුණු – රජයක් හා නායකයෙක් මෑත ඉතිහාසයේ පහළ වුණායයි මම හිතන්නේ නැහැ. ඒ හැම අවස්ථාවකදීම එඩිතරව ඒ ප්‍රශ්නවලට මුහුණ දුන් ආකාරය කොතෙක් දුරට ජනතාවගේ සිතුම් පැතුම් හා එක සමානව ගලාගෙන යනවාදැයි බලන්නට අපි ජනතාව ඉදිරියට ගියා. විරුද්ධ පක්ෂයෙන් පාර්ලිමේන්තුව තුළ ඉන්න අය මේ සභාව තුළත්, මෙහි එන්නට බැරි වූ අය පිටත ඉඳගෙනත් නොයෙක් වහසි බස් දෙඩුවා. ඒ අය කියන කිසිම දෙයක් නොපිළිගැනීම අසාධාරණයයි කියමින් ඔවුන් මේ රජය කෙරෙහි විවේචන එල්ල කළා. වචන හුවමාරුවට මේ පක්ෂ බොහෝම දක්ෂ බවට සැකයක් නැහැ. ලූනු රහ ඇතිව ඕනෑම කුනුහරුපයක් ඒ අයට ලියන්න පුළුවන්. හිරිකිතයක් නැතිව වචන භාවිතා කිරීමේ හැකියාවක් වාමාංශික පක්ෂවලට තිබෙනවා. 1930 ගණන්වල සිට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය ආරම්භ වූ කාලයේ සිට, වාමාංශික දේශපාලන පක්ෂ ප්‍රසිද්ධියේම වේදිකාවල වචන හුවමාරුවක් කළා. ඒ වචන හුවමාරුවෙන් ජනතාව රවටන්නට පුළුවන් වෙයි කියා ඒ අය හිතුවා. නමුත් දැන් අපට පෙනෙනවා, මිනිසුන් සත්‍ය අවබෝධ කරගෙන තිබෙන බව. ඒ නිසා අවුරුදු 8 ක දීර්ඝ කාලයක මේ රටේ ඉතිහාසය දෙස බැලූ විට, රජයේ ස්ථිරභාවය නිසා මිනිසුන් රජය කෙරෙහි විශ්වාසයක් තබා තිබෙන නිසා ගරු මුදල් ඇමතිතුමාට අවස්ථාවක් ලැබුණා කිසියම් සැලැස්මක් අනුව රටේ අනාගතය සකස් කිරීමට. මේ විධියේ අවස්ථාවක් වෙනත් ආණ්ඩුවල කිසිම මුදල් ඇමතිවරයෙකුට ලැබුනේ නැහැ.

අද වාමාංශික දේශපාලන පක්ෂ වහසි බස් දෙඩවනවා. ජනතාවට බර පැටවුවාය කියා ඒ අය දෙස් කියනවා. සමසමාජ පක්ෂයේ දැන් ඉන්න නායකතුමාත් එහෙම කියනවා. ඒ අයත් රට පාලනය කළා. ඒ අයටත් ජනවරම ලැබුණා. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ දහඩිය කඳුළු ගැන අවබෝධයක් තිබුණාය කියා අවුරුදු 30 ක් 40 ක් තිස්සේ කෑ ගැසූ ඒ උදවිය ආණ්ඩු බලයට පත් වූ පසුව මිනිසුන් අනන්ත පීඩාවට පත් වුණා. ඒ අයට බැරි වුණා සහනයක් හරිගස්වා දෙන්නට. අද රැකියාවල් ලැබීම පිළිබඳ වහසි බස් දෙඩවන, දෙස් කියන වාමාංශික පක්ෂ, මේ රටේ තරුණ පරම්පරාවේ රැකියා ප්‍රශ්නය විසඳා ගැනීමට එදා කිසිම සැලැස්මක් සකස් කළේ නැහැ. මුදල් ඇමතිතුමා සාඩම්බරයෙන් මතක් කළා රැකියාව නැති ජනගහනයෙන් සියයට පනහක පමණ ප්‍රමාණයක රැකියා ප්‍රශ්නය විසඳීමට මේ රජයේ ආර්ථික ප්‍රතිපත්ති උඩ අපට පුළුවන් වුණාය කියා. මේ අය දැන් රැකියා බැංකුව ගැන නොයෙකුත් චෝදනා අපවාද අපට එල්ල කරනවා. නමුත් අවුරුදු 30 ක් 40 ක් තිස්සේ ලෝකයේ වාමාංශික රටවල් පිළිබඳව නායකයින් පිළිබඳව, ආර්ථික දර්ශන පිළිබඳව නොයෙකුත් අන්දමේ හැකියාවන් ලැබුණාය කියා කෑ ගැසූ උදවියට අවුරුදු 7 ක් රට පාලනය කරලත් සමාන තත්ත්වයක් අනුව රැකියාවල් ලබා දීමේ ක්‍රමයක් ඇති කිරීමට කිසිම හැකියාවක් තිබුනේ නැහැ. ඒ උදවිය "ධනවාදී" කියන අපට - එක්සත් ජාතික පක්ෂයට - පුළුවන්කමක් තිබුණා ලක්ෂ සංඛ්‍යාත දරු දැරියන්ට මොන අන්දමේ හෝ ජීවන මාර්ගයක් ලබා දීමේ තත්ත්වයක් ඇති කරන්න.

1971 ත්‍රස්තවාදී ව්‍යාපාරය ආරම්භ වුණේ තරුණයින්ගේ හදවත්වලට, ඔවුන්ගේ සිතුම් - පැතුම්වලට, ඔවුන්ගේ හැකියාවන්වලට, ඔවුන්ගේ අවශ්‍යතාවයන්වලට ඇහුම්කන් දෙන පාලක පක්ෂයක් සිටියේ නැහැ කියන වේදනාව වෛරයක් බවට හැරවුණු නිසයි. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වූ සෑම තරුණයෙක්ම, සෑම තරුණියක්ම, එක්සත් ජාතික පක්ෂය බලයෙන් පරාජයට පත් කරන්නට, පක්ෂය විනාශයට පත් කරන්නට දිවා රෑ වෙහෙස වී වැඩ කර ලොකු බලාපොරොත්තුවක් ඇතිව වාමාංශික නායකයින්ව ඒ තනතුරුවල වාඩි කෙරෙව්වා. එහෙම කරල ඒ අය අවුරුද්දක් දෙකක් බලාගෙන සිටියා. නමුත් ඒ පාලකයින් පරන පුරුදු විධියටම ඒ තරුණයින්ව පාප්ප බාල්දියටයි කඩදාසියටයි පමණක් සීමාකර ඔවුන්ගේ ශ්‍රමය සූරාගෙන කෑවා. මුට්ටි කාසිවලින් නායකත්වය තහවුරු කර ගත් වාමාංශික නායකයින් කම්කරුවන් රැවැට්ටුවා වාගේම මේ රටේ තරුණ - තරුණයින්ව රවටවන්න මහන්සි ගත්තා. මේ අය 1971 දී අවි ආයුධත් රැගෙන මල කඳන් උඩින් මේ රට විනාශයට පත් කරන්න මහන්සි ගත්තේ වාමාංශිකයින්ගේ දුර්දන්ත ප්‍රතිපත්ති නිසා බව තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඔවුන්ගේ සටන් පාඨත් වාමාංශික සටන් පාඨ. ඒ නිසා තරුණයින් තුළ වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව සම්පූර්ණයෙන්ම බෝ වෙලා ගියා.

අද මේ උදවිය කෑ ගහනවා ඇයි ජනතා විමුක්ති පෙරමුණට නිදහස ලබා දෙන්නේ නැත්තේ කියා. මම කණගාටු වෙනවා, මහජන එක්සත් පෙරමුණේ නායක ගරු මහරගම මන්ත්‍රීතුමා දිනේෂ් ගුණවර්ධන මහතා පිළිබඳව. ජනතා විමුක්ති පෙරමුණ දේශද්‍රෝහි ත්‍රස්තවාදීන්ට එක්කාසු වී මේ ජාතිය විනාශ කරන්න උත්සාහ කරනවාය කියා යම් යම් වාර්තාවල තිබෙනවා, ප්‍රවෘත්තිපත්‍රවල තිබෙනවා. උතුරේ කොටින්ට එක්කාසුවෙලා තිබෙනවාය කියා තිබෙනවා. ඒ විධියේ දේශද්‍රෝහීන්ට නැවත වතාවක් මේ රටේ ඉදිරියට එන්නට අවස්ථාවක් දෙන්නද වාමාංශික පෙරමුණ එහෙම නැත්නම් මහජන එක්සත් පෙරමුණ හා අනිකුත් දේශපාලන පක්ෂ අපට කියන්නේ කියා අපි අභියෝගයක් වශයෙන් අහන්න කැමතියි. ඒ ප්‍රශ්නය අතුරු මැතිවරණවලදී අපි ඉදිරිපත් කළා.

මේ රටේ ත්‍රස්තවාදී ව්‍යාපාරය විසඳන්න දවස් 2 කින් 3 කින් පුළුවන්ය කියා බණ්ඩාරනායක මැතිණිය කියා ගෙන යනවා. පුදුමයි. මේ තරම් බොළඳද මිනිස්සු ? අද මුළු ලෝකයේම ත්‍රස්තවාදය තිබෙනවා. සෑම ලෝක නායකයකුටම ජීවිතය පිළිබඳව කිසිම තක්සේරුවක් නැහැ. උදේ තේ බී වැඩට ගොස් සවස් ජාමයේ තමන්ගේ රාජකාරිවලින් මිදෙන්නට පුළුවන්ද කියා සැකයි. තමන්ගේ ඇඳ යට තමන්ගේ වැසිකිළිය තුළ තමන්ගේ පුටුව යට තමන්ගේ මේසය යට කොයි මොහොතේ තමන්ගේ ජීවිතය බිළි ගන්නා බෝම්බයක් තබා ඇත්දැයි තර්ජනයක් පවතින කාලයක් මේ. කවුද මේ රටට බෝම්බ ගේන්න ලෑස්ති කළේ ? ලෝකයට ත්‍රස්තවාදීන් ඉදිරිපත් කළේ කවුද ? වාමාංශිකයනුයි. වාමාංශිකයන්ට ජීවිතවල හරයක් නැහැ. වාමාංශිකයන්ට ජීවිතවල කිසිම වටිනාකමක් නැහැ. ඔවුන් බෝ කළේ මොකක්ද ? ඔවුන් ක්‍රියා කරන්නේ මල කඳන් උඩින් රටේ විනාශය ඇති කරන්නට. මල කඳන් උඩින් රටේ බලය ලබා ගන්නට. බලය සඳහා පටන් ගන්නේ කුමන ක්‍රියාදාමයක් ද එය මාක්ස්වාදීන්ට සාධාරණයි.

උතුරේ තරුණයින් අද කථා කරන්නට මහන්සි ගන්නේ දෙමළ භාෂාව ගැන නොවෙයි. ඔවුන් කථා කරන්නේ වාමාංශික ආණ්ඩුවක් සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවන්නට. විරුද්ධ පාර්ශවයේ මන්ත්‍රීතුමන්ලා නිදහස ලබා දෙන්නට කියා කෑගැසූ වාසුදේව නානායක්කාරත් අද ඒ ගොඩේ ඉන්නවා. අද තිබෙන්නේ ජාතිවාදී අරගලයක් නොවෙයි. මිනිස් ජීවිත පිළිබඳව කිසිම හැඟීමක් නැති අන්ත විනාශකාරී මිනීමරු මාක්ස්වාදය අපේ රට සහ ජාතිය පමණක් නොවෙයි මුළු ලෝකයම ගිල ගන්නට උත්සාහ කරන අවස්ථාවකයි අද ප්‍රජාතන්ත්‍රවාදය ජීවත් වෙන්නෙ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda Baddegama)

ජේ. වී. පී. කාරයන් එළියට දැම්මේ තමුන්නාන්සේලා නේද ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

දරුවන්ට කිරි පෙවූ අම්මා මමයි. දරුවන් වදපු ගෑනි මමයි කියපු තමුන්නාන්සේලාගේ නායිකාව නේද අහිංසක තරුණ තරුණියන් දහදහක් පහළොස්දහක් වෙඩි තබා මරා දැමුවේ ? තමාගේ දූවරුන් පුතුන් පිටරට යවා මේ රටේ දරුවන්ට මැෂින් තුවක්කුවලින් වෙඩි තබා මරා දැම්මේ කවුද ? අපි නොවෙයි. ඒ තරුණ තරුණියන්ට වෛරය ඉගැන්වූයේ කවුද ? වාමාංශිකයන්ගේ ඔඩොක්කුවේ වාඩි වුණේ කවුද ? වාමාංශිකයන්ට මෙරටේ දේශපාලන ඉතිහාසයේ එළියට එන්නට අවස්ථාව සලසා දුන්නේ කවුද ? බණ්ඩාරනායක ආණ්ඩුවේ බණ්ඩාරනායක ප්‍රතිපත්තියයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්බුදයක් තිබෙන අවස්ථාවක අමාරුවක් හිංසාවක් පීඩාවක් නැති අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට අපේ මුදල් ඇමතිතුමාට පුළුවන්වීම පිළිබඳව අපි සතුටු වෙනවා. අපේ ආසන දෙස බලන්න. කිසිම දවසක විදුලි බලය ලබා ගන්නට නොහැකි වේය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විරවන්ති සමරවීර මහතා]

හිතු ගම්වලට අද විදුලි බලය ලැබී තිබෙනවා. කිසිම දවසක පාසැල් පොත්පත් ලබා ගන්නට බැරි වූ දරුවන්ට අද පාසැල් පොත් ලැබෙනවා. කිසිම දවසක පාසැල් ගොඩනැගිල්ලක් හද ගන්නට බැරි වේය හිතු ස්ථානවල අද පාසැල් ගොඩනැගිලි තිබෙනවා. ග්‍රාමීය ඒකාබද්ධ යෝජනා ක්‍රම මගින් ජාත්‍යන්තර වශයෙන් ලබා ගන්නා වූ කෝටි සංඛ්‍යාත මුදල්වලින් අද ගම්වලට පාරවල් කැපෙනවා. හිසට වහලක් නැතිව ඉන්නට තැනක් නැතිව පැල්පතක් හද ගන්නට බැරිව දුකෙන් වේදනාවෙන් හිටපු උදවිය අනුන්ගේ පැල්පත්වල කුලියට හිටපු උදවිය දස දහස් ගණනින් අද තමන්ගේය කියන නිවහනක් තුළ දරු පැටවුන් සමග ජීවත් වෙනවා.

අවුරුදු හතක් තිස්සේ වාමාංශික නායකයෙක් සමාජවාදයේ ප්‍රධානියෙක් නිවාස ඇමති වශයෙන් හිටපු කාලයේ මේ රටේ එක පවුලකට එක පැල්පතක් හද දෙන්නට බැරි වුණා නේද ? ගෙයක් හද ගන්නට රු. 50 ක ආධාරයක් දෙන්නට බැරි වූ උළු කැට ටිකක් ගන්නට ගඩොල් ටිකක් කපා ගන්නට ආධාරයක් දෙන්නට බැරි වූ මේ උදවියද කථා කරන්නේ ? උපාධියක් හෝ දේශපාලන දර්ශනවාදයක් පිළිබදව ඒ තරම් පරතෙරට නොගියත් ජනතාවගේ හදවත පිළිබදව ඔවුන්ගේ දුක් වේදනා පිළිබදව දන්නා ජනතා අගමැති කෙනෙකු අපට සිටින නිසා අද ලක්ෂ සංඛ්‍යාත අහිංසක පවුල්වලට අව්වෙන් වැස්සෙන් පීඩාවක් නැතිව තමන්ගේ කියන නිවහනක තමන්ගේ දූ දරුවන් එක්ක ජීවත් වෙන්නට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ අපේ සංවර්ධනය.

ගමකට ගිහින් බලන්න. සෑම ගෙදරකින්ම එක්කෙනෙකුවත් අද රක්ෂාවක යෙදී ඉන්නවා. 1977 අපි මැතිවරණය ආරම්භ කළ කාලයේ රැකීරක්ෂා නැති තරුණ පිරිස් පොකුරු පිටින් හිටියා. අසාධාරණයට ලක් වූ පිරිස් හිටියා. අද එහෙම තත්ත්වයක් නැහැ.

පිටරට රක්ෂාව යෙදී සිටින අයගෙන් විදේශීය ධනය කෝටි සංඛ්‍යාත මුදලක් අද මේ රටට ගලා ගෙන එනවාය කියා ගරු මුදල් ඇමතිතුමා සතුටින් ප්‍රකාශ කළා. ඒක අයවැය සකස් කර ගන්නට ලොකු උපකාරයක් වුණාය කියලත් එතුමා කිව්වා. වාමාංශිකයන් ආණ්ඩු කළ කාලයේ කාටද පිටරටවලට යන්නට දුන්නේ ? කාටද රක්ෂාවකට පිටරටකට යන්නට පුළුවන්කමක් තිබුණේ ? එද සාමාන්‍ය කෙනකුට ආශාවට පිටරට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එක්කෝ අගමැතිගේ පුතා වෙන්න ඕනෑ ; එහෙම නැත්නම් දූව වෙන්න ඕනෑ; එහෙමත් නැත්නම් රදළ පරම්පරාවේ බලපුළුවන්කාරයෙක් වෙන්න ඕනෑ, අහස්යාත්‍රාවකට නගින්න නම්.

අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. අද ගම්බද ඕනෑම අහිංසක දරුවකුට වුණත්—ඉංග්‍රීසි ටිකක් කට ගාගෙන තිබෙනවා නම්, ඉංග්‍රීසියෙන් වචන තුන-හතරක් හුවමාරු කරගන්න පුළුවන් නම්—පිටරට ගිහින් ආදායම් මාර්ගයක් හොයා ගන්න පුළුවන්කම තිබෙනවා. මේ තත්ත්වය ඇති වුණේ කොහොමද ? අපට ප්‍රාතිහාර්ය කරන්න නම් බැහැ. නමුත් ජනතාව ඉදිරියට අරගෙන යන්න පුළුවන් ආකල්ප තුළින් අද ක්‍රමානුකූලව මේ රටේ සංවර්ධනයක් ඇති වේගෙන යනවා.

අපි මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අපනයන ස්ථාවර අරමුදලක් ඇති කිරීම පිළිබදව. එය විශාල වෙනසක්. ලංකාවේ කොයි කෙළවරේ හෝ වේවා ඕනෑම සුළු කර්මාන්තයක්, ග්‍රාමීය කර්මාන්තයක් ආරම්භ කොට 25 දෙනකුට වුණත් රක්ෂා ලබාදෙන්න පුළුවන් නම් ඒ අයට සම්පූර්ණ සහන ලබා දෙන්න කටයුතු කරනවායයි ගරු මුදල් ඇමතිතුමා කිව්වා. ලෝක වෙළෙඳපොළේ මොන මිල මට්ටම් පැවතුණත් මේ ස්ථාවර අපනයන අරමුදල නිසා ස්ථාවර අවබෝධයක්, හැඟීමක්, විශ්වාසයක් ඇතිව එම කර්මාන්ත කරගෙන යන්න පුළුවන්. රජයේ රක්ෂා දිහාම ඇහැ ගහගෙන ඉන්න තරුණ - තරුණියන්ට, රජයේ රක්ෂාවකටම යන්න ඕනෑයයි මතයක් තිබෙන උදවියට මෙයින් ලොකු සහනයක් සැලසෙනවා.

රක්ෂා ප්‍රශ්නය විසඳීම රජයට පමණක්ම කරන්න පුළුවන්කමක් නැහැ. මේ විධියේ සාධාරණ පිළිවෙතක් රජය අනුගමනය කරන නිසා දහපහළොස් දෙනකුට හෝ රක්ෂා සපයන්න පුළුවන් ග්‍රාමීය කර්මාන්ත, සුළු කර්මාන්ත ඇති කරන්න පුළුවන්කම ලැබෙනවා නම් එය කොයි තරම් සහනයක්ද ? මේ තත්ත්වය යටතේ, නගරවලින් බැහැර සාමාන්‍ය ජනතාවට—ගම්බද තරුණ තරුණියන්ට—තමන්ගේ ආදායම් මාර්ග සකස් කර ගැනීම සදහා ලොකු සහනයක් සැලසෙනවායයි මට හිතෙනවා. ගරු මුදල් ඇමතිතුමාගේ මේ ප්‍රතිපත්තිය යටතේ අපේ ග්‍රාමීය කර්මාන්තවලට ලොකු අනාගත දිමක් ලැබෙන බව මට විශ්වාසයි.

පසුගිය අවුරුද්දේ ගරු මුදල් ඇමතිතුමා ඇති කළ පුනරුත්ථාපන බද්ද ගැන හූහ දෙනෙක් කෑකෝ ගැහුවා. රට සංවර්ධනය කරන්න තිබුණු, මේ රටේ ජනතාවගේ ප්‍රයෝජනය සදහා යොදවන්න තිබුණු කෝටි සංඛ්‍යාත මුදලක් විනාශ වුණා, 1983 ජූලි කලබල නිසා. ඒ නිසා වුණ පාඩුව මේ රටේ කොයි - කාටත් එක හා සමානව බෙදී යන්නයි, එතුමා පුනරුත්ථාපන බද්දක් පැනෙව්වේ. හොදක් කළත්, නරකක් කළත්—මොන දේ කළත්—එහි ඵල විපාක ඒ ක්‍රියාවට සම්බන්ධ වුණු පුද්ගලයන්ට පමණක් නොව දැනට ජීවත් වී සිටින අයට පමණකුත් නොව අනාගතයේදී ඉපදෙන්න ඉන්න උදවියට පවා බලපාන බවට, විදින්න සිදු වන බවට, යම්කිසි හැඟීමක් හැම දෙනා තුළම ඇති කරන්නයි, එතුමා මේ පුනරුත්ථාපන බද්ද ඇති කළේ. විරුද්ධවාදී වාමාංශික පක්ෂවල උදවිය මේ පුනරුත්ථාපන බද්ද සම්බන්ධයෙන් දැඩි විධියට විවේචනය කළා.

රටක්, සමාජයක් දියුණු කරන්න නම් හැමෝම පොදුවේ පරිත්‍යාග කරන්න ඕනෑ. ඒ පරිත්‍යාගය කෙරෙන්නේ රජයට නොවෙයි, එක්සත් ජාතික පක්ෂයට නොවෙයි. නමුත් අප ජීවත් වන මට්ටම්, අපට ලැබෙන පහසුකම් මොනවා වුණත් අපි අනිත් කිසියම් යුතුකමක් මේ රටට ඉටු වෙන්න ඕනෑ. ජාතික ප්‍රශ්න පිස්සන් වගේ ඇවිල්ලා විසඳන්න බැරිය ; අහිංසක මිනිහකුට ගහපු පළියටවත්, වෙළෙඳ ව්‍යාපාරයක් ගිනි තිබ්බ පළියටවත්, තුවක්කුවක් නැත්නම් බෝම්බයක් එල්ල කළ පළියටවත්, කඩුවකින් හෝ කිනිස්සකින් මිනිහකුට ඇන්න පළියටවත්, මිනිසුන් උසිගන්වා කෑකෝ ගැසූ පළියටවත්, පිස්සන් වගේ කටයුතු කරලාවත් ජාතික ප්‍රශ්න විසඳන්න බැරිය කියන හැඟීමත් දෙන්නයි, ඒ පුනරුත්ථාපන බද්ද ඇති කළේ. මිනිසුන්ගේ හදිසි කෝප, හදිසි ආවේග තුළින් ඇති ව ක්‍රියාකාරකම් නිසා ඇති වන විපාකවලට වන්දි ගෙවන්න මේ රටේ ජීවත් වන සියලුම දෙනාට සිදු වන බව පැහැදිලි කිරීමත්, මේ පුනරුත්ථාපන බද්ද ඇති කිරීමේ එක පරමාර්ථයක්.

අපි හරි විධියට රක්ෂාවට යනවා නම්, ඒ රක්ෂාව නියම විධියට කරනවා නම්, නිදහසේ ජීවත් වෙනවා නම්, අපේ ආකල්ප, අපේ සිතුම් - පැතුම් සාමකාමී නම් ඒ හැම එකකින්ම විශාල රුකුලක් ලැබෙනවා. මේ රට දැනට වැටී තිබෙන තත්ත්වයෙන් නගා සිටුවන්න. ආගමික වේවා, ජාතික වේවා, දේශීය වේවා, විදේශීය වේවා, වර්ජනවලින් වේවා, පිකටින්වලින් වේවා ඇති වන හැම ප්‍රතිඵලයක්ම භුක්ති විදින්න සිදු වන්නේ ජනතාවටයි.

1940 ගණන්වල සිට මේ රටේ ඇතිවූ වර්ජන ව්‍යාපාර කොතෙක්ද ? කොයිතරම් මිනිස් ශ්‍රම ප්‍රමාණයක් මේ රටේ විනාශ වෙන්නට ඇද්ද, මේ වාමාංශික දර්ශනය නැගිටුවා ගන්නට ඒ අය යෙදූ උපක්‍රම නිසා ? කොයි තරම් මිනිස් ශ්‍රම ප්‍රමාණයක් මේ රටේ සංවර්ධනය වෙනුවෙන් වැය කරන්නට තිබුණු කාලය, පැය, කොපමණ කෝටි ගණනක් විනාශ වෙන්නට ඇද්ද මේ වර්ජන නිසා ? 1956 දී බණ්ඩාරනායක අගමැතිතුමා "ගොවි කම්කරු, සඟ, වෙද, ගුරු" කියන ඔක්කොම එකතු කරගෙන ධනවාදී එක්සත් ජාතික පක්ෂය මේ රටේ දේශපාලනයෙන් අතුගා දැම්මාය, මිනී පෙට්ටියට අන්තිම ඇණයත් ගසා වළේ දැම්මාය කියා කැවුම් කිරිබත් කා අවුරුදු හතලිස් ගණනක් තිස්සේ වාමාංශික ව්‍යාපාරයෙහි යෙදුණු උදවිය මේ රටේ සංඝයාට, බෞද්ධයාට බොහොම ආදර ගෞරවය තිබෙන කොටසක්ය කියමින් බොහොම සන්තෝෂයෙන් ආණ්ඩුව පටන්ගත්තා. එහෙත් කී දවසක් කරගෙන ගියාද ? මිනිසුන්ට ලැබුණු සැනසිල්ල මොකක්ද ? දවස් කීයද, යහතින් ජීවත් වුණේ ? සන්තෝෂය අවසන් වෙන්නත් ඉස්සරවෙලායි, වේදනාව පටන් ගත්තේ. ජනතාවට ආදරය තිබුණු වාමාංශික නායකයන්, වමට බරවූ සමාජවාදී සිතුම් පැතුම් තිබෙනවාය කී ආණ්ඩුවක් බලයට ආ වේලාවේ සිට මොකක්ද දුන් සහාය ඒ ආණ්ඩුව ගෙනයන්න ? ඔවුන් ජනතාවගේ ධෛර්යය ලබා දුන්නාද රටේ ආර්ථික තත්ත්වය දියුණු කරන්න ? වර්ජන කීයක් ඇති කළාද ? හාරසිය ගණනක්. ආණ්ඩු කළ දවස් ගණනට වැඩියෙන් රටේ වර්ජන කළ දින ගණන වැඩිවුණා. රටේ නායකයාගේ ජීවිතය විනාශ වුණා.

මේ විනාශකාරී වැඩ කටයුතු නිසා අවුරුදු දහස් ගණනක් තිස්සේ නිර්මලව ආරක්ෂාවී තිබුණු බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ගෞරවය අන්තයටම කෙලෙසා විනාශ කළා. කව්ද භික්ෂූන්වහන්සේලා දේශපාලනයට ඇදගෙන ආවේ, "සඟ වෙද ගුරු ගොවි කම්කරු" කියා. නිර්මලව පැත්තකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙලා ශාසනික වැඩ කටයුතු කරමින්, මිනිසුන්ගේ ගැටුම්වලට අර්බුදවලට භාජන වූ ප්‍රශ්නවලින් ඈත්වෙලා, ජනතාවට ධර්මය ගැන කරුණු කියා දුන් ස්වාමීන්වහන්සේලාත් හතර පෝයට ගමේ හැමදෙනා එකට එකතු කරගත්ත තිබුණු පන්සලත්. මිනිසුන්ගේ හදවතිත් ඈත් කළේ ගෞරව භක්තියෙන් ඈත් කළේ කවුද ? එක්සත් ජාතික පක්ෂයේ නායකයෝද ? නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1956 න් ආරම්භ වූ විනාශකාරී රැල්ලයි.

කහ පැහැති සිවුරක් දකිනවිට ආසනයෙන් නැගිටින බෞද්ධයෝ 1956න් පසුව තුවක්කු, බයිනෙත්තු තබාගත් මිනී මරුවන් නේද කියා සංඝයා වහන්සේට අගෞරව කරන්න, නින්ද කරන්න පෙළඹුණේ බණ්ඩාරනායක අගමැතිතුමා ඇතුළු වාමාංශික ව්‍යාපාරය සියලුම බෞද්ධ භික්ෂූන්වහන්සේලා දේශපාලනයට ඇදගෙන ආ නිසයි කියා මා මතක් කරන්නට ඕනෑ. රටේ සංස්කෘතික විනාශය ආරම්භ වුණේ එදයි. සිංහල බල මණ්ඩලයේ උදවිය අද කැකොස්සන් ගහන්න මහන්සි ගන්නවා, සිංහලයාගේ සංස්කෘතික විනාශය වුණේ එක්සත් ජාතික පක්ෂය නිසයි කියලා. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ආණ්ඩුව ගත්තාට පස්සේ රටේ සංස්කෘතික සෝදාපාළුවක් ඇතිවුණා කියා ඒ අය තර්ක කරනවා. මම කියන්න කැමතියි මේ රටේ බුද්ධිමතුන්ට, සිංහල බල මණ්ඩලයේ උදවියට ඉතිහාසය දෙස ආපස්සට හැරී බලන්නය, 1956 දෙස ආපස්සට හැරී බලන්නය කියා. කැලණි පන්සලේ තිබුණු පූජනීය තත්ත්වය වෙනස් කළේ කවුද ? 'බුද්ධිරක්ඛිත — විමලක්කා' කියා ෆෝටෝ ගැහුවේ කවුද ? පන්සල ඇතුළේ හාමුදුරුවන්ගේ ඇඳ උඩ සිවුරු නොවෙයි, සාරි තිබෙනවා කියා කැලූ පත්තර ගැහුවේ කවුද ? මේ තත්ත්වය "ශාසන විනාශය" ඇති කළේ කවුද ? එක්සත් ජාතික පක්ෂය සංස්කෘතික සෝද පාළුව පටන් ගත්තේ එතැනදියි. පැය විසි හතරෙන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරනවාය කියලා මහජනයා තුළ හැඟීම් අවුස්සලා, කුලප්පු කරලා ජාති භේද වාදී හැඟීම් අවුස්සලා මේ රටේ සන්සුන්වෙලා හිටපු මිනිසුන් නැගිටලා ආවායින් පස්සේ දුන් කරන්නට දෙයක් නැහැ. ඌව පලාතෙන් ආරම්භ වුණු රාජරත්න උන්නැහෙගේ දේශපාලන ජීවිතය බිල්ලට දුන්නා. එයා වීරයෙක් වුණා. දෙමළ මිනිසුන්ගේ හම්වලින් සෙරෙප්පු හදලා දමාගෙන පාර්ලිමේන්තුවට එනවාය කියලයි රාජරත්න මහත්මයා පටන් ගත්තේ. මේ පැත්තෙ කඩයක් කඩයක් ගානේ තිබ්බ්ච දෙමළ අකුරුවල තාර ගෑව. ඒ පැත්තේ සිංහල අකුරුවල තාර ගෑවා. සිංහලය රාජ්‍ය භාෂාව කළාය කියලා යකඩ කැල්ලක් අරගෙන "ශ්‍රී" අකුර දැම්මා. මෙන්න මෙහෙමයි සිංහලයට තැන දුන්නේ. වෛරය පටන් ගත්තේ එද ඉඳලයි. වෛරය බෝ වුණේ එද ඉඳලයි. ගම් පලාත්වල, පුංචි පුංචි නගරවල, අපේ වතුකරයේ අවුරුදු ගණනාවක් තිස්සේ එකට ජීවත් වෙච්ච සිංහල දෙමළ උදවිය, ජාති කුල ආගම් භේදයක් නැතිව සමාදානයෙන් ජීවත් වෙච්ච සිංහල දෙමළ උදවිය භාෂාව නිසා දෙකට බෙදුවා. ඊට පස්සේ පන්සලට යන ද්‍රවිඩ සහෝදරයන් පන්සලට ගියෙ නැහැ. කෝවිලට යන බෞද්ධයන් කෝවිලට ගියේ නැහැ. බස් එකේදී කඩ පිලේදී වෙළඳ පොලේදී හැම තැනකදීම හමුවන මිනිසුන් දෙස එක් එක්කෙනා වෙනස් ආකාරයෙන් බලන්නට පටන් ගත්තා. එයා අගමැති පුටුවේ වාඩි වුණා. මිනිසුන් වෛරයෙන් පෙළුණා. අහිංසක ජනතාව විනාශ වුණා. වෙනම ආණ්ඩුවක් පිළිබඳ අවබෝධයක් හැඟීමක් උතුරේ මිනිසුන් තුළ ඇති වුණා. සිංහල මිනිසුන් එක්ක අපට ජීවත් වන්නට බැහැ ; අපි වෙන ආණ්ඩුවක් තෝරා ගනිමු කියලා ඒ උදවිය ටිකෙන් ටික කල්පනා කළා. ඒ විදියට ද්‍රවිඩ මිනිසුන් තුළ වෛරය බෝ කළා. මෙන්න අපිට ඉතිරිවෙච්ච දේ !

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

කවදද ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

1956 පටන් ගත් ව්‍යාපාරය [බාධා කිරීම්]

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

එද මේ ගරු මන්ත්‍රීතුමා හිටියේ නැහැ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

පණස් හයෙන් පස්සේ පටන් ගත් දෙය අද බෝ වෙලා ඇවිල්ලා, තුවාලය ඔඩු දුවලා, ජාත්‍යන්තර වශයෙනුත් එකට එක්කාසු වෙලා. දකැත්තයි මිටියයි අරගෙන මේ රටේ ආණ්ඩු පිහිටුවන්නට මහන්සි ගන්න උදවියටත් ජනතාවගේ ඡන්දය ලැබෙන්නේ නැති වෙන කොට ඒ උදවිය අද උතුරත් එක්ක එක්කාසු වෙනවා. අද ජාති වාදයක් නොවෙයි තිබෙන්නේ. දේශ ද්‍රෝහියෝ ටික එක්කාසු වෙලා තිබෙන්නේ. මේක විසඳන්න පිළියම් සොයන කොට—තුවාලය සනීප කරන්නට සාකච්ඡා කරනකොට—සැබෑ නායකයෝ නම් එක්කාසු වන්න ඕනෑ. අපි අහනවා බණ්ඩාරනායක මැතිණියගෙන්, අගමැති පුටුවද වටින්නේ රටේ ජීවත්වන ජනතාවද කියලා. ඇයි වට මේස සාකච්ඡාවට තමුන්නාන්සේලාගේ පක්ෂය ආවේ නැත්තේ ? ඇයි එන්නේ නැත්තේ ? ඇයි එන්නට බැරි ? මේ ප්‍රශ්නය, එක්සත් ජාතික පක්ෂය—ජනාධිපතිතුමා—විසඳනවාට බණ්ඩාරනායක මැතිණිය තුළ තද ඊර්ෂ්‍යාවක් තිබෙනවා, එහි ගෞරවය එතුමාට යයි කියලා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

දූත් විසඳුවාද ප්‍රශ්නය?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

මෝඩයා වගේ කෑ ගහන්න එපා. එතැනින් ප්‍රශ්නය ඇති කරලා, අද රට ඉදිරියේ හිනා වෙන්නට බලාගෙන ඉන්නවා. දේශ ද්‍රෝහියෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරක් මස් ටික දීලා පරසුද්දන් ගෙන් ඉඩම් වන්දි ගත් - නින්දගම් ගත් රදළ වලව්වට රට විනාශ වුණත් කාරියක් නැහැ, ආණ්ඩුව හම්බ වෙනවා නම්. මෙන්න මේ ප්‍රශ්නය උඩයි, මේ විදියේ වාතාවරණයක් උඩයි -

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මැතිණිය කොහොමද වැදගත් වන්නේ, දූත්?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා ගිය අවුරුද්දේ අයවැය ලේඛනයෙන් පුනරුත්ථාපන බද්දක් දැම්මෙත් ඒකයි. වෛරයෙන් ප්‍රශ්න විසඳන්නට බැහැ. ඕනෑම මිනිහෙකුට පුළුවමන්, හැඟීම් අවුස්සන්නට. විජේවීර හෙමින් හැඟීම් ඇවිස්සුවා. අහිංසක තරුණ තරුණියන් තමන්ගේ දෙමව්පියන් පවා මරාගෙන ඉදිරියට ආවා. පිළිතුරක් නැහැ. ඔවුන්ට යන්න මාර්ගයක් නැහැ. එක්සත් ජාතික පක්ෂය නම් එද සිටම කියන්නේ සටන් පාඨවලින් ප්‍රශ්න විසඳන්නට බැහැ, බොරුවෙන් වංචාවෙන් ප්‍රශ්න විසඳන්නට බැහැ, ආණ්ඩුවත් ජනතාවත් එකට එක් වී මේවා කර ගනිමු කියන එකයි. අපි යන ගමන ඒකයි. අමාරුකම් තිබෙනවා නම් අමාරුකම් පෙන්වනවා. බඩු මිල අඩු කරන්නට බැරිනම් කරුණු කියාපානවා. බඩු මිල වැඩි නම්, ලෝක වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන් අනුව බඩු මිල වැඩි වෙනවා නම්, සත්‍ය වශයෙන්ම අපි කරුණු කියා පෑවා. ඒ නිසා මේ වෙලාවේ අනවශ්‍ය වාසි තකන්නට හොඳ නැහැ. පුදුම අර්බුද තිබෙන වෙලාවක්. පුදුම විධියේ ප්‍රශ්න හා ගැටුම් තිබෙන වෙලාවක්. අපි ජීවත් විය යුත්තේ එකටයි. වැනසෙනවා නම් වැනසෙන්නට ඕනෑත් එකටයි. ප්‍රශ්න විසඳුවොත් සැනසීම එන්නේ අපේ පක්ෂයට පමණක් නොවෙයි, මුළු මහත් ජනතාවටමයි. අද අපේ රටේ නායකයා, අපේ පක්ෂයේ නායකයා නොවෙයි, මේ රටේ ජාතික නායකයායි. ඒ අවබෝධය ඇතිවයි, එතුමා වැඩ කරන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එතුමා පක්ෂයේ නායකයා නොවෙයිද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

තමුන්නාන්සේගේ හා අපේ නායකයා. අපි හැමදෙනාගේම නායකයා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම අහන්නේ පක්ෂයේ නායකයා නොවෙයිද කියලයි.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

අපේ පක්ෂයේ නායකයා තමයි. නමුත් රටේ ජාතියේ නායකයා හැටියටයි, අද එතුමා වැඩ කරන්නේ. තමුන්නාන්සේලාගේ නායිකාව පිළිගන්නේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපේ නායිකාවට තමුන්නාන්සේලාගේ නායකයා විසින් දඩුවම් දීලයි, ඉන්නේ. ඉතින් ඇයට මොකටද දූත් කථා කරන්නේ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ඒක ඇත්ත. වරදක් කළා නම් වරද පිළිගන්න ඕනැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඇයි ඉතින් දූත් කථා කරන්නේ? දූත් වැදගත් වෙන්නේ කොහොමද?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ජනතාව එක් අයෙකුට අක්කර 50 කට වඩා තබා ගන්නට බැරි යයි ඉඩම් නීතියක් ගෙනාවා. පනතට අත්සන් කරන්න පැය කීපයකට කලින් එතුමිය ඉඩම් වික්කා. ඒක ඔප්පු වුණා. ඒ හොරකම නිසා වංචනික ගැහැනියක් යයි ජනතාව ඉදිරියේ ඔප්පු කළා. ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව නම් අද ඉදිරියට එන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව හැටියට අපි ඇයට ආරාධනා කළා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා වංචනික ගැහැනියක් නායිකාව හැටියට තබාගෙන ඉන්නේ ඇයි? [බාධා කිරීමක්] වංචනිකයෝ, හොරු, රදළයෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හොඳයි. නමුත් ජනතාව පිළිගන්නේ නැහැ.

මේ රටේ ස්ථාවර භාවය ඇති කර ගැනීමේ අඩිතාලම එක්සත් ජාතික පක්ෂය විසින් ඇති කර තිබෙනවා. මොන විධියේ අර්බුද අමාරුකම් හා ගැටළු තිබුණත් රටේ ආර්ථික ස්ථාවර භාවයක් ඇති කර ගන්නට ස්ථිර අඩිතාලමක් දැම්ම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. ප්‍රාදේශීය මට්ටමින් ගම්බද මැතිවරණ කොට්ඨාශ සංවර්ධනය වී තිබෙන අතර ජාතික මට්ටමින් රටේ ආර්ථිකයත් දැන් ක්‍රමානුකූලව ටිකෙන් ටික ඉදිරියට යනවා.

රටේ අභ්‍යන්තර වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් අමාරු කාලයක්. ලෝකයේ හැම රටක්ම වාගේ මුහුණ පා සිටින ප්‍රශ්නවලට අපිත් මුහුණ පා සිටින මේ අවස්ථාවේ ජාතික නායකයෙක් හැටියට ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාණන් ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මේ අවුල් ප්‍රශ්න මැද මේවා විසඳීමට ගන්නා තීරණවලදී ජනතාවගේ ඉවසිලිමත් භාවය හා සහයෝගයයි. රජයේ සේවකයින්ගෙන් සහ සියළු ජනතාවගෙන්ම අපි කරුණාවෙන් ඉල්ලා සිටින්නේ ඒ සහයෝගය ඉදිරියටත් අපට දෙන ලෙසයි. මේ අමාරු කාලයේ ශක්තිමත් අයවැයක් ඉදිරිපත් කරමින් රටේ ආර්ථිකයේ ශක්තිමත් භාවය මේ රටට පමණක් නොව මුළු ලෝකයටම ඉදිරිපත් කිරීම ගැන මුදල් ඇමතිතුමාට ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

අ. භා. 3.

**ජී. වී. පුංචිනිලමේ මහතා (නියෝජ්‍ය වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් පිළිබඳ ඇමතිතුමා)**
**(திரு. ஜீ. வீ. புஞ்சிநிலமே—மாதர் அலுவல்கள், போதனா வைத்தியசாலைகள் பிரதி அமைச்சர்)**
**(Mr. G. V. Punchinilame – Deputy Minister of Women's Affairs and Teaching Hospitals)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අට වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන—

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

රටේ නොවෙයි රජයේ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

එහෙම නොකිව්වොත් ඒක වැරදිද ? තමුන්නාන්සේලා මේ රටට අයිති නැද්ද ?

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

රටේ අට වැනි අයවැය ලේඛනය නොවෙයි, මේ රජයේ අට වැනි අයවැය ලේඛනය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order please, ඔක පස්සෙ බේරා ගන්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 දී මේ ආණ්ඩුව බලයට එන වේලාවේදී, මේ රටේ ඉන්න අන්තිම අහිංසක දුප්පත්, නූගත් පුද්ගලයාත් දැනගෙන සිටියා, අයවැය වාර්තාවක් ඉදිරිපත් කරන්නට පුළුවන් ආර්ථික තත්ත්වයක රට නොපවතින බව. එවැනි තත්ත්වයකින් රටේ පාලනය භාර ගන්නට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට එද සිදු වුණු බව මුදල් ඇමතිතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. එවැනි තත්ත්වයක රට තිබෙද්දීත් එතුමා ඉතා දක්ෂ ලෙස 1977 දී අයවැය ඉදිරිපත් කළ බව අපට මතකයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඉදිරිපත් කරන්නට බැරි තත්ත්වයක් තිබුණා නම් කොහොමද ඉදිරිපත් කළේ ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

1977 කාලයේදී තමුන්නාන්සේ මේ ගරු සභාවේ සිටියේ නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

හොඳයි, තමුන්නාන්සේට කියන්නට පුළුවන්ද ඒ කාලයේ ආර්ථික තත්ත්වය ගැන විස්තරයක්.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

පස්සෙ වෙලාවක ආවොත් ඒ විස්තර මට කියල දෙන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

එහෙම කියන්නට පුළුවන්කමක් තිබෙනවා නම් නමුන්නාන්සෙගෙ තර්ක මම පිළිගන්නවා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ටික වේලාවකට පස්සෙ ආවොත් මම කියල දෙන්නම්. නමුන්නාන්සෙ ඔතන ඉන්නෙ හරියට මැරිල ඉපදිල වාගෙයි. ඒකට හේතුත් අපි කියා දෙන්නම්. [බාධා කිරීමක්] ඔව්, නමුන්නාන්සේලාට අපි අවස්ථාවල් කීපයක්ම ලබා දුන්නා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

කරුණාකර බොහොම ඉවසිලිවන්තව මම මතු කළ ඒ කාරණයට පිළිතුරු දෙන්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

අපි බොහොම ඉවසිලිවන්තව තමයි කථා කරන්නෙ. අපේ ඇමතිතුමා හත් අවුරුද්දක් තුළ අයවැය ලේඛන හතක්ම ඉදිරිපත් කර තිබෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒ කාලයෙදී තිබුණු විදේශ වත්කම් ගැන කරුණාකර සංඛ්‍යාලේඛන ටිකක් පෙන්වන්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

විදේශ වත්කම් ගැන විස්තර අයවැය වාර්තාවලින් ඉදිරිපත් කර තිබෙනවා. ඕනෑ නම් ඒවා ගිහින් කියවන්න. එහෙම කියවන්න බැරි නම්, පස්සෙ වෙලාවක ඇවිත් මාව සම්බ වෙන්න. මම කියල දෙන්නම්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙම නම් නමුන්නාන්සෙ කියන්නෙ අමූලික අසත්‍යයක්ය කියල මම කියනවා. [බාධා කිරීමක්]

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

මේ බාධාවල් අප එතරම් ගණන් ගන්නෙ නැහැ. රටේ ජනතාව ගණන් ගන්නෙත් නැහැ. මේ ආණ්ඩුවෙ මන්ත්‍රිවරු - [බාධා කිරීමක්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා, අපි අහපු කාරණා ටික ගැන අපට කියලා දෙන්නය කියල.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

මේ උදවියට මෙහෙම වෙලාවකවත් කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ නොවැ ? මොකද, මේ අයවැය යෝජනාවලට විරුද්ධව බැරි වෙලාවකවත් රැස්වීමකට ගිහින් කථා කළොත් මේ අයට මහජනතාවගෙන් ලැබෙන්නෙ ගල් පූජාවක්. මෙතැන ආරක්ෂා සහිත නිසා කථා කරන්නට ඉඩ දෙමු. [බාධා කිරීමක්] ඊයෙ-පෙරේද අතුරු මැතිවරණ දෙකක් තිබුණා. විරුද්ධ පක්ෂයේ නමුන්නාන්සේලා ගිහින් පව වට්ටෝරු ඔක්කොම හැලුවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

නමුන්නාන්සේත් එහෙ ගියාද ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

අපි ගියා. නමුන්නාන්සෙ පරණ මොරිස් මයිනර් කාර් එකකින් ආපු හැටිත් ඕනෑ නම් මම කියල දෙන්නම්.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

නමුන්නාන්සෙට මතක නැද්ද අර ජාතිවාදී කලබල වෙලාවෙදි රත්නපුරේ කඩ පිච්චුවාය කියල තිබුණු ප්‍රශ්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ඒවා ගැනත් ඕනෑ නම් මම කියල දෙන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order please ! බාධා කරන්න එපා. කථාව කර ගෙන යන්න ඉඩ දෙන්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

නැහැ. නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයට බාධා කරන්නත් ඉඩ දෙන්න ඕනෑ. මොකද, මෙතැනදි විතරයි මේ අයට බාධා කරන්න පුළුවන් වෙන්නෙ. පිට ගිහින් නම් ඔය බාධාවල් කරන්න ලැබෙන්නෙ නැහැ. [බාධා කිරීම] එදා ඒ මන්ත්‍රීතුමා අර පරණ මොරිස් මයිනර් කාර් එකෙන් හරියට උදේ දහය වනකොට එහෙන් පිටත්වෙලා ආවා නේද ? මොකද, උන්නැහේ කල්වෙලා ඇතිව දැනගෙන සිටියා මිත්තේරියේ ප්‍රතිඵල ගැන. අඩු ගණනෙ ඡන්ද නව දහසකින්වත් එක්සත් ජාතික පක්ෂය දිනනවාය කියල දැනගෙන සිටියා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

අපි වේලාසනින් ආවා තමයි.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

එහෙම නම් වේලාසනින් ආ බව නමුන්නාන්සෙ පිළිගන්නවා. එහෙම පිළිගත්තු එක බොහොම හොඳයි. ඒ විධියට ඇත්ත කථා කර දේශපාලනය කරමු. නමුත් අපි නම් නමුන්නාන්සේලා ක්‍රියා කරන විධියට නොවෙයි මැතිවරණ සටන ගෙන යන්නේ. අපි සටනකට ඉදිරිපත් වුණොත් ජයග්‍රහණය ලබා ගන්නා තුරු ඒ සටන ගෙන යනවා. 1977 දී අපි මේ රටේ පාලනය භාර ගන්නෙ කොහොම හරි රට ඉදිරියට ගෙන යන්නට ඕනෑය කියන හැඟීමෙන්. කලින් බලයේ සිටි ආණ්ඩු මුදල් ඉතිරි කර නොතිබුණත්, අපේ මුදල් ඇමතිතුමා 1977 දී ඉතා දක්ෂ ලෙස තම අයවැය ලේඛනය ඉදිරිපත් කළා. එදා සිට අවුරුදු පතා අයවැය ලේඛන ඉදිරිපත් කරමින් දැන් 1985 ටත් ඇවිත් තිබෙනවා. මේ අනුව එතුමා අයවැය ලේඛන අටක්ම ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා " මෙල් මල් " කියන තත්ත්වයෙන් අද අපට කථා කරන්න පුළුවන් වී තිබෙනවා. " මෙල්-මල් " කියන ඒ නම හොඳට මතක තියා ගන්න. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් එදා අනාවැකි පළ කළා, මේ ආණ්ඩුවට ආයුෂ හය මාසයයි, අවුරුද්දයි කියා. මොකද, විරුද්ධ පාර්ශ්වය එදා හොඳින්ම දැන සිටියා, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව රටේ පාලනය භාර ගන්නා විට භාණ්ඩාගාරයේ සල්ලි ශත පහක්වත් ඉතුරු කර නොතිබුණු බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඔය මොන කාලයේදිද ? පුළුවන් නම් සංඛ්‍යා ලේඛනවලින් ඒක ඔප්පු කරන්න. අයවැය විවාදයකදී ඔය විධියෙ කාරණා කියනවා නම් සංඛ්‍යා ලේඛන සහිතව ඉදිරිපත් කරන්න ඕනෑ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

තමුන්නාන්සෙට මම කලිනුත් කිව්වා, ඒවා ගැන වැඩි විස්තර දැනගන්න ඕනෑ නම් රැස්වීමෙන් පස්සෙ ඇවිත් මාව සම්බ වෙන්න ඕනෑය කියා. එහෙම නැති නම් 1977 ට ඉස්සර තිබුණු වාර්තා ටිකක් කියවා බලා ඒ කාරණා ගැන දැනගන්න.

එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)
(ஜனாப் எம். ஹலீம் இஸாக் — கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)
(Mr. M. Haleem Ishak–Third Colombo Central)

තමුන්නාන්සෙට " ට්‍රාන්ස්ෆර් " කීයක් ලැබුණාද ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ට්‍රාන්ස්ෆර් ? මොන ට්‍රාන්ස්ෆර්ද ? [බාධා කිරීමක්] මට තුනක් හම්බ වෙලා තිබෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේට හම්බ වුණේ ප්‍රොමෝෂන්ද, ඩිමෝෂන්ද ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

මම ප්‍රොමෝෂන්, ඩිමෝෂන් දෙකටම ඔට්ටුයි. තමුන්නාන්සේ වාගේ ප්‍රොමෝෂන් පමණක් බලාගෙන ඉන්න මිනිහෙක් නොවෙයි මම. රට වෙනුවෙන් අපි ඕනෑම දෙයක් කරන්න ලැහැස්තියි. තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ රට වෙනුවෙන් කරන්න නොවෙයි, තමන් වෙනුවෙන් කරන්නයි. ඡන්ද පෙත්සමේ තීන්දුව දුන්නාට පස්සේ මේ අයවැය ලේඛනයත් අරගෙන තනිත්ත වේදිකාවට. එදාට තමුන්නාන්සේට තේරේවි මිත්තේරියේ කුණ්ඩසාලෙ ලැබුණ ප්‍රතිඵලයම තමයි ලැබෙන්නෙ කියා. හොඳට මතක තියාගන්න. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ මුදල් ඇමතිතුමා " මෙල් මල් " කියන තත්ත්වයට පත් වී සිටිනවා.

එතුමා ඉදිරිපත් කළ හැම අයවැය ලේඛනයක්ම විවේචනය වුණා. ඔව්, විවේචනය කරන්න ඕනෑ. නමුත් අවුරුද්දක් යන විට—වැඩ කරගෙන යන විට—අපට පේනවා එතුමා ඉතා සාර්ථකව ඒ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන බව ; ඒ වාගේම ඉදිරිපත් කළ රාජකාරීන් හැම අතින්ම ඉටු කර තිබෙන බව. ඒ ඉටු කෙළේ රටේ ජනතාවගේ සුභසිද්ධිය සඳහායි.

1977 වන විට මේ රටේ රැකිරක්ෂා විරහිත 12,00,000 ක් පමණ මේ රටේ සිටියා. ඒ උදවිය තමන්ට රක්ෂා නැති නිසා නොයෙක් විධියේ ව්‍යාපාර ආරම්භ කළා. ඒවා කඩාකප්පල්කාරී ව්‍යාපාරයි. ඔවුන් එදා නොයෙක් විධියේ අසහනවලින් පෙළී පෙළී සිටියා. එදා සාමාන්‍ය මිනිහෙකුට පිට රට යන්න අවස්ථාවක් තිබුණේ නැහැ. එතුමා අයවැය ලේඛන ඉදිරිපත් කරන්නට පටන්ගත් මේ අවුරුදු 8 ඇතුළත කුස්සි අම්මලා වඩු මහත්වරුන් ආදී සැම කෙනෙකුටම පිට රට ගොස් එයින් ප්‍රයෝජන ලබාගැනීමේ අවස්ථාව ලැබුණා. ඔවුන් ලැබූ ප්‍රයෝජනයට වැඩි යමක්ද මෙහිදී සිද්ධ වුණා. ඒ මොකක්ද ? අපේ රටට විදේශ විනිමය අවශ්‍යයි. මුදල් ඇමතිතුමාගේ චින්තනය අනුව, ජනාධිපතිතුමාගේ චින්තනය අනුව අපේ රටේ ජනතාවටත් පිට රට යැමේ අවස්ථාව දෙන්න ඕනෑය, ඒ උදවිය පිටරට සල්ලි ගෙනාවාම අපේ රටටත් ප්‍රයෝජනයක් තිබෙනවාය, ඒ උදවියටත් ප්‍රයෝජනයක් තිබෙනවාය කියා ඒ ඇති කළ ප්‍රතිපත්තිය ගැන තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. පසුගිය ආණ්ඩුව මේ අවස්ථාව කී දෙනෙකුට දුන්නද ? පවුල් කීයකටද තමුන්නාන්සේලා ඒ අවස්ථාව සීමා කර තිබුණේ ? පොඩ්ඩක් හිතන්න.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

පසුගිය ආණ්ඩු කාලෙ මැද පෙරදිග රක්ෂා දුන්නෙ නැහැ ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

පසුගිය ආණ්ඩු කාලයේ මැද පෙරදිගට තියා මේ රටේ කිසිම මිනිසෙකුට කිසිම රටකට යන්න දුන්නෙ නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ ඒ කාලයේ ලංකාවෙ සිටියෙ නැති බවයි ඒ කථාවෙන් තේරුම් යන්නෙ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

හරි, ඒ උත්තරය බලාපොරොත්තුව තමයි මම සිටියේ. ඇත්ත තමයි අපි රටේ නොහිටියා වාගෙයි හිටියෙ. ඒක හොඳට මතක තියාගන්න. අප එළියේ සිටින විට ඒ කාලයේ අපව අල්ලා සිර කුඩුවලට දැම්මා. අපි හිර කුඩුවලට යන්නට හේතු වුණේ මොකක්ද ? අද මේ රටේ ජනතාව භුක්ති විඳින ඔය නිදහස ලබා දෙන්න ගිහිල්ලයි. තමුන්නාන්සේලා නොයෙක් විධියේ තහංචි දැම්මා. හාල් සේරුවක් ගෙන යාම තහනම් කළා. පත්‍ර මුකවාඩම දැම්මා. ඒ තහංචි දැමූ වෙලාවෙහි මේ රටේ ජනතාවට ඒවා නැවත ලබා දෙන්න සටන් කරලයි අපි සිර කුඩුවලට ගියේ. ඒක මතක තියාගන්න. අද එහෙම සටන් කරන්න වුවමනාවක් ඇති වෙලා නැහැ. සියලුම අයිතීන් අපි දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා 12,00,000 රැකියා විරහිතව සිටියත් අද මුළු රටේම අස්සක් මුල්ලක් නැර සැම තරාතිරකම උදවියට පිට රට ගිහින් මුදල් උපයන්න අවස්ථාව සැලසී තිබෙනවා. මම හිතන්නෙ තේ, පොල්, රබර් හැරෙන විට, ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛන ඉදිරිපත් කිරීම උඩ, ගරු ජනාධිපතිතුමාගේ චින්තනය උඩ අද දෙවැනි තැනට විදේශ විනිමය ලැබෙන්නේ අපේ රටේ ශ්‍රමය පිටරටට විකිණීමෙන්ය කියා අපට කියන්න පුළුවන්. මෙය විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුනුත් පිළිගත යුතු කාරණයක්.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

පසුගිය ආණ්ඩුව කාලයෙයි පටන්ගත්තෙ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

පසුගිය ආණ්ඩු කාලයේ පටන්ගත්තාට මම මේ ප්‍රශ්නය තමුන්නාන්සේගෙන් අහන්නම්. තමුන්නාන්සේට මම හුඟක් ගරු කරනවා. තමුන්නාන්සේ බොහෝම හොඳ මන්ත්‍රීවරයෙක්. තමුන්නාන්සේට අපි හරියට ආදරෙයි. හැබැයි, තමුන්නාන්සේ සමහර වෙලාවට බොහෝම බොළඳයි. දැන් මේ කරන්නේ බොළඳ කථා. එදා මේ රටේ තරුණ තරුණියන් දෙලොස් ලක්ෂයක් සම්බ රැකියා විරහිතව සිටියා. මම මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාගෙන්ම (එම්. හලීම් ඉෂාක් මහතා) අහන්නම්. තමුන්නාන්සේ එදත් ඔය ආසනයේ මන්ත්‍රීවරයෙකු හැටියට හිටියා. එදා තමුන්නාන්සේගේ ආසනයෙන් පිටරට ගියේ කී දෙනෙක්ද ? අද කී දෙනෙක් ගිහින් ඉන්නවාද ?

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

මොකක්ද කාලය ? ඒ කාලයෙත් දහස් ගණනක් පිටරට ගියා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ඒ කාලයේ පිටරට යන්න කී දෙනෙකුට අවස්ථාව ලබා දී තිබුණාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

තමුන්නාන්සේලාගේ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙක් කිව්වේ අපේ කාලයේ ගියේ නැහැයි කියා.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

නම් ටික ඉදිරිපත් කරන්න.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

කවුද කිව්වේ ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගියා. ගියා. මම කියා දෙන්නම් කී දෙනෙක් ගියාද කියන එක.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

මගේ ආසනයෙන් ගිහින් තිබෙනවා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටරට ගියා. අපි නැහැයි කියන්නේ නැහැ. හැබැයි ඒ ගියේ සීමිත පවුල් කීපයකින් පමණයි. මන්ත්‍රීතුමාත් එක්ක ඉතාමත් කිට්ටුවෙන් සිටිය සීමිත පවුල් කීපයක උදවිය සීමිත ප්‍රමාණයක් පිටරට ගියා. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. එද අද වගේ විවෘතව යන්න දුන්නේ නැහැ. එද මේ රටට විදේශ විනිමය ගෙනාවේ කොපමණද කියා හිතා බලන්න. මම සංඛ්‍යා ලේඛන ඉල්ලන්නේ නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

එද විදේශ විනිමය වංචාකාරයන් හිරේ දැම්මා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ඒක නම් බොහොම ලොකුවට කියනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේලා ඒ අය එළියට දැම්මා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ඒ අය එළියට දමලා, නිදහස් වෙළඳ කලාපයෙයි, විදේශ ආයෝජන උපදේශක කමිටුවෙයි හැත්තෑ දහසකට වැඩිය රැකිය විරහිත තරුණ තරුණියන්ට රැකියා ලබා දීමට මේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛන නිසා අවස්ථාව ලැබී තිබෙන බවත් මතක තබාගන්න.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

කරුණාකර ඒ සංඛ්‍යාලේඛන ආයෙමත් කියන්න.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V Punchinilame)

හැත්තෑ දහසකට වැඩිය ඉන්නවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒ සංඛ්‍යා ලේඛන කොහෙන්ද ?

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

ඒ සංඛ්‍යා ලේඛන හරි. ඒ කියන්නේ නිදහස් වෙළඳ කලාපයේ පමණක් නොවෙයි, නිදහස් වෙළඳ කලාපයේ අලුත් ව්‍යාපාර හැත්තෑවක් දැන් වැඩ කරගෙන යනවා. ඒවා ආරම්භ කරලා අවසානයි. ඊට පිටස්තරව මගේ අමාත්‍යාංශයේ විදේශ ආයෝජන උපදේශක කොමිටියේ අලුත් ව්‍යාපාර තුන්සිය තිහක් පසුගිය අවුරුදු පහේදී මේ රටේ ආරම්භ කර තිබෙනවා. ඒ දෙකේම හැත්තෑ දහසකට වැඩි පිරිසකට කෙළින්ම රැකියා ලැබී තිබෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු ඇමතිතුමනි, ඒ සංඛ්‍යා ලේඛන අපි පිළිගන්නේ නැහැ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

තමුන්නාන්සේලාට ඕනෑ නම් පිළිගන්න පුළුවන්, පිළිගන්නේ නැතිව ඉන්නත් පුළුවන්. දැන් මේ මැදපෙරදිග රටවල්වලට රැකියා සඳහා ගිය ආකාරය ගැන කථා කළා. ඒකටත් පිළිතුරක් දීම මගේ යුතුකමක්. ඒ කාලයේ කිසිම කෙනෙකුට – මන්ත්‍රීවරයෙකුටවත් – පිටරට යන්න බැහැ, අගමැතිනියගේ පුද්ගලික අවසරය නැතිව. විදේශ සම්මේලනවලට පුද්ගලිකව මගේ නමට ආරාධනා ලැබුණු අවස්ථාවලදී පවා අට වතාවක් මට පිටරට යන්න දුන්නේ නැහැ. 1970 සිට 1977 දක්වා අට වතාවක් මට පිටරට යන්න දුන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කියනකම්. මන්ත්‍රීවරුන්ටත් සැලකුවේ එහෙමයි. සාමාන්‍ය මිනිසුන්ට සැලකුවේ කොහොමද කියන එක ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ. 1976 දී මැද පෙරදිගින් ලැබුණු සම්පූර්ණ මුදල රුපියල් දශ ලක්ෂ තිහයි. පසුගිය අවුරුද්දේදී රුපියල් දස ලක්ෂ හත් දහක් ලැබුණා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට අක්මීමන ගරු මන්ත්‍රීතුමා, නවම මේ ගරු සභාවට නවකයෙක්. අපට වඩා නවකයෙක්. ඒ නිසා එතුමා තව හුඟක් කියවන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානයකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ මේ ප්‍රතිපත්ති තුළින්, මේ අයවැය ලේඛන තුළින්, මේ ක්‍රියාදාමයන් තුළින් මේ රටේ හැත්තෑ දහසකට අධික පිරිසකට අද රැකියා ලැබී තිබෙනවා. පිටරට ගිහින් සිටින සංඛ්‍යාව කොපමණද කිව්වොත් ඒ අයගෙන් මේ රටට විදේශ විනිමය වශයෙන් දැන් ලැබෙන මුදල් ප්‍රමාණය ගරු මුදල් ඇමතිතුමාගෙන් කියවුණා. මේ අවුරුද්ද වන විට තුන් ලක්ෂ විසි පන් දහසක් පිටරට ගිහින් තිබෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ආපසු ආව අය ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

එහේ නවතින්න යනවා නොවෙයි. එහේ ගිහින් අවුරුද්දයි, දෙකයි, තුනයි ඉන්නේ. එහේ බිත්ත බහින්න යනවා නොවෙයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ආපසු යන්තය කියා එවපු අය ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

තමුන්නාන්සේ මෝඩයෙක් වගේ කථා කරන්න එපා. මේ රටේ උදවිය ඒ රටවලට බිත්ත බහින්න යන්නේ නැහැ. බිත්ත බහින්න යන උදවියත් ඇති. හැබැයි වැඩි දෙනෙක් යන්නේ, එහේ ගියාම මෙහාට වැඩියෙන් යමක් හම්බ කරන්නට පුළුවන් නිසයි. එහේ වැඩියෙන් පඩි ලැබෙනවා. එයින් වාසිය සැලසෙන්නේ ඒ පිටරට යන පුද්ගලයාට පමණක් නොවෙයි, මේ රටටත්, ජාතියටත් එයින් ලොකු වාසියක් සැලසෙනවා. මේක ඇත්ත. අපි ඇත්ත පිළිගන්න ඕනෑ. තමුන්නාන්සේලා හුඟක් වෙලාවට ඇත්ත පිළිගන්නේ නැහැ. ඇත්ත පිළිගන්න ලෑස්ති නැහැ. 1970 සිට 1977 වන තුරු මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට රට පාලනය කිරීම සඳහා අවස්ථාව දුන්නා; අයිතිය දුන්නා. දීලා ජනතාව නොයෙකුත් දහදුක් වින්ද. මට එක කරුණක් මතකයි. අපේ පලාත්වල තිබෙනවා තයිහබරල. මේ පලාතෙත් තිබෙනවාද මම දන්නේ නැහැ. බද්දේගමත් ඇති. මහරගම හේමත් ඇති. ඒ තයිහබරල යුගය සාමාන්‍ය දුප්පත් මිනිසුන් කාටවත් අමතක වන්නේ නැහැ. එද දුප්පත් ජනතාව තයිහබරල හත් පාරක් තම්බා ලුණුයි පොලුයි දලා කෑවා. ඒ හත් අවුරුද්දේ. මයියොක්කා ගහේ පංචාංගයම කෑවා. සුමානයකට දවස් දෙකක් බත් නොකා නිකම් සිටියා. අඳින රෙදි කෑල්ල පිච්චුවට පිච්චෙන්නෙ නැහැ. ඇගේ ගාන්න සබන් කෑල්ලක් නැහැ. අඟහරුවාද සිකුරාද බතුත් නැහැ. පෝලිම්. අර පෝලිම් මේ පෝලිම්. බද්දේගම ගරු මන්ත්‍රීතුමාට මේවා හොඳට මතක තියෙන්න ඕනෑ. [බාධා කිරීම්]

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

පිටරටවලින් ගෙනාපුවා ගෙවන්න වන හැටි මුදල් ඇමතිතුමා කිව්වා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ඒවා ආපහු ගෙවන්නෙත් රටේ ජනතාවට දැනෙන්නේ නැති විධියට. මේ අයවැය ලේඛනය සකස් කර තිබෙන්නේ ඒ විධියටයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මුදල් ඇමතිතුමාගේ කතාවෙත් තමුන්නාන්සේලාට අවවාදයකුත් කළා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

අපට අවවාද කරලා තමයි මේ හැම කටයුත්තක්ම කරන්නේ. ඒක මතක තියා ගන්න හොඳට. එහෙම තමයි රට පාලනය කරන්න ඕනෑ. තමුන්නාන්සේලා එහෙම නොවෙයි. කියන්නෙවත් නැතිව එකපාරටම කරන්නේ. රෑ දොළහට හැම දෙයක්ම උස්සන්නේ. ඒ ජාතියේ ඉස්සිලි අද නැහැ. දැන් මේ අයවැය ලේඛනයක ඉදිරිපත් වී තිබෙනවා. රටේ කිසිම කෙනෙක් ඒ ගැන ගානක් ගන්නේ නැහැ. මොකද ? සාමාන්‍ය මහජනතාව පිට බර පටවන්නේ නැති බව ඔවුන් දන්නවා. කී වතාවක් පඩි වැඩි කර තිබෙනවාද ? තමුන්නාන්සේලාගේ කාලයේත් අය වැය ලේඛන ඉදිරිපත් වුණා. අඩු ගණනේ සුමානයකවත් කල්තියා වෙළෙන්දෝ බඩු හංගන්න පටන්ගන්නවා. මොකද ? කොයි එක වැඩි වෙනවාද, කොයි එක අඩුවෙනවාද දන්නේ නැහැ. වැඩිපුරම දන්නේ වැඩි වන බව තමයි. තමුන්නාන්සේලා දැන් මේ කතා කරන විධියට ඒ කාලයේදී කොහේ හිටියාද මම දන්නේ නැහැ. මැරිලා හිටියාය කියායි අපට නම් හිතෙන්නේ.

මේ අයවැය ඉදිරිපත් කිරීම ඉතාම දක්ෂ ලෙස කර තිබෙනවා. සියලුම අංශ සංතෝෂ කිරීම එතරම් ලේසි දෙයක් නොවෙයි. මුදල් ඇමතිතුමාගේ කතාවේදිත් එය කියවුණා. සුළු පිරිසකට අමාරු වෙයි. නමුත් එතුමා බැලුවේ පුළුවන් තරම් රටේ ජනතාව නොතලා බේරන්නයි. ඒ නිසා මේ රටේ ජනතාවට විශාල සහනයක් සැලසී තිබෙනවා. [ බාධා කිරීමක් ] වචනයක් පිට වුණොත් තමුන්නාන්සේලා හැම විටම බලන්නේ අර පරණ යුගයේ විධියටයි. එද තමුන්නාන්සේ බණ්ඩාරනායක මැතිනිය සනසන්න වචනයක් කතා නොකර ගියා නම් කෝටුව අරගෙන තමුන්නාන්සේගේ පස්සට දෙක් දීලා තමයි කතා කරන්නේ. [ බාධා කිරීම්. ] එක පත්වීමක්වත් අපි ලබාගෙන නැහැ. ඒක මතක තියාගන්න. තමුන්නාන්සේලාගේ යුගයේ පත්වීම් දුන් ඒවා ගැන කියන්න ගියොත් ! ඒවා කියන්න තරම් ලජ්ජයි.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

බැංකු පත්වීම් ගැන කී නිසා වචනයක් කියන්න ඕනෑ. මේ පළමුවැනිද හැම ආසනයකටම කිසිම අඩුපාඩුවක් නැතිව බැංකු පත්වීම් පහක් බැගින් ලැබෙනවා. විපක්ෂයටත් ලැබෙනවා. ඒ ගොල්ල සමහරුත් ඇවිත් මගෙන් ඉල්ලලාත් තිබෙනවා. [ බාධා කිරීම් ]

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ලැජ්ජා නැහැ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

තාම කාටවත් කොයි ආසනයකටවත් ලැබී නැහැ. නමුත් ලැබෙන විට සැම ආසනයකටම කිසිම වෙනසක් නැතිව බැංකු පත්වීම් පහක් ලැබෙනවා. කිසිම ප්‍රශ්නයක් නැහැ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

මුදල් ඇමතිතුමාගේ අයවැය ඉදිරිපත් කර තිබෙන ක්‍රමය අනුව දැන් ලක්ෂයකට පමණ රක්ෂා ලැබී තිබෙනවා. මේ ඔක්කෝටම මුදල් හොයන්න ඕනෑ. මේ ඉදිරිපත් කර තිබෙන ක්‍රමය නිසා ඒවා දෙන්න පුළුවනි. ගුරු පත්වීම් එද තමුන්නාන්සේලාගේ කාලයේ කී දෙනෙකුට දුන්නද ? අපි දැනට පණස් දහකට වැඩිය දීලා තිබෙනවා. පසුගිය අවුරුදු හයේදී, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් බැංකු පත්වීම් දෙන බව මුදල් ඇමතිතුමා කිව්වා. තමුන්නාන්සේලා පස්ස දොරෙන් ගිහින් ඉල්ලා තිබෙන බවත් කිව්වා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

නෑ, නෑ, අපි ඉල්ලා නැහැ. ඉල්ලූ අයගේ නම් ඉදිරිපත් කරන්න අපි මුදල් ඇමතිතුමාට කියනවා. අපි නම් ඉල්ලා නැහැ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

තම කියන එක බොහොම කැතයි. තමුන්නාන්සේ නම් වැඩි දවසක් ඉන්නෙ නැහැනේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ ඊට වැඩිය ඉක්මණට යයිද දන්නේ නැහැ. අස්වීමේ ලියුම ජනාධිපතිතුමා ළඟ තියෙනවා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔන්න ඕක එළියට ගන්න තමයි ඔය ටික මම කීවේ. ඒ උදවිය හැම දෙනාම කියනවා අපි ඉල්ලා අස්වීමේ ලිපි භාර දී තිබෙනවාය කියා. අපේ ගරු ජනාධිපතිතුමා ඒ ලියුම් සේරම දැන් ඉරලා දමල ඉවර බව අපි තමුන්නාන්සේට කියන්න ඕනෑ. ඒක හොඳට මතක තබා ගන්න. එහෙම නැතිව අපව දොට්ට දමන්න නොවෙයි ඒ ලියුම් ගත්තේ. අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ව මේ ආණ්ඩුවට පමණක් නොවෙයි මුළු රටටම නම්බුවක්. එද 1970 – 77 කාලයේ සිටි තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන් ගැන කථා කරන්න ගියොත් ගොඩක් දේවල් තියෙනවා කථා කරන්න. තමුන්නාන්සේ එද මේ සභාවේ හිටියේ නැහැ. එද අපි ගැලරියට ඇවිත් ඒ මන්ත්‍රීවරුන් කියූ ඒවා අසාගෙන බලාගෙන හිටියා. එද සිටි නියෝජ්‍ය ඇමතිවරයෙක් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ හැට්ටය ඇතුළට වමනය දැම්මා. ඇය ඇඳගෙන සිටි ඇඳුම උඩට වමනය දැම්මා, බෙල්ලට උඩින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔළුව දමලා. ඒ අවස්ථාවේදී ගත් ක්‍රියා මාර්ගය මොකක්ද ? ඒ අයට දඬුවම් දුන්නාද ? පගා ගහල නොයෙකුත් විධියේ දූෂණ කරල අහු වුණා. ඒ අයට දඬුවම් දුන්නාද ? ගැලරියේ ඉඳගෙන අතික් උදවිය ඒවා බලාගෙන හිටියා. තමුන්නාන්සේලා එද දුන්න ආදර්ශය බොහොම හොඳයි. මොකක්ද මේ නිසා සිදු වුණේ ? ඒ ඇතුළේ සිදු වූ දේවල් පිටතට ගියා. ඒවා පිටතට ගියාම පක්ෂය පාලනය කරන්න බැරි වුණා. මේ නිසා මුළු රටම 'අප්සට්' වෙලා ගියා.

1977 අවසාන කාලයේදී මේ ආණ්ඩුව බලයට පත් වුණා. අපි වැරදි කළොත් ගරු ජනාධිපතිතුමා අපට දඬුවම් දෙනවා. මන්ත්‍රීවරුන්ට ඕනෑ ඕනෑ විධියට හැසිරෙන්න බැහැ. තමුන්නාන්සේ එය මතක තබා ගන්න ඕනෑ. තමුන්නාන්සේලා හිතාගෙන ඇති තමුන්නාන්සේලා පක්ෂය පාලනය කළා වාගේ අපේ පක්ෂයත් පාලනය කරන්න පුළුවන් වෙයි කියා. අපේ පක්ෂයට විනයක් තිබෙනවා. අපේ මන්ත්‍රීවරු, ඇමතිවරු හැම එක්කෙනෙක්ම විනය ගරු කරනවා. ඒ විනය කැඩුවොත්, ඒ නීතිරීති කැඩුවොත් අපි සියලු දෙනාවම වුණත් ගෙදර යවන්න ජනාධිපතිතුමාට විධායක බලය දී තිබෙනවා. තමුන්නාන්සේලා ඒක මතක තබා ගන්න ඕනෑ. මම නම් හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක්. ඒකාධිපතිවාදයට මම විරුද්ධයි. මේ රටේ පක්ෂ ක්‍රමය නැති වෙන්න ඕනෑ. පක්ෂ ක්‍රමය නිසයි අද අපේ මුළු ජාතියම භේද - භින්න වෙලා නැති වෙන්න ඇවිත් තිබෙන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ දේශපාලන පක්ෂ ක්‍රමය තිබෙන්න ඕනෑ බව මතුගම ආසනයේ — මැතිවරණ කොට්ඨාශයේ — පැවැත්වූ රැස්වීමකදී ජනාධිපතිතුමා ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළා. නමුත් මේ නියෝජ්‍ය ඇමතිතුමා කියන්නේ පක්ෂ ක්‍රමය නැති වෙන්න ඕනෑ බවයි.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)
එය ඒ නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික මතයක් පමණයි.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
මම දන්නවා අක්මීමන මන්ත්‍රීතුමා දූන් 'අප්සට්'

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
හරි, හරි. ඒක පෞද්ගලික මතයක් බව පිළිගන්නවා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) 'අප්සට්' එකෙත් ඉන්නේ. ඒ මොකද හෙට — අනිද්ද යන්න සිදු වෙනවානේ. සමාවෙන්න, බද්දේගම මන්ත්‍රීතුමා නොවෙයි. එහෙම කීම ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා මට සමාවෙන්න ඕනෑ. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) 'අප්සට්' එකෙත් ඉන්නේ හෙට — අනිද්ද යන්න තිබෙන නිසා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ඒ බව මට තේරුණා තමුන්නාන්සේ කථා කරන විධියෙන්.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
මම කියන්නේ පෞද්ගලික මතයක්. [බාධා කිරීම්] මේ පක්ෂ ක්‍රමය නිසා තමයි මේ ඔක්කොම සිදු වෙලා තිබෙන්නේ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
මාක්ස්වාදීන් තියාගෙන වැඩක් නැහැනේ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
හෙට — අනිද්ද යන්න සිදු වෙයි කියා කලවාන ගරු මන්ත්‍රීතුමාටත් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. නමුත් එතුමා තඩුවෙන් දිණුවා. උසාවියේ අහන තඩු ගැන කථා නොකර ඉන්න තරමට හොඳයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
මට මතකයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා කලවාන ගරු මන්ත්‍රීතුමාට තව සුමානයයි තිබෙන්නේ කියා. ඒ අවස්ථාවේදී කලවාන ඡන්ද පෙත්සම විභාග වෙමින් තිබුණේ. එතුමා කියන අනාවැකි එකක්වත් හරි යන්නේ නැහැ.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
අනේ හොඳයි. ගරු මන්ත්‍රීතුමා එහෙම කියලවත් සැනසෙන්න. අපේ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා මම එද එහෙම කිව්වාය කියා. නමුත්—

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ඔව්, තමුන්නාන්සේ කිව්වා. මට ඒක හොඳට මතකයි.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
ඔව් මම එහෙම කිව්වා. ඒක ඇත්ත. මම එදත් කිව්වා මහරගම ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ආවෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසාය කියා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මම කියන්නේ නැහැ, ඒක එහෙම නොවෙයි කියා. මට කව්රුත් උදව් කළා. තමුන්නාන්සේ ඇවිත් ඉන්නේ තොන්ඩමන් මහත්මයාගෙන් උදවු අරන්

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
සිරිමාවොට මල් තියල වඳින්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Order, please ! ඔය පෞද්ගලික කරුණු ටිකක් අමතක කළොත් හොඳයි.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
තමුන්නාන්සේලා ගිහින් සමාව ගන්නා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,—



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තෙවිල් ප්‍රනාන්දු මහත්මයාගේ බෙල්ල කැපුවා. තොන්ඩමන් මහත්මයාට බයේ තෙවිල් ප්‍රනාන්දු මහත්මයාගේ බෙල්ල කැපුවා.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)**
(Mr. G. V. Punchinilame)

තමුන්නාන්සේට මේ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව සලසා දීම ගැන තමුන්නාන්සේ දූන් ගිහින් සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියට බෝධි පූජාවක් තියන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමනි, හෙට ඉල්ලා අස් වී එන්න කියන්න. මම රත්නපුරෙන් ඉල්ලා අස්වී එනවා, එතුමා එක්ක තරඟ කරන්නට. අභියෝගය පිළිගන්නවා නම් පිළිගන්න. පිළිඅරගෙන එන්න.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සෙ රත්නපුරෙන් ඉල්ලා අස් වෙලා බලන්න දිනන්න පුළුවන්ද බැරිද කියලා.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)**
(Mr. G. V. Punchinilame)

තමුන්නාන්සේ ඉල්ලා අස්වෙලා එන්න. මම කැමතියි, තමුන්නාන්සේ එක්ක තරඟ කරන්න.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අයවැය විවාදය.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)**
(Mr. G. V. Punchinilame)

මේ අයවැය හැම එකක්ම අයවැයට අනුකූලයි. ඒ අයගේ කෙරුම් ගැනයි අපේ කෙරුම් ගැනයි මේ කියන්නේ. අප අද උදම් අනනවා. අපි බොහොම ආඩම්බරයි අද.

නියෝජ්‍ය කථානායකතුමනි, අන්තිම දුගී දුප්පත් අයත් වාසය කරන ආසනයක් තමයි මින්නේරිය. ඒ සමහර ගෙවල්වලට ගියාම වහලෙ පොල් ඉරටු අස්සෙන් අහස පේනවා. තමුන්නාන්සේලාත් එහෙ ගිහින් හිටියා. මහරගම මන්ත්‍රීතුමාත් මට කීප වතාවකදීම එහෙදි හමුවුණා. ඒ ගෙවල් ඇතුළට ගියාම පොල් අතු අස්සෙන් අහස පේනවා. නමුත් මොකක්ද වුණේ ? පසුගිය අවුරුදු හත ඇතුළත ගරු ජනාධිපතිතුමාත් ගරු අගමැතිතුමාත් මේ ගරු මුදල් ඇමතිතුමාත් ඇතුළු මුළු ආණ්ඩුවම—මැති ඇමතිවරු ඔක්කොම— කර තිබෙන වැඩ කටයුතු අගය කරන මින්නේරියේ ජනතාව මේ රට තවත් ඉදිරියට ගෙන යන්නට එක්සත් ජාතික පක්ෂයට තවත් අවුරුදු පහක් දෙනවාය කිව්වා. ඒ අවුරුදු පහෙන් පසු නැවත වරක් රට එක්සත් ජාතික පක්ෂයට භාර දෙනවාය කියනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

මුළු ලංකාවේම නගර සභාවක් පැරදුනේ රත්නපුරේ පමණයි.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)**
(Mr. G. V. Punchinilame)

ඒකෙ ඉතිහාසය සමහර විට තමුන්නාන්සෙ දන්නෙ නැතිව ඇති. මම ඒක වුවමනා නම් මේ සභාවේදීත් කියන්නම් බය නැතිව. ඒක හොඳට මතක තියා ගන්න. තමුන්නාන්සේ එහෙම කියනවා නම් වහාම ඒ උදවියට අස්වෙලා එන්න කියන්න නැවත වරක් තරඟ කරන්නට. අපි දිනලා පෙන්වන්නම්. හැප්පෙන්න ආවොත් හැප්පෙන මිනිහෙක් මම. ඒක හොඳට මතක තියා ගන්න. තමුන්නාන්සේලාට කවදාවත් එන්න හම්බු වෙන්නෙ නැහැ. මහරගම වෙච්ච දේ තමයි එහෙත් වුණේ. මහරගම යන්නෙ නැහැ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අනික් පැත්තට හිටිය නම්. ඒ වාගේ දෙයක් තමයි එතැනත් වුණේ. [බාධා කිරීමක්]

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මම තමුන්නාන්සේලාට ඕනෑ කරන උත්තර දෙන කෙනෙක් නොවෙයි.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
**(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)**
(Mr. G. V Punchinilame)

තමුන්නාන්සේ ගැන මම මොකුත් කියන්නේ නැහැ. මම ආදර්ශයට ඒක කිව්වේ. එහෙ වෙච්ච දේ තමයි රත්නපුරෙත් වුනේ

නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම සාර්ථක ලෙස මේ වාරයේදීත් අයවැය ලේඛනය ඉදිරිපත් කර ගරු මුදල් ඇමතිතුමා 1977 ට පෙර අවුරුදු 7 ක් ඇතුලත තිබුණු දුර්දන්ත යුගය නැති කර තිබෙනවා. අද ඒක අමතක වී තිබෙනවා. ලොකු මිනිස්සුන්ටත් පුංචි මිනිස්සුන්ටත් ඔක්කෝටම අද ඒක අමතක වී තිබෙනවා. එදා තිබුණු දුර්දන්ත යුගය අඳුරු යුගය කන්න බොන්න නැති යුගය අඳින්නට නැති යුගය සාමය නැති යුගය ඒ කාලකණ්ණි යුගය අමතක කර උතුරේ ත්‍රස්තවාදය ගැන සඳහන් කරමින් " අද මෙහෙම නැහැ, අරහෙම නැහැ " කියනවා. ඒක පැත්තක තියමු.

ත්‍රස්තවාදය නැත කියා අපි කියන්නේ නැහැ. යම් විධියකින් ඒ ප්‍රදේශවල ත්‍රස්තවාදය නොතිබුණා නම් තවත් කොයි තරම් මුදල් සම්භාරයක් අපට මේ රටේ සංවර්ධනයට යොදවන්න තිබුණාද ? ත්‍රස්තවාදය මර්දනය කරන්නට හමුදාව සීරුවෙන් තබන්නට දිනකට රුපියල් ලක්ෂ 25 ක් වියදම් වෙනවා නම් පසුගිය අවුරුදු එකහමාර තුළ වියදම් කළ ඒ මුදලුත් තිබුණා නම් අපට මොන තරම් වැඩ කරන්න තිබුණාද ? ගෙවල් කී ලක්ෂයක් හදන්නට තිබුණාද ? වැව් අමුණු කීයක් හදන්නට තිබුණාද ? තව කොපමණ අලුත් ව්‍යාපාර පටන් ගන්නට තිබුණාද ? තව කොපමණ රක්ෂා දෙන්නට තිබුණාද ? මේවා ගැන මුළු රටම හිතන්නට ඕනෑ. මේවා ගැන හිතල විසඳුමක් සොයන්නට තමයි අපේ ජනාධිපතිතුමා සාම සාකච්ඡාව වට මේස සාකච්ඡාව ආරම්භ කළේ. කෝ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒකට එන්නෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැමති නැහැ ඒකට. රටේ සාමයට ජාතීන් අතර සාමයට මහා ජාතිය හා සුළු ජාතීන් එකතු කරනවාට ඒ අය කැමති නැහැ. මේ භේදය තිබෙනවාටයි ඒ අය කැමති. ඒකෙන් අපට පෙනෙනවා ඒ අය තුළ ජාතිය වෙනුවෙන් රට වෙනුවෙන් කැක්කුමක් නැති බව. ඒ අයට උවමනා කරන්නේ තමන්ගේ වාදය රැක ගැනීමටයි. සාමය ඇති කිරීමට විසඳුමක් සෙවීම සඳහා අද මේ ගෙන යන මහා ව්‍යාපාරයට මේ මහා සටනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකතු වුණොත් මුළු රටේම ජනතාව ඒ අයට ප්‍රශංසා කරනවා ඇති. අපි මේ තරම් කියන්නේ ඒකේ තිබෙන වැදගත්කම නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ජනතාවට බර පටවන්නේ නැතිව සංවර්ධනය සඳහා මේ වාරයේදීත් මේ තරම් මුදලක් වෙන් කර අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන අපි මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. රට කරවන අයට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. මේ විධියට අයවැය ලේඛන ඉදිරිපත් කර අපේ ගරු මුදල් ඇමතිතුමා දැන් අවුරුදු හතක් තිස්සේ ඉතාම සාර්ථකව වැඩ කර තිබෙනවා. පසුගිය අයවැය ලේඛනයෙනුත් සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ, කම්කරුවන්ගේ පඩි වැඩි කළා. ඒ විධියට මේ රජය කී වතාවක් පඩි වැඩි කර තිබෙනවාද ? පසුගිය රජය කාලයේදී සාමාන්‍ය කම්කරුවකුගේ දවසක පඩිය රු. 5 යි. ඒකාලයේ වැඩිම පඩිය වුණේ රු.7.50 යි. නමුත් අද කීයක් ලැබෙනවාද ?

අද වතු කම්කරුවකුට දවසකට රු.28 ක් ලැබෙනවා. මාසය අන්තිම වන විට වතු කම්කරුවකුට සාමාන්‍යයෙන් රු.1,500 ක් නැත්නම් 2,000 ක් පමණ ලැබෙනවා. පවුලක හතර දෙනෙක් වැඩ කළොත් මාසය අන්තිමට ඒ අයට කොයි තරම් මුදලක් ලැබෙනවාදැයි තමුන්නාන්සේලාට හිතා ගන්න පුළුවනි. එම නිසා ඒ අය අද හොඳට කාලා-බීලා-ඇඳලා ඉන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාගේම අද අනෙක් ක්ෂේත්‍රවල වැඩ කරන කම්කරුවන්ගේත් පඩි වැඩි වී තිබෙනවා. පසුගිය අවුරුද්දේදීත් රජයේ සේවකයන්ගේ පඩි වැඩි කළා. මේ අයවැය ලේඛනයෙනුත් රු.100 ක් පඩි වැඩි කර තිබෙනවා. ඒ වුණත් ඒ ගැනත් විරුද්ධ පාර්ශවයෙන් නොයෙකුත් විවේචන ඉදිරිපත් වුණා. ජනතාවට මොන විධියේ සහන දුන්නත් විරුද්ධ පාර්ශවයේ උදවියගෙන් ඒ විධියේ විවේචන බලාපොරොත්තු වීම සාධාරණයි. එක අතකින් බලන කොට සම්ප්‍රදායය අනුව විරුද්ධවීම ඒ උදවියගේ යුතුකමක්. එම නිසා රජය මොන තරම් හොඳ දෙයක් කළත් ඒ අය ඒකට " හොඳයි " කියන්නේ නැහැ.

මුළු ලංකාව පුරාම හදිසි නීතිය ක්‍රියාත්මක වුණු අවස්ථාවේදී ඒ අය කීවා, උතුරු-නැගෙනහිරට පමණක් හදිසි නීතිය සීමා කරලා අනෙක් පැතිවලින් හදිසි නීතිය සම්පූර්ණයෙන්ම අයින් කරන්න කියා. ඒ විධියට අනෙක් ප්‍රදේශවලින් හදිසි නීතිය ඉවත් කිරීම නිසා ඒ ප්‍රදේශවල මොනවා හෝ කලබලයක් වුණොත් අහනවා, " ඇයි, එහෙම වුණේ ?" කියා. ඒ අයට නම් හදිසි නීතිය තිබුණත් වැරදියි, නොතිබුණත් වැරදියි. ඒ විධියට විරුද්ධ පාර්ශවයේ උදවිය රජයෙන් කෙරෙන හැම වැඩක් ගැනම බලන්නේ විවේචනාත්මක ඇහෙනුයි. ඒ විවේචන මොනවා වුණත් ගරු මුදල් ඇමතිතුමා මෙවර අයවැය ලේඛනයෙනුත් සියලුම අංශවලට සැහෙන ප්‍රමාණයක සහන සලසා තිබෙනවා.

ගරු මුදල් ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතු සංස්ථා තිබෙනවා. ඇතැම් සංස්ථා සැහෙන මුදල් ප්‍රමාණයක් උපයනවා. ඒ අතර තවත් සමහර සංස්ථා තිබෙනවා, ගරා වැටෙන තත්ත්වයෙන්. මම හිතන හැටියට නම් ඒ සංස්ථා වහල දමන්න ඕනෑ. ඒ හේතුවෙන් සැහෙන සේවක සංඛ්‍යාවක් අයින් කරන්න සිද්ධ වෙයි. නමුත් රටට, ජාතියට තිබෙන ආදරය නිසා ඒක කළ යුතුයි. අයවැය යෝජනා තුළින් ගරු මුදල් ඇමතිතුමා එවැනි සංස්ථා ගැන ගන්නා පියවර සම්බන්ධයෙන් ස්ථිරව යමක් කියා නැහැ. නමුත් ඇත්ත වශයෙන්ම ජාතියට පිළිළයක් වී තිබෙන, ගරා වැටෙමින් පවතින සංස්ථා ගැන පිළියමක් යොදන්න ඕනෑ. මුදල් ඇමතිතුමා ඒ සංස්ථාවලට රුපියල් කෝටි ප්‍රකෝටි ගණනින් මුදල් දෙනවා. ඒ විධියට කොපමණ මුදල් දුන්නත් ඒවා විනාශ වෙනවා. ඒ නිසා ඒ වගේ සංස්ථා වසා දමන්න ඕනෑ. ඒවායේ සේවය කරන කම්කරුවන්ට, සේවකයන්ට සැහෙන වන්දි මුදල් දීලා ඒවා වහල දැම්මොත් ඒ හේතුවෙන් අනාගතයේදී මේ රටට වාසියක් වෙනවා ; මේ රටේ ජනතාවට වාසියක් වෙනවා. ඒ නිසා ඒ ගැන ගරු මුදල් ඇමතිතුමා, ඉදිරියේදී පියවරක් ගන්නවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

සමහර සංස්ථා ඇති කළේ ඉතාමත් හොඳ අදහසිනුයි ; හොඳ චේතනාවෙනුයි. නමුත් ඒ බලාපොරොත්තු අද ඉෂ්ට වී නැහැ. එදා මැණික් සංස්ථාව ඇති කළේ මැණික් ව්‍යාපාරයේ යෙදී ඉන්න ජනතාවට සැහෙන සහනයක් ලබා දීමේත්, විදේශ විනිමය අතින් රටට සැහෙන වාසියක් ලබා ගැනීමේත් අදහසිනුයි. නමුත් අද මැණික් සංස්ථාව ගෙන යන්නේ රුපියල් කෝටි ගණන් පාඩුවට බව අපට පෙනෙනවා. ඒ සංස්ථාව දැනට තිබෙන තත්ත්වයෙන් තවදුරටත් ගෙන යන්න පුළුවන්ද කියා මුදල් ඇමතිතුමා කල්පනා කරන්න ඕනෑ. ඒ අතර එය ඉදිරියට ගෙන යා යුතු ක්‍රමයක් ගැනත් එතුමා හිතා බලන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

**அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண்ட் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.**

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

නියෝජ්‍ය සභාපතිතුමනි, මැණික් සංස්ථාව වටිනා සංස්ථාවක්. මම කලිනුත් කිව්වා වාගේ එවකට හිටපු මුදල් ඇමති ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා මේ සංස්ථාව පිහිටෙව්වේ මැණික් ව්‍යාපාරයේ යෙදී ඉන්න ජනතාවට සැහෙන වාසි සලසා දීමේ අධිෂ්ඨානයෙනුයි. නමුත් අද අපට පෙනෙන හැටියට නම් මැණික් ගරන්නනුත්, ඔප දමන අයත්, අපනයනය කරන උදවියත් අමාරු තත්ත්වයකට වැටී තිබෙනවා. මැණික් ව්‍යාපාරයේ නොයෙකුත් වංචා සිදු වන බව ගරු මුදල් ඇමතිතුමා දන්නවා ඇති.

ඒ විධියේ වංචාවත් සිදු වුණත් පසුගිය කාල සීමාව තුළ එතෙක් අප අඳුනාගෙන නොසිටි—වටිනාකම තේරුම් නොගත්—මැණික් ගල් ගැන අවබෝධයක් දැන් අපට තිබෙනවා. උදාහරණයක් හැටියට ගෙවුඩ සඳහන් කරන්න පුළුවනි. ගෙවුඩ කියන මැණික් ගල ගැන එදා වැඩි ඇදිහීමක්, තැකීමක් තිබුණේ නැහැ. ඒ කාලයේ ගෙවුඩ මැණික් ගලක් හම්බ වුණාම අපි එය අහක විසි කරනවා. නමුත් අද සාමාන්‍යයෙන් කැරට් සියයක පමණ ගෙවුඩයක් හමුවුණොත් එය රුපියල් ලක්ෂ දහයක් පමණ වටිනවා. කැරට් එකක් රුපියල් දහදහක් පමණ වටිනවා. ඒ ගෙවුඩ මැණික නිල් මැණිකක් හෝ රතු මැණිකක් හෝ කහ මැණිකක් කිරීමට පුළුස්සන ක්‍රමය අපේ රටේ ජනතාව දැනගෙන සිටියෙ නැහැ. තායිලන්තයෙන් පැමිණි උදවියයි මේ ගැන විශාරද දැනුමක් ලබා සිටියෙ. ඔවුන් මෙරටට පැමිණ ඒවා අරගෙන ගියා. ඒවායේ නියම තත්ත්වය, නියම වටිනාකම මැණික් සංස්ථාව නොදැන සිටි නිසා වැඩි ප්‍රයෝජන ලබාගත්තෙ තායි උදවියයි. මැණික් සංස්ථාව ඒවායේ වටිනාකම දැනගත්තෙ හුඟාක් පසුවෙලයි. නමුත් දැන් හිටි අඩියේම ගෙවුඩ ව්‍යාපාරය ඇණ හිටින තත්ත්වයකට පත්ව තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මේ ගැන අවධානය යොමු කරන්නට ඕනෑ. අපේ පළාත්වල පමණක් නොවෙයි, යාපනය අර්ධද්වීපය හැරුණාම මුළු ලංකාවේම දශ ලක්ෂ ගණනක් මේ මැණික් ව්‍යාපාරයේ යෙදී සිටිනවා. සෑම ආසනයකම රජයෙන් රක්ෂාවල් ඉල්ලන්නේ නැති ගමේ උදවිය, උගත් අයත් නූගත් අයත් සැහෙන පිරිසක් මේ ව්‍යාපාරයේ යෙදී සිටිනවා. සැහෙන පිරිසක් එමගින් යැපෙනවා. මේ කොළඹ දිස්ත්‍රික්කයේ පවා ලක්ෂයකට වැඩි පිරිසක් මැණික් ව්‍යාපාරයේ යෙදී සිටිනවා.

ගෙවුඩ සම්බන්ධ ප්‍රශ්නයට පිළියමක් යොදන්නේ නැතුව ගෙවුඩ මිලදී ගන්නට පැමිණි උදවිය වැලැක්වීම නිසා එකවරම ආර්ථිකයට ලොකු පහරක් වැදී තිබෙනවා. මම දන්නෙ නැහැ, ඒ පහර රටේ ආර්ථිකයට වැදුණාද කියා. නමුත් සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකයට නම් පහර වැදී තිබෙනවා. සමහර විට රජයේ ආර්ථිකයට කෙළින්ම පහරක් නොවැදුණත් මැණික් ව්‍යාපාරයේ යෙදුණු සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකයට නම් කෙළින්ම පහර වැදී තිබෙනවා. ඒ වරද සිදුවී තිබෙන්නේ මැණික් සංස්ථාව නිසයි. මැණික් සංස්ථාව ගෙවුඩය හඳුනාගත්තේ නැහැ. ඒවා පුළුස්සන ක්‍රමය දැනගත්තෙ නැහැ. ඒවා පිළිස්සීමට වුවමනා කරන උපකරණ ගෙන්වා ගත්තෙ නැහැ. ඒ සඳහා සුදුසු අය පිටරට යවා පුහුණු කරවාගත්තෙ නැහැ. මැණික් සංස්ථාවේ ඒ වැරදිවලට මේ රටේ ජනතාවට දුක් විඳින්නට සැලැස්වීම වැරදියි. ඒ නිසා ජනතාව දුක් විඳිනවා නම්, ඒ ගැන අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන්නට ඕනෑ. ගරු මුදල් ඇමතිතුමනි, තමුන්නාන්සේ මේ ගැන අවධානය යොමු කර, මේ ගෙවුඩ මැණික් ගල් මැණික් සංස්ථාවට ගන්නෙ නැත්නම්, ඒවා සොයාගෙන පිටරටින් මෙරටට එන වෙළඳුන්ට—රුපියල් ලක්ෂයක වුවත් කමක් නැහැ—බද්දක් නියම කර හෝ ලයිසන් ක්‍රමයක් ඇතිකර හෝ ඒ අයට මෙරටට එන්නට අවසර දෙන්න ඕනෑ. එසේ අවශ්‍ය අවසරය දී, ඒ රටේ මුදල්, ඒ රටේම බැංකුවල තැන්පත් කර මෙරටට ඇවිත් හෝ නියම මාර්ගවලින් ඒ ගල් ගෙන යන්නට කටයුතු සලසා දෙන්නට ඕනෑ. දැනට සිදුවී තිබෙන්නේ කුමක්ද ? එකවරටම මැණික් සංස්ථාවෙන් එනවා, ඇවිත් පනිනවා, පැතලා හොඳ නරක මොකුත් බලන්නෙ නැහැ, ඔක්කොම පොදි ගහගෙන ගිහින් ඒවා සීල් තබනවා. මේ අන්දමට මැණික් ගන්නට එන මිනිසුන් වැලැක්වූවාම ගමේ මැණික් නිෂ්පාදකයාට විශාල පාඩුවක් වෙනවා. ගරු මුදල් ඇමතිතුමා මේ ගැන අවධානය යොමුකොට කාරක සභා අවස්ථාවේ දී මේ ගැන සහනදායක පිළිතුරක් දෙන්නය කියා මැණික් ගරන උදවිය වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.

ඊට අමතරව, තමුන්නාන්සේ දන්නවා අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන්නේ කර්මාන්තශාලා දෙකක් පමණක් බව. එකක් බලන්ගොඩ පිඟන් කර්මාන්තශාලාව, අනෙක, ඇඹිලිපිටියේ කඩදාසි කර්මාන්ත ශාලාව. ඒ දෙක හැරුණුවිට වෙන කිසිම කර්මාන්තයක් රත්නපුරේ දිස්ත්‍රික්කයේ නැහැ. රත්නපුර දිස්ත්‍රික්කයේ අමු ද්‍රව්‍ය ඕනෑ තරම් තිබෙනවා. තේ, රබර් ඕනෑ තරම් තිබෙනවා. නමුත් රැකියාවන් සපයන්නට පුළුවන් තරම් කර්මාන්ත ශාලා එකක්වත් නැහැ. එරත්න කියන ගමේ දවසකට තේ කිලෝ ග්‍රෑම් 20,000 ක් පමණ නිෂ්පාදනය කරනවා. ඒ සියල්ලක්ම මිලදී ගන්නෙ පෞද්ගලික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. වී. පුංචිනිලමේ මහතා]

වෙලෙන්දනුයි. එනිසා ඔවුන්ට රජයෙන් ගෙවන නියමිත මිල නොවෙයි ලැබෙන්නෙ. එයින් ඒ ප්‍රදේශයේ දුප්පත් ජනතාවට විශාල පාඩුවක් වෙනවා. මම මේ එක තැනක් ගැන පමණයි කියන්නෙ.

එම්. හලීම් ඉෂාක් මහතා
(ජනාப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

මැණික්වල මිල දැන් කොහොමද ?

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

මම දන්නේ නැහැ. මොකද, මම දැන් මැණික් වෙළඳාම කරන්නෙ නැහැ. කලින් මම ඒක කළා. නමුත් පාර්ලිමේන්තුවට ආවාට පසුව මම ඒක නැවැත්තුවා. මට දැන් ඕනෑ තරම් සල්ලි තිබෙනවා. එතුමා මේක හොරෙන්වත් කරනවාදැයි මම දන්නේ නැහැ. [බාධා කිරීමක්] කොහොම වුනත් කමක් නැහැ. මම එහෙම කිව්වෙ විහිළුවට. ද්වේශ සහගතව කිව්වෙ නැහැ, විහිළුවට විහිළුවක් කළා මිසක්.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඕනෑ තරම් සල්ලි තිබෙනවා නම්, අපේ අයවැයටත් ටිකක් දුන්නොත් හොඳයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

ගරු මුදල් ඇමතිතුමා, මමත් හිතනවා ඒ යෝජනාව බොහොම හොඳයි කියා.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

ගරු සභාපතිතුමනි, මා කලින් කී කර්මාන්ත ශාලා දෙක හැරුණාම අපේ පළාතේ වෙන කිසිම කර්මාන්ත ශාලාවක් නැහැ. එරත්න කියන පළාතේ කර්මාන්ත ශාලාවක තේ කිලෝ ග්‍රෑම් විසි දහක් දවසකට නිෂ්පාදනය කරනවා. ඒ තේ කිලෝ ග්‍රෑම් විසි දහම යන්නේ පෞද්ගලික ව්‍යාපාරිකයන් අතටයි. ඒ උදවියගෙන් ප්‍රදේශයේ සුළු තේ වතු හිමියන්ට හරියට මුදල් ලැබෙන්නේ නැහැ. එයින් විශාල අසහනයකට තේ නිෂ්පාදනය කරන තේ අක්කර දෙක තුන තිබෙන සුළු තේ වතු හිමියන් පත්වෙලා තිබෙනවා. ඒ ගැනත් තමුන්නාන්සේගේ අයවැය වාර්තාවෙන් සහනයක් සලසා දී ඇති බව කියැවුණා.

රැකිරක්ෂා විරහිත ජනතාව වැඩි වශයෙන් සිටින පළාත්වල ජනතාවට රක්ෂා ලබා දීමට හැකිවන පරිදි අළුත් අළුත් කර්මාන්ත මධ්‍යස්ථාන ආරම්භ කරන්නන්ට විශේෂ සහන සලසා දෙන්නට යනවාය කියලත් සඳහන් වුණා. ඒ අනුව තමුන්නාන්සේ නියෝජනය කරන බුලත්සිංහල ආසනයේත් විශාල සමාගම් කිහිපයක් ඇති කරන්නට යනවාය කියලා මට දැනගන්නට ලැබුණා. මම බොහොම සන්තෝෂ වෙනවා. රක්ෂා විරහිතයන් වඩා ඉන්නේ ඒ පළාතේ—දකුණු පළාතේ—යයි අපට දැනගන්නට ලැබුණා. ඒ සමඟම මම මේක කියන්නට ඕනෑ. මගේ කොට්ඨාශයේ රක්ෂා විරහිතයන් නැති බව පෙනෙන්නේ මැණික් කර්මාන්තය තිබෙන නිසයි. යාපනේ අර්ධද්වීපය හැරුණුවිට මුළු ලංකාවේ අනෙක් හැම තැනම වාගේ මේ මැණික් කර්මාන්තය කෙරෙනවා. තමුන්නාන්සේගේ ආසනයේත් කෙරෙනවා. ලංකාවේ කොතැනක කෙරුණත් ඒවා කෙරෙන බව ඔප මට්ටම්වෙලා පෙනෙන්නේ නැහැ. මැණික් කර්මාන්තය ලංකාවේ කොහේ කේරුණත්—මොනව වුණත්—මැණික් සම්බන්ධව මොනවා හරි අවශ්‍යතාවයක් වෙනවා නම් " රත්නපුරයට ගිහිල්ලා අසවලා හම්බවෙන්න සල්ලි ගන්නට පුළුවන් " ය කියනවා. " රත්නපුරය " කියන නමයි යන්නේ. අපේ පළාතේ ඉන්නේ ආණ්ඩුවෙන් රක්ෂා නොඉල්ලන මැණික් ව්‍යාපාරිකයෝයි. ඒ මැණික් ව්‍යාපාරිකයන්ටත් අද සැහෙන දුරට පහර වැදී තිබෙනවා. ඒ පහර වැදී තිබෙන්නේ රාජ්‍ය මැණික් සංස්ථාව හරියට මේ කටයුත්ත නොකරන නිසයි. වෙන මොනම හේතුවක්වත් නිසා නොවෙයි. ඒවාගේම මැණික් කර්මාන්තයේ යෙදී සිටින හැම දෙනෙකුටම රාජ්‍ය මැණික් සංස්ථාවෙන් හිරිහැර තිබෙනවා. හරියට හිරිහැර තිබෙනවා. කුමක් වුවත් ගරු මුදල් ඇමතිතුමනි, මේ කාරණය කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ.

ඒවාගේම මම හිතන විධියට සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය තමයි මොනම ව්‍යාපාරයකටවත්, ආධාර ක්‍රමයකටවත් අහුවෙලා නැත්තේ. මේ ඊයේ පෙරේද සිට තමයි, ආසියානු සංවර්ධන බැංකුවෙන් සුළු මුදල් ප්‍රමාණයක්වත් ලැබෙන්නේ. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවටත් අපේ ප්‍රදේශ අහුවෙලා නැහැ. මේ ඊයේ පෙරේද සිට තමයි, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයට අපේ කොට්ඨාශ ඇතුළත්වෙලා තිබෙන්නේ. ගරු මුදල් ඇමතිතුමනි, එයින්වත් අපේ කොට්ඨාශවලට තවම හරියට සහනයක් ලැබිලා නැහැ. අපේ ආසන අට ඇතුළත බොහොම සුළු ප්‍රමාණයකට තමයි සහන ලැබිලා තිබෙන්නේ. වතුර පිපාසයෙන් සිටින මිනිසුන් 10 දෙනෙකුට එක වතුර කෝප්පයක් දුන්නාවගේ තමයි දීලා තිබෙන්නේ. එමනිසා ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ. ඔය පිහිටුවන්නට යන කර්මාන්තශාලාවලින් අඩු ගණනේ එක තේ කර්මාන්ත ශාලාවක්වත් එරත්න පළාතේ ඇති කරන්න අවශ්‍ය දැනුම්දීම් කිරීමට තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ. තමුන්නාන්සේගේ අවධානය යොමු කළොත් එය කෙරෙන බවත් මට කියන්නට පුළුවන්.

දැන් මම මෙතෙක් වේලා කථා කළේ සැහෙන ප්‍රමාණයක් තමුන්නාන්සේගේ මෙම අයවැය ලේඛනයේ ඇති හොඳ යෝජනාවන් ගැනයි. ඒවාගේම මගේ පෞද්ගලික හැඟීමේ හැටියට එහි ඇති සුළු නරක දෙයකුත් පෙන්වන්නට ඕනෑ. ඒ පොහොර ප්‍රශ්නය පිළිබඳවයි. පොහොර ප්‍රශ්නය පිළිබඳව තමුන්නාන්සේ ඊයේ ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී ගරු මිත්‍රයා මන්ත්‍රීතුමාට (එස්. බී. විජේකෝන් මහතාට) පැහැදිලි කිරීමක් කළා. නමුත් මගේ නම් සැකයක් තිබෙන්නේ පොහොර මිල වැඩිවේවි කියලයි. තමුන්නාන්සේ කියනවානම් පොහොර මිල වැඩි වෙන්නෙ නැහැ කියලා අපිට ඒක විශ්වාස කරන්න පුළුවන්. තමුන්නාන්සේ කිව්වා මොන හේතුවකින් හරි පිට රටින් එහෙම – නිෂ්පාදනය කරන තැනින් – පොහොර මිල වැඩි වුණොත් තමුන්නාන්සේට වළක්වන්න බැහැ කියලා. ඒ වුණත් තමුන්නාන්සේ ඉතාමත් දක්ෂයෙක්. තමුන්නාන්සේ අද ලංකාවට පමණක් නොව මුළු ලෝකයටම ඒ බව ඔප්පු කර තිබෙනවා. මම හිතන විධියට අට වතාවක් එක දිගටම අයවැය වාර්තා ඉදිරිපත් කළ මුළු ලෝකයේම ඉන්න පළමුවන මුදල් ඇමතිතුමා තමුන්නාන්සේ යි. තමුන්නාන්සේ ඒ විධියට දක්ෂතා ඔප්පු කර තිබෙනවා. පිටරට පොහොර නිෂ්පාදනය කරන තැනින් හරි පොහොර මිල වැඩිවෙනවා නම් එය ගොවි ජනතාවට බාධාවක් වෙනවා.

ලංකාවේ වැඩි හරියක් ඉන්නේ—සියයට අසූවක් පමණ ඉන්නේ—ගොවියෝ යි. වැඩි හරියක් ගම්බද ගොවියෝයි. ගොවියාගේ ශක්තිය තමයි අපේ ජාතියේ ශක්තිය. ගරු සභාපතිතුමනි, ලබන අවුරුද්දේ ඉඳලා එක හාල් ඇටයක්වත් පිටරටින් ලංකාවට ගෙන්වන්නේ නැහැ. එහි සම්පූර්ණ උපහාරය යා යුත්තේ මේ රටේ අහිංසක ගොවි ජනතාවටයි. ඔවුන් සැහෙන්න මහන්සි වෙනවා. මොන දුකක් විඳගෙන හරි මහන්සිවෙලා මුළු ජාතියේම බඩ පිරෙන්නට—ජාති කුල මල ආගම් භේද මොකුත් හොයන්නේ නැතිව—හැමදෙනාටම කන්නට වී ටික දෙනවා. එසේනම් එවන් ගොවියා අපි රකින්නට ඕනෑ. බැරිවෙලා වත් පිටරට නිෂ්පාදනය කරන තැනකින් හරි පොහොර මිල වැඩි වුණොත් අපි යන මේ ඉලක්කයට යන්නට බැරි වෙනවා. එම නිසා මේ යාමට බලාපොරොත්තු වන ඉලක්කය ගැන තමුන්නාන්සේ හැමවෙලාවේම අවධාරණයෙන් හිතේ තියාගන්නට ඕනෑ.

අපි මහවැලි යෝජනා ක්‍රමය පටන් ගන්නා අවස්ථාවේ එවකට පැවති අයවැය විවාදයේදී ගරු මුදල් ඇමතිතුමා කියා සිටියා මුදල් ඕනෑ තරම් තිබෙනවාය, ඒවා වියදම් කර වැඩ කරන්නට මිනිස්සුයි අපට නැත්තේ කියා. අපි කොහොමහරි අපේ රටෙන්ම මිනිස්සු සොයා ගත්තා. මදි හරිය පිටරටින්ම ගෙන්වා ගෙන හෝ අද මහවැලිය සාර්ථකව ඉදිරියට ගෙන යනවා. එහි ප්‍රයෝජනය ලැබෙන්නෙත් මේ රටේ සිටින සියයට 80 ක් පමණ වූ ගොවි ජනතාවටයි. ඒ ගොවින් ධෛර්ය කිරීම කරන්න සිදු වී තිබෙන්නෙත් අපටයි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේත් මමත් කලින් සඳහන් කළ අන්දමට නිෂ්පාදන මිල වැඩිවීමක් නිසා හෝ බැරිවෙලාවත් පොහොර මිල වැඩි වුණොත් ගොවියා අධෛර්යමත් වෙනවා. ඒ නිසා නිෂ්පාදනයේදී මිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩිවීමක් වුණත් සහනදයක මිළකට පොහොර ටික නොදුන්නොත් වී නිෂ්පාදනය අඩු වෙන්නට පුළුවන්. එහෙම වුණොත් අපේ ඉලක්කය කරා යන්නට අපට බැරි වෙනවා.එහෙම වුණොත් නැවතත් පිට රටින් හාල් ගෙන්වන්නට සිදු වේවි. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ ඉදිරිපත් කර තිබෙන අයවැය යෝජනා නිසා මේ රටේ ඉතා සුළු පිරිසකට ටිකක් අමාරුයි. අපි එය නැහැයි කියන්නේ නැහැ. නමුත් වැඩි දෙනාට සහන සලසා තිබෙනවා. විශේෂයෙන් කම්කරුවන්ට රජයේ සේවකයින්ට හා වැටුප් ලබන වෙනත් ක්ෂේත්‍රවල සිටින අයටත් මේ අයවැයෙන් සහන සැලසෙනවා. එමෙන්ම මේ අයවැයෙන් සලසා තිබෙන වාසි පෞද්ගලික අංශයේ වැඩ කරන අයටත් ලබා දෙන්නට පෞද්ගලික අංශයත් කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මේ රටේ ජනතාවට රැකියා ලබා දෙන්නට පෞද්ගලික අංශයත් සැහෙන්න වෙහෙස මහන්සි වුණා. අපි ඇත්ත කියන්න ඕනෑ. එමෙන්ම ඒ සඳහා අවස්ථාවන් ඇති කර ගැනීමට අපේ ආණ්ඩුවේ අයවැය ලේඛන මඟින් පෞද්ගලික අංශයට සැහෙන සහනත් ලබා දුන්නා. ඒ නිසා ඒ හැම කෙනෙකුගේම ස්තුතිය අපේ ගරු මුදල් ඇමතිතුමාට ලැබිය යුතුයි. එමෙන්ම මේ රට පාලනය කරන මේ රටේ සියලු දෙනාගේම ජනනායක ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාත් කල්පනාකාරීව මේ කටයුතු කර ගෙන යනවා. විරුද්ධ පාර්ශ්වයේ හැම දෙනාම වගේත් අපට සහයෝගය දුන්නා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වටමේස සාකච්ඡාවට පැමිණ ත්‍රස්තවාදය මර්දනය කරන්නට රජයට සහයෝගය නොදීම ගැන අපි කණගාටු වෙනවා.

අද අපට සිටින ඉතාමත්ම බලවත්ම හතුරා උතුරේ සිටින මේ ජාතිද්‍රෝහී දේශද්‍රෝහී කොටි හා දකුණේ සිටින—කොටි හෝ වේවා ත්‍රස්තවාදීන් හෝ වේවා මොකා හෝ වේවා—ජාතිද්‍රෝහී පිරිසයි. ඒ අය මේ රටේ ජනතාව භුක්තිවිඳින නිදහස විනාශ කරන්නට, මේ වාසි විනාශ කරන්නට, අපේ වැව් අමුණු කඩන්නට, අපේ වස්තුව විනාශ කරන්නට, කටයුතු කරනවා. මේ ඊයේ පෙරේද පිදුරුතලාගල කන්ද මුදුනට නැඟ හැතැප්ම 4ක් පමණ පයින් බඩගා බෝම්බ 4ක් සවි කළා. ඒ ජාතිද්‍රෝහී දේශද්‍රෝහීන් ඒ වැය කළ ශ්‍රමයෙන් කුඹුරු අක්කර 1/4 ක් වැඩ කළා නම් නරකද ? රාත්‍රියේ හීතලේ ගැහි ගැහී රට විනාශ කරන්නට හැතැප්ම 4 ක පමණ කන්දක් නඟින්නට ඔවුන්ට පුළුවන්. නමුත් තමන්ගේ රට වෙනුවෙන් තමන්ගේ ජාතිය වෙනුවෙන් තමන්ගේ මිනිසුන් වෙනුවෙන් කුඹුරු අක්කර 1/4 ක් වැඩ කරන්නට මහන්සි වෙන්නේ නැහැ. ත්‍රස්තවාදියා කියන එකා හිතන්නේ ඒ විධියටයි. ඔවුන් තිරිසනුන් හැටියටයි, අපි සලකන්නේ. ඔවුන් ක්‍රියා කරන්නේත් ඒ විධියටයි. පාසල් ළමුන් යන බස්වල බෝම්බ තබා තිබුණා. [බාධා කිරීමක්] විරුද්ධ පාර්ශ්වයේ සමහර අය හිනා වෙනවා. ඒ අයට මෙය සෙල්ලමක්. ඒ අයට ඕනෑ මොන ක්‍රමයකින් හෝ ආණ්ඩුව වට්ටලා ආණ්ඩුවක් පිහිටුවන්නට ඒ අයට පුළුවන්ද කියා බලන්නයි. කවුරු ආණ්ඩු පිහිටෙව්වත් ත්‍රස්තවාදය තිබුණොත් ත්‍රස්තවාදීන් ඒ අන්දමටම ක්‍රියාත්මක වෙනවා. ඔවුන් කරන්නේ මේ අන්දමේ විනාශකාරී ක්‍රියාමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මේ අයවැය විවාදයේදී අපි ඉල්ලා සිටින්නේ මෙයයි. මේ ඉදිරිපත් කර තිබෙන අයවැයෙන් වාසි ලබන්නට නම් මුළු ජාතියම නැත්නම් මුළු රටම ඒකාබද්ධ වෙන්නට ඕනෑ. පක්ෂ සියල්ලම එක්කාසු වෙන්නට ඕනෑ. අද සැහෙන ප්‍රමාණයක් එසේ එක්කාසු වී සිටීම ගැන අපි සන්තෝෂ වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්කාසු වෙන්නට ඕනෑ [බාධා කිරීමක්] මේ තත්ත්වය ලබා ගන්නයි, එක්කාසු වෙන්නට කියන්නේ. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) තේරුම් ගන්නේ නැතේ. සමහර විට තමුන්නාන්සේත් අවසාන ගමන යන්නේ පක්ෂ තිබුණොත් එක්සත් ජාතික පක්ෂයේ අපිත් සමඟයි. එසේ නැතිව ඔක්කොම එක පක්ෂයක් හැටියට එක් වී ආණ්ඩුවක් පිහිටෙව්වොත් තමුන්නාන්සේටත් එහි තනතුරක් ගන්නට වාසනාව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

අද මේ ඉදිරිපත් කර තිබෙන අයවැය යෝජනා මේ අවුරුද්ද තුළ ක්‍රියාත්මක කරන්නට රටේ සාමය සමාදනය හා සදාචාරය තිබිය යුතුයයි අයවැය කථාවේදී අපේ ගරු මුදල් ඇමතිතුමාගෙන් කියැවුණා. එහෙම නොවුණොත් "Just forget it" කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කී බව මට මතකයි. ඒ තරම් භයානක තත්ත්වයක් තිබෙන්නේ. ඉදිරිපත් කර තිබෙන අයවැය බොහොම හොඳයි. ඒ නිසා මේවා ක්‍රියාත්මක කර මේ වාසි ජනතාවට ලබා දෙන්නට අවස්ථාවක් ලැබෙන පිණිස රටේ සාමය හා සමාදනය පැතිරේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඉතාමත්ම සාර්ථකව මේ අට වැනි අයවැය ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු මුදල් ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

අ. භා. 3.51

ජබීර් ඒ. කාදර් මහතා (මැද කොළඹ දෙවන)
(ஜனாப் ஜாபிர் ஏ. காதர்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)
(Mr. Jabir A. Cader–Second Colombo Central)

Mr. Chairman, for a number of weeks before Budget day, people, and more so the Opposition, were wondering how the Hon. Minister of Finance would be able to bridge the largest deficit he has had to meet – Rs. 23 billion. At the same time he had also the enormous task of meeting the demands of the poorer sections and the middle class for relief to meet the cost of living. They have been agitating for such relief, and in view of the very huge deficit that had to be bridged everybody doubted that such relief would be granted in this Budget.

Mr. Chairman, I must congratulate the Hon. Minister of Finance, for it is due to his sheer ability and experience that he has been able to present this eight Budget of his to satisfaction of all sections of the people. I must say it is a great achievement.

The Hon. Minister has given salary increases which will benefit so many employed persons in the public sector and will also be extented, I believe, to those in the private sector after discussions with the various employment associations.

The Hon. Minister has also granted relief to the private sector middle-class workers by exempting them from income tax on earnings up to Rs. 24,000 a year. This is relief that the private sector employees had been requesting, and I myself, in my speech on the Budget last year, urged the Hon. Minister to grant this relief. Many people will also benefit from the reductions in income tax which the Hon. Minister has given besides other concessions. He has therefore extended relief to many sections.

Sri Lanka is essentially an agricultural country, and quite rightly the Hon. Minister has always given an important place in his budget proposals to the development of the plantation sector. The abolition of duty on a number of inputs in agriculture, such as fertilizer, seeds and so on, will greatly benefit the plantation industries.

Similarly, we are spending large sums of money on sugar and various essential foodstuffs which could be produced here, and with the Hon. Minister's help to grow more food. I am sure that a great saving of foreign exchange could be effected.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජබීර් ඒ. කාදර් මහතා]

The export-based industries too have been granted concesssions of imports of essential inputs for manufacture. As the Hon. Minister has stated, to become eligible for exemption from duty the Minister of Agriculture, the Minister of Industries and Scientific Affairs and other Ministers concerned will have to certify such imports. I feel that this type of concession can be very usefully extended to other sectors too that earn foreign exchange. Sectors like the tourist industry should also be given such incentives. I would like to refer to this furher later in my speech.

Income tax has always been a very considerable portion of Government revenue, but while there are those who honestly pay their taxes, there are others who avoid doing so. The Hon. Minister of Finance therefore has to keep on milking the same cows. He is now introducing measures to rope in more cows. This will not only bring in more revenue but will be fair by the people who regularly declare their incomes and pay taxes. As a result of tax evasion, the genuine taxpayers have to pay more than they need to. This new system of computerization of ID cards and business registration numbers and so on, which the Hon. Minister wants to introduce, is in fact long overdue. I am sure he will be able to get more taxes by these methods.

The Hon. Minister has referred to changes in turnover taxes on hotels and restaurants. In this connection, it is with some reluctance that I want to make my observations with regard to the tourist industry and the hotel trade, as I could be misunderstood, being a person in the hotel trade. However, I owe a duty to those in the tourist industry and the hotel trade to refer to this very important sector which is a large foreing exchange earner. There are many thousands employed in the tourist and hotel trade directory and several thousands more in the infra-structure industries like transport, curio, the batik industry and so on.

When those in the hotel trade now were originally invited by the Government to invest in the tourist industry there were many entrepreneurs who were reluctant to do so because the investment needed was very high. The tourist industry was also subject to many uncertain factors, human and economic. However, with Government's encouragement by way of various tax concessions and investment relief there were those who entered this field making large investments. Gradually the tourist business was built up and it became one on the biggest foreign exchange earners. Besides the local enterpreneurs, multi-nationals too came into the hotel business. However, these multi-nationals appear to have enjoyed greater concessions. It is being talked about in the hotel trade circles that there are some hotels now coming up – [*Inerruption*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

All right! You may continue. There will be no tea-break.

ජබීර් ඒ. කාදර් මහතා
(ஜனாப் ஜாபிர் ஏ. காதர்)
(Mr. Jabir A. Cader)

Sir, shall I continue ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

Yes.

ජබීර් ඒ. කාදර් මහතා
(ஜனாப் ஜாபிர் ஏ. காதர்)
(Mr. Jabir A. Cader)

I would not take more than 5 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

It was agreed by Mr. Deputy Speaker and myself to continue without a tea break till 6 o'clock. Any Hon. Member who wishes to have tea can have tea and come back. The Hon. Member can continue now.

ජබීර් ඒ. කාදර් මහතා
(ஜனாப் ஜாபிர் ஏ. காதர்)
(Mr. Jabir A. Cader)

It is being talked about in the hotel trade circles, that there are some hotels now coming up which are to receive customs duty exemptions on imports of furniture, fittings, machinery, and so on, over and above the concessions which had been given to other hotels. I do not know if this information is correct, but if it is so, those in the trade will be rather perturbed because it means giving such new hotels an unfair advantage competitively over the established hotels. Therefore, it will be only reasonable and fair that those hotels which have to spend on renovations and refurbisihing should also be allowed duty free imports of such items, and hotels which have already imported such items be given a rebate. Such concessions will greatly benefit the existing hotels which are going through a difficult period as everybody knows.

The tourist industry is in a slump today. Singapore gets three million tourists a year, and has 18,000 rooms hotel but we in Sri Lanka have 10,000 hotel rooms although the normal intake of tourists is 360,000 a year. You see the difference. Of course, the room requirements were projected on forecasts under normal conditions, but other factors like world recession and the ethnic disturbances have upset all those factors. However Government has already announced that no new hotels should be constructed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Tourist promotion has to be undertaken on a vast scale. I had the privilege, Sir, of being a member of the official delegation led by the Hon. Minister of State on tourist promotion in three cities in Europe, where most of our tourist traffic is generated. We in the hotel trade are thankful to the Hon. Minister of State for his addresses to the travel trade representatives in those cities – London, Paris and Frankfurt – which were very impressive, and he created an excellent impression which I am sure will bear fruit by way of an increase in the influx of tourists. I must also congratulate the Tourist Board officials in charge of the offices in those cities for the very thorough arrangements they made.

There are two other matters, Sir, connected with the hotel industry which I should like to refer to.

The fuel surcharge imposed by the Electricity Board should be removed as it costs a very heavy burden on hotels, particularly in the present circumstances. The hotels should also be placed on an industrial tariff which is very much lower than the rate at which hotels are billed. Similarly, even the water rate, which is very high, should be reduced. These reductions will offer some very badly needed relief to the hotel trade. The hotel industry should not be allowed to sink, because there could be very wide repercussions locally, like considerable unemployment not only in the hotels themselves but even in the infra-structure industries. The country too will lose much valuable foreign exchange.

Those in trade and industry and in fact all people welcome the proviions made by the Hon. Minister of Finance in the Budget for improvement of roads and transport.

The Hon. Minister has often referred to certain corporations and boards being burdens on the Government. Many of these handle commodities which are needed by the public, and if the corporations or boards are not operated efficiently, it means that the public will have to pay more for the goods produced.

Waste, corruption and mismanagement must be controlled because all these add to the price the consumer has to pay. It must also be ensured that the products are of good standard. These corporations and boards should not be allowed to increase prices without very good reason. The Government Owned Business Undertaking of the Colombo Gas Company increased the price of LPG and the Milk Board increased the price of a bottle of sterilized milk which is very popular with the consumers now from R. 3.60 to Rs. 4.75. Increases in price like this will affect the public very badly and should be avoided.

In conclusion, Sir, I must state that this Government has made enoromous progress in the various development projects that were undertaken and the development achieved is unprecedented. That is why the people are behind the Government, as was shown in the results of the last by-elections.

I am, however, perturbed by the increase in lawlessness, thuggery and corruption which is seeping into our society in a big way. The Government should give very serious consideration to this aspect as otherwise, if this trend is not arrested, the whole process of development and democracy will be subverted.

Thank you.

අ. භා. 4.05

වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி — கொழும்பு மாவட்ட அமைச்சர்)
(Mr. Weerasinghe Mallimaratchi District Minister, Colombo)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අයවැය ලේඛනය ගැන කථා කරන විට පළමුවෙන්ම අපේ මුදල් ඇමතිතුමාට මා ස්තුති වන්ත වෙනවා, එක දිගටම අයවැය ලේඛන අටක්ම ඉදිරිපත් කරන්නට එතුමාට හැකි වීම ගැන. මෙතුමා 1977 දී ඉපදුණු දරුවෙකු නම් දැන් එතුමා අවුරුදු අටක පමණ දරුවෙක්. එම දරුවා පාඨශාලාවකට ඇතුළත් කර සිටියා නම්, ඒ දරුවා අවුරුදු අටක් වයස වන විට, හතර වැනි පන්තියේ ඉගෙනුම ලබන ළමයෙක්. හතර වැනි පන්තියට යන විට තමන්ගේ දැනුම අතින් කොයිතරම් වෙනස්කම් සිදු වෙනවාද, තමන්ගේ ජීවිතයේ කොයි තරම් වෙනස් වීම් සිදු වෙනවාද කියා අප කවුරුත් දන්නවා. මේ අනුව මුදල් ඇමතිවරයා වශයෙන් එතුමාගේ දැනුම අවුරුද්දෙන් අවුරුද්ද දියුණු කරගෙන රටේ මහජනතාවගේ සුභ සිද්ධිය තකා ඒ දැණුම උපයෝගී කර ගෙන තිබෙනවාය කියා මම හිතනවා.

මෙවර අයවැය යෝජනා ඉදිරිපත් කරමින් එතුමා කළ කථාවෙන් මට තේරුම් ගිය එක් කරුණක් නම්, මේ රටේ ආර්ථික හා සමාජයීය ප්‍රතිපත්ති අපේ රටේ අනාගත සුභසිද්ධිය සඳහා, එනම් 1989 වනතුරම ප්‍රබල ආර්ථික පදනමක් මත පිහිටුවීමට බලාපොරොත්තුවකින් එතුමා කටයුතු කරන බවයි. ඒ කියන්නේ, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින දැවැන්ත සංවර්ධන වැඩ සටහන්වලින් මෙන්ම වෙනත් ආකාරවලින් අපේක්ෂා කරන අරමුණු මුදුන් පත් කර ගැනීමට එතුමා ක්‍රියා කරන බව එතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. ඒවාට උදහරණ වශයෙන්, වතු අංශයෙන් වැවිලි කර්මාන්තය නගා සිටුවීම, ගොවිතැන් ගැන බලන විට අක්කරයකට ලැබෙන අස්වැන්න වැඩි කර ගැනීම, ඒ වාගේම සුළු අපනයන භෝග වගාව දියුණු කිරීම, ඒලහට බියගම නිදහස් වෙළඳ කලාපය දියුණු කරීම සහ ඒ හා සමාන වෙළඳ කලාප ඇති කිරීම හා වැඩි දියුණු කිරීම, දේශීය කර්මාන්ත සංවර්ධනය, කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම, නිවාස දස ලක්ෂයේ වැඩ සටහන, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධනය, ජල සම්පාදන පහසුකම්, ලුණුගම්වෙහෙර වැනි වාරිමාර්ග යෝජනා ක්‍රම, සෞඛ්‍යය සහ සනීපාරක්ෂක පහසුකම්, මන්දපෝෂණය දුරු කිරීම සඳහා පෝෂණ වැඩ සටහන්, වික්ටෝරියා රන්දෙනිගල සමනලවැව වැනි විදුලිබල සංවර්ධන යෝජනා ක්‍රම, ජන සෞඛ්‍යය පාලනය ආදී පස් අවුරුදු සැලැස්මක් එතුමා මෙවර අයවැය යෝජනාවලින් ඉදිරිපත් කර තිබෙනවා. එහෙම නම් එතුමා අනාගත වැඩ සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර ඇති බව අපට පැහැදිලියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැයක් ඉදිරිපත් කරනවාය කිව්වාම වැඩි දෙනෙක් බලාපොරොත්තු වෙන්නේ යම් යම් භාණ්ඩවල, ද්‍රව්‍යවල මිල අඩු කිරීම හෝ වැඩි කිරීමයි. මොනවා අඩු වෙයිද, මොනවා වැඩි වෙයිද කවුරුන්ට යහපතක් වෙයිද, එදිනෙද ජීවිතයට මොන මොන විධියේ බලපෑම් ඇති වෙයිද ඔන්න ඔය විධියේ කාරණා ගැන බලාපොරොත්තුවකිනුයි, ඉන්නේ. අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට ආසන්න වන විට ඇතැම් අය බඩු හැංගීමේ හෝ බඩු එකතු කිරීමේ හෝ බඩු මිළදී ගැනීමේ හෝ සිරිතක් එක්තරා කාලයක තිබුණා. තවමත් ඒක සුළු වශයෙන් සිදු වෙනවා. නමුත් ඒ සිරිත් දැන් හුඟක් දුරට අඩු වී තිබෙන බව අප කවුරුත් දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

විශේෂයෙන්ම මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී එවැනි තත්ත්වයක් දකින්න තිබුණේ නැහැ. අයවැයෙන් වෙනසකට සිදු වුණේ ශත පහකින් සිගරැට් මිල වැඩි වීමත්, රුපියල්පහකින් අරක්කු මිල වැඩිවීමත් පමණයි. මේ දෙකේ බදු වැඩි කර තිබීමෙත් සාමාන්‍ය ජනතාවට ලොකු පහරක් වදිනවාය කියා මම නම් හිතන්නේ නැහැ. මොකද ? මේවා නැතුව ජීවත්වීමට අපේ රටේ ජනතාවගෙන් වැඩි දෙනෙක් පුරුදු වී සිටින නිසයි. කොටින්ම මේ දෙක පාවිච්චියට නොගෙන ජීවත් වෙන්නට හැම කෙනෙක්ම පුරුදු වෙනවා නම් වඩාත් හොඳය කියා මම කල්පනා කරනවා. මගේ පෞද්ගලික හැඟීම ඒකයි. ගරු සභාපතිතුමනි, හැම දෙනාම අපේ මුදල් ඇමතිතුමාට ස්තුති කළා, එතුමා මුදල් ඇමතිවරයා හැටියට අයවැය වාර්තා 8 ක් එක දිගටම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාය කියා. එය කවුරුත් අවිවාදයෙන් පිළිගත යුතු දෙයක්. විරුද්ධ පාර්ශ්වයේ එක මන්ත්‍රීවරයෙකුවත් දැනට මේ සභා ගර්භයේ නැතත් මම එක් කාරණාවක් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. සමහර විට හෙට මෙය කියවාවි ; නැත්නම් දැනගන්න ලැබේවි, මා හිතන හැටියට අහගෙනත් ඇති, නැත්නම් අහන්න ලැබේවි.

අට අවුරුද්දක් මුදල් ඇමතිකම කරන්නත්, අට වරක් අයවැය ලේඛන ඉදිරිපත් කරන්නත් යම් කිසි දක්ෂතාවක් තිබිය යුතුයි. දක්ෂතාව අනුව එතුමා මුදල් ඇමතිකමට ඉතාම සුදුසු පුද්ගලයා වශයෙන් තෝරා ගන්නට යෙදුණේ අපේ අතිගරු ජනාධිපති උතුමාණන් විසින්. 1977 දී එතුමා කැබිනට් මණ්ඩලයට පත් වී මුදල් ඇමතිවරයා වශයෙන් අදවන තුරු ඒ අමාත්‍ය ධුරයේ වැඩ කටයුතු කරනවා. මම මුලින් කිව්වා වාගේ, එතුමාගේ දක්ෂතාව, එතුමා දිගටම ප්‍රදර්ශනය කර තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට—විශෙෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට—මෙයින් යම්කිසි ආදර්ශයක් ගන්න පුළුවන්. විශේෂයෙන්ම මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කියන්න කැමතියි මේ මුදල් ඇමතිතුමා අපේ පක්ෂයට පැමිණියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිට බව. මම ඒ උදවියට දෝෂාරෝපණය කරනවා නොවෙයි. බොහෝම කරුණාවෙන් මතක් කර දෙන්නේ අමතක වී ඇති දෙයක්. මේ දක්ෂ පුද්ගලයා සිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. නමුත් ඒ තරම් දක්ෂ ඒ පුද්ගලයා සිටියේ පිටිපස බංකුවකයි. අවුරුදු ගණනාවක් තවත්තාගෙන සිටියා ඉදිරියට එන්න දෙන්නේ නැතිව. අඩු වශයෙන් උප ඇමතිකමක්වත් දුන්නේ නැහැ, පෞද්ගලික ප්‍රශ්න උඩ. කැපී පෙනෙන දක්ෂතා එතුමා තුළ තිබුණ නිසා ඉදිරියට එන්න දෙන්නේ නැතිව අවුරුදු ගණනාවක්ම සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් හැටියට තියාගෙන සිටියා.

එතුමා අපේ පක්ෂයට එකතු වුණාට පස්සෙ මොකක්ද වුණේ ? නිතරම බුද්ධිමත්ව කල්පනා කරන, හැම කෙනෙකුටම ස්වකීය දක්ෂතා අනුව ඉදිරියට එන්නට අවස්ථාවක් දෙන අපේ පක්ෂයේ—ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන අපේ පක්ෂයේ—නායකතුමා මෙතුමාට භාරදූර මුදල් ඇමති ධුරය පිරිනැමුවා. එසේ පිරි නැමුවායින් පසු ඇති වී තිබෙන ප්‍රතිඵලය කුමක්ද ? අද මේ රටේ මහජනතාවට සෙතක් ශාන්තියක් සැලසී තිබෙනවා. ඒ වාගේම අපේ රටට විශාල ප්‍රශංසාවක් ලැබෙනවා. ඒ මොකද, මුළු ලෝකයේම ජ්‍යෙෂ්ඨ මුදල් ඇමතිවරයෙකු හැටියටත්, දක්ෂ මුදල් ඇමතිවරයෙක් හැටියටත් පිළිගැනීමක් ඇතිව පෙනී සිටින්නට මේ ඇමතිතුමාට පුළුවන්කම ලැබී තිබීම නිසා.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය විවේචනය කරනවාට වඩා, මේ සභාවේ සිට නොයෙකුත් උසුළු විසුළු කරනවාට වඩා, තමන්ගේ අඩුපාඩුකම් තියාගෙන අපේ අඩුපාඩුකම් සොයනවාට වඩා, තම පක්ෂයේ අනාගතය සකස් කර ගැනීම සඳහා තම පක්ෂයේ අඩුපාඩුකම් ගැන සිතා බලන්නය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මතක් කර දෙන්න කැමතියි. එය වඩාත් හොඳ පිළිවෙළක් බව මා නැවතත් මතක් කරනවා.

ඊළඟට මා සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ ගරු මුදල් ඇමතිතුමා සිය කථාවේදී පෙන්වා දුන් කරුණක් ගැනයි. එතුමා ප්‍රකාශ කළා, අපි බලාපොරොත්තු වුණේ මේ රටේ යටත් පිරිසෙයින් සියයට පහක නැත්නම් සියයට හයක සංවර්ධන වේගයක්ය කියා. මේ දැවැන්ත සංවර්ධන වැඩ සටහන් තුළින් එය එසේ සිදු වන බව මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නට සතුටුයි. අපි කවුරුත් දන්නා විධියට රැකියා විරහිත භාවය දැන් බොහෝදුරට අඩු වී තිබෙනවා. අපි මේ රජය භාර ගන්නා විට දහතර ලක්ෂයක් නැත්නම් පහළොස් ලක්ෂයක් මේ රටේ රැකියා විරහිතව සිටියා. ඒකපුද්ගල ආදායම අද දෙගුණ තෙගුණ වී තිබෙනවා. අපේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති නිවැරදි දිශාව බලාගෙන ගමන් කරවන්නට මේ නිසා අපට පුළුවන් වී තිබෙනවා. මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී දකින්නට ලැබුණු විශේෂ දක්ෂතාවය නම් මේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා මහජනතාව පිට බරක් නොපටවා එය ඉදිරිපත් කිරීමයි. පසුගිය රජය කාලයේ වර්ෂයක් සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයක් සමඟ සසඳා කල්පනා කර බලන විට ඒ අයවැය ලේඛනයක් මෙන් දග ගුණයක් විශාල, බරපතල අයවැය ලේඛනයකුයි ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නේ. ගණන් හිලව් අනුව, 1985 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අයවැය ලේඛනයෙන් රුපියල් දශ ලක්ෂ 60,000 ක් පමණ වියදම් කරන්නට බලාපොරොත්තු වෙනවා. එය පසුගිය රජයේ අයවැය ලේඛනයකින් වියදම් කළ මුදල මෙන් දස ගුණයක් විශාලයි. ජනගහනය වැඩි වී තිබියදී, ජීවන වියදම වැඩි වී තිබියදී, මහජනතාව පිට බරක් නොවැටෙන පරිදි, වියදම් කරන මුදල වැඩි කර තිබෙනවා.

ඒ වාගේම රජයේ සේවකයන්ගේ මාසික වැටුප රුපියල් සියයකින් වැඩි කර තිබෙනවා. රුපියල් සියයක් පඩි වැඩි කිරීමෙන් රජයේ සේවකයන්ට ලොකුම දෙයක් ලබා දුන්නාය කියා මම කියන්නේ නැහැ. නමුත් රජයේ සේවකයන්ට ඒ රුපියල් සියය ලබා දීමත් සෑහෙන ලබා දීමක් හැටියට සලකන්නට පුළුවනි. ගරු මුදල් ඇමතිතුමාගේ දක්ෂතාවය ප්‍රයෝජනයට ගෙන, ගරු කම්කරු ඇමතිතුමා සමඟත් සාකච්ඡා කර බලා, පුද්ගලික අංශයේ සෑම ව්‍යාපාරික ආයතනයකම සේවකයින්ටත් මේ රුපියල් සියයේ වැඩිවීම ලබා දීමට යම් නියෝග මාලාවක් නිකුත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම රජයට සම්බන්ධ සෑම ආයතනයකමත්, සංස්ථාවකමත් වැඩ කරන සේවකයන්ට මේ රුපියල් සියයේ වැඩිවීම ලැබෙන පරිදි යම්කිසි නීතිමය වැඩ පිළිවෙළක් සකස් කළ හැකි නම් එය මේ අයවැය ලේඛනයෙන් ලැබෙන ලොකු සහනයක් හැටියට — ඉතා උතුම් දෙයක් හැටියට — සැලකිය හැකි බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි. ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරන මෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මේ රුපියල් සියයේ වැඩිවීම පමණක් නොව, 1977 සිට එක්සත් ජාතික පක්ෂයේ රජය පස් වරක් මේ ආකාරයට පඩි වැඩිවීම් කර තිබෙනවා. මේ ආකාරයට වරින් වර රුපියල් පන්සිය හතරක පඩි වැඩිවීම් ලබා දී තිබෙනවා. නමුත් පසුගිය රජයට හත් අවුරුද්දකටම වැඩි කරන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ රුපියල් පහළොවක පමණ මුදලකුයි. ඒ ගණන හරියටම කීයද කියන්න මට මතක නැහැ. නමුත් රුපියල් පහළොවක් තරම් මුදලකුයි වැඩි කළේ. ඒ රුපියල් පහළොව වැඩි කිරීමත් එක්කම උන්නැහෙලාගේ පඩි වැඩිකිරීම් සියල්ල හමස් පෙට්ටියට දැම්මා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මෙම අයවැය ලේඛනයෙන් මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අපනයනය — එක්ස්පෝට් — කිරීමට විශේෂ තැනක් දී තිබෙන බව මම කියන්න කැමතියි. එයින් බලාපොරොත්තු වන්නේ මේ රටට ලැබෙන ආදායම තවත් තර කර ගැනීමයි.

ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) පෙරෙයිද තම කථාවේදී ලෝක බැංකුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කළා. අපි අපේ අයවැය ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන්නේ ලෝක බැංකුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් කියන හැටියටය යන්න එතුමා ගෙනා එක් තර්කයක්. මේ කතාව එතුමා අත්තනගල්ලේ මන්ත්‍රීවරයා වශයෙන් තුණ්ඩුවෙන් පත් වුණු ද සිටම කියන කතාවක්. එතුමා මේ කතාව හැම අයවැය ලේඛන විවාදයකදීම හැමදම කියන්නට පුරුදු කරගෙන තිබෙනවා. අපේ මුදල් ඇමතිතුමා අයවැය ලේඛන සකස් කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිවලටත් මේ රටේ පොදුජනතාවගේ ඕනෑ එපාකම්වලටත් සරිලන පරිදි මිස ලෝක බැංකුවටවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටවත් වුවමනා හැටියට නොවන බව මම එතුමාට කියන්න කැමතියි.

මම ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥයෙක් නොවෙයි. මට ඒ ගැන කිසිම දැනුමක් නැහැ. ආර්ථික විද්‍යාව විෂයය ගැන මට හසළ බුද්ධියක් නැහැ. මම ගමේ මගේ චන්ද කොට්ඨාශයේම පදිංචි, ගමේ ජනතාව එක්ක ආශ්‍රය කරන කෙනෙක්. මේ ගරු සභාවේදී මම කතා කරන්නේ ගමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරයකුවශයෙන් මට හැගෙන මට දකින්නට ලැබෙන හා ගමේ උදවිය එක්ක කතා කරන දේවල්. මේ අනුව මෙම ගරු සභාව ඉදිරියේ මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් මම ඉදිරිපත් කරන්නේ මගේ හිතට එකඟව මට හැගෙන කරුණුයි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට පිළිතුරක් දෙන්න මම කැමතියි. ඩොලරයක් සමග අපේ මුදල් සමකිරීම සඳහා පසුගිය අවුරුද්දේ සිට රුපියල බාල්දු කොට ඩොලරයට ගෙවන මිල රුපියල් තිහක් කරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ලෝක බැංකුවත් අපට කියා තිබෙනවායයි ඒ මන්ත්‍රීතුමා කිව්වා. එතුමාගේම වචනවලින් කියනොත් එසේ සම කරන ලෙස ඒ ආයතන දෙක අපෙන් ඉල්ලීමක් කර තිබෙනවායයි එතුමා සඳහන් කළා. ඩොලරයකට ලංකාවේ අද ගෙවන මිල රුපියල් විසිහය බව තමුන්නාන්සේ හොඳින්ම දන්නවා. ගිය අවුරුද්දේ එය රුපියල් තිහක් කරන ලෙස ලෝක බැංකුව අපට කියා තිබුණා නම් ගිය අවුරුද්දේ ඩොලරයක් සඳහා ගෙවූ මිල රුපියල් විසිපහක් වුණේ කොහොමද ? රුපියල් තිහක් කරන ලෙස ඉල්ලුවාය යනුවෙන් එතුමා ඉදිරිපත් කරන තර්කය එතැනින්ම බිඳෙනවා නොවේදැයි මම අහන්න කැමතියි. එතුමා දැන් මෙතැන නැහැ. එතුමා ගෙනා තර්කය ලංකාවේ අද පවතින මේ මිල ගණන්වලින්ම මේ අවස්ථාවේදී බිඳින්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

අපි නටන්නේ ලෝක බැංකුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ගහන පදයටයයි ඊළඟට එතුමා කියා තිබෙනවා. මම ඒකටත් පිළිතුරු දෙන්න කැමතියි. ලෝකයේ විශාල ආධාර නැතිව අපට මේ රටේ වැඩ කරන්නට අමාරුයි. පසුගිය රජයේ හිටපු දක්ෂ මුදල් ඇමතිවරයෙකු වූ ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා ලෝක බැංකුවේ ආධාර ලබාගැනීම සඳහා මැක්නමාරා මහතා හමුවීමට කීප වාරයක්ම ගිය බව මට මතකයි. ඒක ඉතා වැදගත් කාර්යයක්. ඒක නියම කාර්යයක්. ඒක වුවමනා කරන කාර්යයක්. ඒ වාගේම අපේ ගරු මුදල් ඇමතිතුමාත් නොයෙක් රටවලින් නොයෙකුත් ආධාර උපකාර ලබා ගැනීම සඳහා අවුරුද්දකට කීප වරක්ම පිටරට යනවා. මුදල් ඇමතිවරයෙක් එසේ යා යුතුයි. මුදල් ඇමතිවරයෙක් පමණක් නොව ඕනෑම ඇමතිවරයෙක් තම රටේ තමන්ගේ අමාත්‍යාංශයේ තමන්ට අයිති වැඩ කොටස් තම රටේ දියුණුව පිණිස කිරීමට අවශ්‍ය විශාල ආධාර උපකාර ලබාගැනීම සඳහා තමන්ගේ අවශ්‍ය නිලධාරීන්ද කැටුව අවශ්‍ය රටවලට ගොස් එය ලබා ගැනීම යුතුකමක්.

මේ රටට සංචාරකයින් පැමිණීම පසුගිය කාලයේ අඩුවෙගෙන ගියා. ඒ නිසා එය දියුණු කිරීමට පිළියම් සෙවීම පිණිස මේ ළඟදී අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා මාසයක පමණ කාලයක් විදේශ සංචාරයක් කළා. අපේ ගරු මුදල් ඇමතිතුමාත් ඊට කලින් විදේශ රටවල ගිහින් අපට ආධාර ලබා ගැනීම පිණිස සාකච්ඡා පැවැත්වුවා. ඒ ආධාර අවශ්‍ය නිසා එසේ ගොස් ආධාර ලබා ගත යුතුයි. ලෝක බැංකුවෙන් වරින් වර ආධාර මුදල් අපට නොලැබුණා නම් මහවැලිය වාගේ විශාල ව්‍යාපාර කරන්නට අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මෙම ආධාර අපි ලබා ගත් නිසයි, මෙම ව්‍යාපාර ඉක්මණින් කරන්නට අපට පුළුවන් වුණේ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ වාගේ ආධාර නොලැබුණු නිසා රටේ සංවර්ධනය සඳහා විශාල වැඩ කොටසක් කරන්න ඒ උදවියට පුළුවන්කමක් ලැබුණේ නැහැ. මේ නිසා අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ බොළඳ තර්ක ඉදිරිපත් කරන්නේ ඊර්ෂ්‍යාවටය කියා මම අදහස් කරනවා. මේ වාගේ බොළඳ තර්ක ඉදිරිපත් කිරීමෙන් කාව රවට්ටන්නද එතුමා උත්සාහ කරන්නේ කියා මට නම් තේරෙන්නේ නැහැ.

අපේ රටේ දේශපාලන ස්වාධීනත්වයත්, අපේ රටේ ආර්ථික ස්වාධීනත්වයත් කිසිම විදේශීය ආයතනයකට පාවා දෙන්නට අපි කිසි විටක සූදානම් නැති බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වාගේම මේ ආයතන දෙකම—ලෝක බැංකුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්—අපි ගන්න ණය මුදල් සම්බන්ධව අපට අවවාද කර ලියුමක් එවා තිබෙනවාය කියා එතුමා ඊයේ අපට ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා යම් මනුෂ්‍යයෙක් යම් බැංකුවකින් ණය මුදලක් ගත්තොත් ඒ ණය මුදල් ගත් මනුෂ්‍යයාට "මේවා මේ විධියට පාවිච්චි කරන්න ඕනෑ, මේ කොන්දේසි කඩ කරන්න එපා, මේ විධියට මෙය ගෙවිය යුතුය." යනාදි වශයෙන් නොයෙකුත් කොන්දේසි ලියා එවනවා ඒ බැංකුවෙන්. එහෙම නම් මේ විධියටම තමයි අපටත් ලෝක බැංකුවෙන් ලිපි එවන්නේ. "තමුන්නාන්සේලා ණය අරගෙන තිබෙනවා ; ප්‍රවේශම් වෙන්න ඕනෑ ; මේ විධියට මේවා පාවිච්චි කරන්න ; තමුන්නාන්සේලා එසේ නොකර අමාරුවේ වැටෙන්න එපා" කියල ලෝක බැංකුවෙන් අපට ලියුම් එවනවා. ඩේවිඩ් හොපර් මහත්මයාගෙන් අපි ණයක් ගත්තාය කියල, ඩේවිඩ් හොපර් මහත්මයා අපට ලියුමක් ලිව්වාය කියල අපි ඩේවිඩ් හොපර් මහත්මයාටවත් එහෙම නැත්නම් ලෝක බැංකුවටවත් යටත් වෙලා අපේ රට පාලනය කරන්නේ නැහැ. අපේ ස්වාධීනත්වය ඒවාට යට කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. අපි ස්වාධීනව අපේ රට පාලනය කරන ගමන් ඒ අය සමග ඒ සම්බන්ධකම් පවත්වාගෙන යන්නේ අපේ රටට වුවමනා ආධාර ලබා ගැනීමටයි. ඒ අය යම්කිසි උපදේශයක් දෙනවා නම් අපි ඒ උපදේශය භාර ගන්නා අතර අපේ ස්වාධීනත්වය රැකගෙන අපේ රටේ පාලනය අපි ගෙන යනවා. එම නිසා මා හිතන හැටියට හොපර් මහත්මයා එවූ ලිපිය—ලෝක බැංකුවෙන් එවන ලද ලිපිය—සම්බන්ධයෙන් අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා ඔපමණ කනස්සල්ලට පත් විය යුතු නැහැ. ලෝක බැංකුවේ සාමාජික රටවල් 147 ටම මේ වාගේ ලිපි ඕනෑ තරම් යවලා ඇති. එවැනි ලිපි ඒ ඒ පුවත්පත්වල ඕනෑ තරම් පළවෙලත් තියෙනවා. එම නිසා මේ ලිපිය ගැන ඒ තරම් කරදර විය යුතු නැතැයි කියා අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාට මා මතක් කර දෙන්න කැමතියි.

අපි සංවර්ධන කටයුතු ගැන කල්පනා කරමු. මේ අයවැය ලේඛනයෙන් ඒ සඳහා මිනිසුන් මත බරක් පටවා නැති බව උදාහරණ සහිතව තමුන්නාන්සේ ඉදිරියේ තබන්න කැමතියි. අමාරුකම් මධ්‍යයේ වුණත් මුදල් ඇමතිතුමා අයවැය ලේඛන ඉදිරිපත් කරන්නට පටන් ගත්ද සිට මේ වන තෙක් එක දිගටම එතුමාට සියලු දෙනාගෙන්ම පැසසුම් ලැබුණා. නමුත් අපේ රටේ තිබෙන සිරිතක් තමයි කොපමණ අමාරුකම් තිබුණත් සහනයක් දුන්නාම ඒක ඉක්මණින්ම අමතකවීම. අපට පොඩි පොඩි අමාරුකම් තිබෙනවා. නමුත් මුදල් ඇමතිතුමා අපට මුහුණපාන්නට විය හැකිව තිබුණු මීට වඩා අමාරු තත්ත්වයකින් අපව බේරා ගැනීම ගැන අප තුළ ලොකු සතුටක් ඇති වෙනවා.

ඇත්ත වශයෙන්ම අපි බලාපොරොත්තු වුණේ නැහැ අපේ කොට්ඨාශවලට මේ තරම් මුදලක් ලැබේවිය කියල. 1977 සිට 1983 දක්වා එක් ආසනයකට අපට ලැබුණේ රුපියල් දස ලක්ෂ 2 1/2 යි. රුපියල් ලක්ෂ 25 ක් පමණයි. මේ අවුරුද්දේ ආසනයකට ලැබුණා දස ලක්ෂ 5 ක්. රුපියල් ලක්ෂ 50 ක්. විමධ්‍යගත අයවැය යටතේ දස ලක්ෂ 2 1/2 කුත් සංවර්ධන සභාවලට දස ලක්ෂ 2 1/2 කුත් ලැබුණා. ඒ මුදල ලැබෙන කොට කාටත් පුදුම හිතුණා මේ තරම් අමාරු තත්ත්වයක් තිබියදීත් රටේ සීඝ්‍ර සංවර්ධනය සඳහා මේ තරම් මුදලක් වෙන් කළේ කොහොමද කියල.

1977 දී අපේ රජය බලයට පත් වුණාට පසු අපට පැමිණි කරදර රාශිය ගැන කල්පනා කර බලන්න. එක පැත්තකින් අපට ත්‍රස්තවාදීන්ට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙනවා. උතුරු නැගෙනහිර ප්‍රදේශ ගැන බලන විට හැමදම මොකක් හරි හොරකමක්. මිනී මැරුමක්. මංකොල්ලකෑමක්. නැත්නම් අපේ හමුදාවට මොකක් හරි කරදරයක්. නැත්නම් දුම්රියට පැන මංකොල්ලකෑමක්. බැංකු මංකොල්ලයක්. මිනීමැරුමක්. කවුරු හරි පැහැරගෙන යෑමක්. අපට එක පැත්තකින් එවැනි දමරිකකම්වලට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙනවා. රට වෙනුවෙන් අපේ මහජනතාව වෙනුවෙන් වැය කරන්නට තිබෙන විශාල ධනස්කන්ධයක් ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා අපේ හමුදාවට, ගුවන් හමුදාවට, නාවික හමුදාවට, වැය කරන්නට සිද්ධ වී තිබෙනවා කල්පනා කර බලන්න. එවැනි අවස්ථාවක මන්ත්‍රී කොට්ඨාශයකට ලක්ෂ 50 බැගින් දෙන්නට පුළුවන්කම තිබෙනවා නම් ඒකත් එක්තරා පුදුමයක් නේද කියා මා අසන්නට කැමතියි. ඒකම මුදල් ඇමතිතුමා කළ උසස් සේවයක් බව අපට සඳහන් කරන්නට පුළුවනි.

අතිගරු ජනාධිපතිතුමා යටතේ මේ රජයේ කැබිනට් ඇමතිවරු මහජනතාව වෙනුවෙන් තමන්ට පැවරුණු රාජකාරිය ඉතාම දක්ෂ අන්දමින් ඉෂ්ට කර තිබෙනවාය කියා අපට සතුටු වෙන්නට පුළුවනි. විවේචනය කරන උදවියට බොහොම ලෙහෙසියි විවේචනය කරන්නට. විවේචනය කරන්නේ නිකම් ඉන්න මිනිස්සු. බොහොම දක්ෂයි ඒ අය විවේචනයට. නමුත් කල්පනා කර බලන්න මේ දෙන මුදල් සම්භාරයට ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට වැය කරන මුදලත් එකතු කරන්නට පුළුවන් වුණා නම් කොයි තරම් ප්‍රයෝජනයක් ගන්නට තිබුණාද කියල.

1983 කලබල ඇති වූ අවස්ථාවේදී විදේශවලින් මේ රටට සංචාරකයන්ගේ පැමිණීම සම්පූර්ණයෙන්ම අඩපණ වුණා. සංචාරකයින්ගේ පැමිණීම සියයට 70 කින් පමණ අඩුවුණා. එසේ විදේශීය සංචාරකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

නොපැමිණීම නිසා කොපමණ ආදායමක් අපට නැති වුණාද ? විරුද්ධ පක්ෂයේ කවුරුවත් ඒවා ගැන කථා කළාද ? කථා කරනවාද ? නැහැ. " මේ තරම් අමාරුකම් තිබියදී තමුන්නාන්සේලා ඉදිරිපත් කළ අයවැය ලේඛනය හොඳයි, තමුන්නාන්සේලාට මේ අවුරුද්දේ අඩුපාඩුවක් වුණේ මෙන්න මේ කාරණය නිසයි " ආදි වශයෙන් තමුන්නාන්සේලා කථා කරනවාද ? කවදාවත් එහෙම කථා කරන්නෙ නැහැ. එහෙම කියන්නට පුළුවන් කමක් තිබුණත් ඒක කියන්නෙ කොලේ වහල. ඩේවිඩ් හොපර් ලියුමක් යැව්වාය, ඒ ලියුම නිසා ලංකාවේ භයානක තත්ත්වයක් තිබෙනවාය කියනවා. ඕනෑම කෙනෙකුට ලියුම් යවන්න පුළුවනි. ලියුම් ගැන කථා කරන්නත් පුළුවනි. නමුත් ඒක නොවෙයි මෙතැන අවශ්‍යතාවය. පාලනය කරන කොට කොහොමද පාලනය කළේ කියන කාරණය ගැනයි අපි කල්පනා කළ යුතුව තිබෙන්නේ.

අද බලන්න. මහජනතාවට ඕනෑම විටක සිමෙන්ති බෑගයක් ගන්නට පුළුවනි. සිමෙන්ති බෑගයක අවම මිල රු. 104 යි. මට මතක හැටියට 1971-72 කාලයේ—පසුගිය ආණ්ඩුව පැවැති කාලයේ—සිමෙන්ති කොට්ටයක් රු. 13 ක් වැනි අවම මිලකට ගන්න පුළුවන්කම තිබුණා. නමුත් ඒ කාලයේ ගෙවල් හැදුණේ 10 ක් නම් අද හැදෙනවා, 1,000 ක්. අද සිමෙන්ති කොට්ටයක මිල රු. 104 යි. ඒ වුණත් එදා රු. 13 කට සිමෙන්ති කොට්ටයක් ගන්න පුළුවන්කම තිබෙද්දිත් මේ තරම් ගෙවල් හැදුණේ නැහැ. ඕනෑම මාර්ගයක ගමන් කර බලන්න, ගෙවල් දහස් ගණන් හැදී තිබෙන හැටි එතකොට බලා ගන්න පුළුවනි.

ඊට හේතුව මොකක්දැයි විරුද්ධ පාර්ශ්වයෙන් අහන්න කැමැතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ අන්තිම කාලයේ—1976 අග භාගයේදී—වුණත් සිමෙන්ති කොට්ටයක් ගන්න රු. 50 කට 60 කට වඩා වියදම් කරන්න සිද්ධ වුණේ නැහැ. අද සිමෙන්ති කොට්ටයක මිල ඒවගේ දෙගුණයක් වෙලා. එහෙම තිබෙද්දිත් අද ගෙවල් හැදීමේ වේගය එදාට වඩා හුඟක් වැඩියි. සිමෙන්ති මිල පමණක් නොවෙයි, අද ලී මිලත් බොහොම වැඩි වී තිබෙනවා. මේසන් බාස් කෙනකුට ගෙවන්න වන කුලියත් දවසකට රුපියල් එකසිය ගණනක්-අඩුම තරමින් රුපියල් අනූවක්-වෙනවා. නමුත් ඒ අතර ජනතාවගේ ආදායම් මාර්ගත් වැඩි වෙලා තිබෙනවා.

සාමාන්‍යයෙන් මැතිවරණවලට, අතුරු මැතිවරණවලට ගියාම ජීවන වියදම ගැන සඳහන් කරනවා. මම මේ අවස්ථාවේදී පසුගිය අතුරු මැතිවරණ දෙකේදී අපි ලබා ගත් ජයග්‍රහණය සඳහන් කරන්න උත්සාහ කරනවා නොවෙයි. ඒ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය විවේචනයට ලක් කරන්න යන්නේ නැහැ, මේ අවස්ථාවේදී. කෙටියෙන්ම කියනවා නම් මේ අවස්ථාවේදී ඒ අතුරු මැතිවරණ දෙකේ ජයග්‍රහණය ගැන සඳහන් කිරීම සුදුසුයයි මම හිතන්නේ නැහැ. මම බලාපොරොත්තු වන්නේ, ඒ ජයග්‍රහණ අයවැය ලේඛනයට උපයෝගී කර ගන්නයි. රටේ ආර්ථික තත්ත්වය හා අයවැය ලේඛනය ගැනත්, පොදුවේ සාමාන්‍ය ජනතාවගේ ආදායම් මාර්ගවල දියුණුව ගැනත් සඳහන් කරන්න පමණයි. ඒ අතුරු මැතිවරණ උපයෝගී කර ගන්න මම බලාපොරොත්තු වන්නේ. එදා-පසුගිය ආණ්ඩු කාලයේදී-රු. 13 ට සිමෙන්ති කොට්ටයක් ගන්න පුළුවන්කම තිබුණත් ගෙයක් හද ගන්න සාමාන්‍ය ජනතාවට පුළුවන්කම තිබුණේ නැති බව පෙන්වන්නයි, මම උත්සාහ කරන්නේ. එදා අවම මිලකට බඩු ගන්න පුළුවන්කම තිබුණත් ඒ අවම මිලට වුණත් බඩු අරගෙන ගෙවල් හද ගන්න, වෙනත් දේවල් කරන්න සාමාන්‍ය ජනතාවට එදා පුළුවන්කමක් තිබුණේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

Order, please ! The Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுப் பிரதித் தலைவர் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

වීරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

මේ රජය බලයට පත්වීමත් සමඟ ඇති කළ වැඩ පිළිවෙළ නිසා මහජනතාවගේ ආදායම් මාර්ග දියුණු වුණා වගේම, අපේ ඒ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා මතු වුණු ඇතැම් දුෂ්කරතාත් තිබෙන බව මම පිළිගන්නවා. ඒ බව මම පසුව පෙන්වා දෙන්නම්. නිදහස් ආර්ථිකය නිසා සමහර තැන්වල අපි අමාරුවට පත් වෙන්න ඇති. මම නැහැයි කියන්නේ නැහැ. නමුත් රජයේ ඒ ආර්ථික ප්‍රතිපත්තිය නිසා සාමාන්‍ය ජනතාවට විශාල පහසුවක් ඇති වී තිබෙන බවත් අප මතක තබා ගන්න ඕනෑ. විශේෂයෙන් ගම්බද ජනතාවට ඒ ප්‍රතිපත්තිය නිසා විශාල සේවයක් සිදු වී තිබෙනවා. පිටරට යන්න හීනෙකින්වත් බලාපොරොත්තු නොවුණු උදවියට අද අවස්ථාව සැලසී තිබෙනවා, පිටරට ගිහින් මුදල් හම්බ කරගෙන ගෙවල්-දොරවල් හද ගන්න ; තමන්ගේ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ගන්න. ඒ විධියට මුදල් හොයා ගෙන ගෙවල් හදගෙන හොඳින් ජීවත් වන ශ්‍රී ලාංකිකයන් දහස් ගණනක් ඉන්නවා.

මම එක උදාහරණයක් දෙන්නම්. සමහර අතුරු මැතිවරණවලදී විරුද්ධ පාක්ෂිකයන් අපේ ජනතාවට කිව්වා, " 1977 දී අසුවල්—අසුවල් දේවල් මිල ගණන් එහෙමයි, දැන් ඒවායේ මිල ගණන් මෙහෙමයි " කියා. නමුත් ජනතාව ඒ උදවියගේ කීම පිළිගෙන කටයුතු කළේ නැහැ. ඒ ඇයි ? අපේ ජනතාව දන්නවා 1977 මිල ගණන් එහෙම වුණාට, දැන් මිල ගණන් මෙහෙම වුණාට, දැන් තමන් අතේ ඕනෑ තරම් මුදල් තිබෙනවාය කියා. අන්න, පඩි ගණන් සංසන්දනය කළා නම් කියන්න තිබුණා, එය සාධාරණ ා කියා. ගරු මුදල් ඇමතිතුමා රජයේ සේවකයන්ගේ පඩියත් කීප වතාවක්ම වැඩි කර තිබෙනවා. මෙවරත් එතුමා ඒ අයගේ පඩිය රු. 100 කින් වැඩි කළා. මම කියන්නේ නැහැ, ඒ රු. 100 වැඩි කිරීමෙන් ඒ අයගේ අවශ්‍යතා සියයට 100 ක්ම සම්පූර්ණ වුණාය කියා. මම කැමැතියි, රජයේ සේවකයන්ගේ පඩිය රු. 300 කින්වත් වැඩි කරනවා නම්. රජයේ සේවකයන් බොහොම අමාරු තත්ත්වයක ඉන්නා බව මම දන්නවා.

මම කලිනුත් කිව්වා වාගේ සිමෙන්ති කොට්ටයක මිල පමණක් නොවෙයි, ලීවල මිල ගණනුත් හුඟක් ඉහළ ගිහින් තිබෙනවා. ඇත්ත වශයෙන්ම සීමාවක් නැතිව ලී මිල ඉහළ යනවා. ඇත්ත වශයෙන්ම සමහර දේවල් සඳහා තමන්ට හිතු—හිතු ගණන් අය කරන බවක් පෙනෙන්න තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කියනවා නම් " මේ රජය කාලයේ දියුණුවක් දකින්න නැහැ " කියා නිවාස පමණක් නොවෙයි තවත් දෙයක් පෙන්වා දෙන්න කැමැතියි. මේ රටේ තිබෙන පන්සල්, මේ රටේ තිබෙන පල්ලි, මේ රටේ තිබෙන දේවාල, මේ රටේ තිබෙන මුස්ලිම් පල්ලි ආගම් භේදවලින් තොරව, පෙර තිබුණාට වඩා දියුණු තත්ත්වයකට පත්වී තිබනවා.

විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ පන්සල් සිය ගණනක් ලොකු දියුණුවක් ලබා තිබෙනවා. රජයේ මුදල්වලින් නොවෙයි, පුද්ගලික ආයතනවලින්, පුද්ගලයන්ගේ මහන්සියෙන්, පුද්ගලයන්ගේ උනන්දුවෙන්, වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ මුදල්වලින් ඒවා ගොඩ නගාගෙන යනවා. විවෘත ආර්ථිකය නිසා ඔවුන් උපයන මුදලින් කරන පරිත්‍යාග නිසා, විශාල දියුණුවක් ඇතිවේගන යනවා, එමගින් මහජනතාවට විශාල සෙතක් ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අගමැතිතුමාගේ නිවාස සංකල්පය යටතේ ඇතිවී තිබෙන සංවර්ධනය තමුන්නාන්සේලා දන්නවා. ගරු මුදල් ඇමතිතුමා පෙරේද ප්‍රකාශ කළා, නිවාස ලක්ෂයක් නිමකොට, නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙළ දැන් ක්‍රියාත්මක කර තිබෙන බව. කාරක සභා අවස්ථාවේ දී නිවාස සම්බන්ධ වැය ශීර්ෂය යටතේ මම මේ ගැන කරුණු ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. රුපියල් හත්දහස් පන්සියයේ ණය මුදල විශාල සංඛ්‍යාවකට අද දී තිබෙනවා, පක්ෂ භේදයකින් තොරව. පැල්පත්වල පදිංචි අයට ඒ මුදල් නිකුත් කර තිබෙනවා. මේ රටේ විශාල ජනතාවකට එයින් සේවයක් වී තිබෙනවා.

එක් අයකුට ණය මුදල ලැබී, ඔහු එකතු කළ මුදලුත් කීයක් හෝ ඊට යොදා නිවස තනන විට, අල්ලපු ගෙදර සිටින මිනිස්සුත් තමන්ගේ නිවසත් හදාගන්නට උනන්දුවීම නිසා අද මෙය තරඟකාරී තත්ත්වයකට පත්වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහාමාර්ග ගැනත් වචනයක් කියන්න කැමතියි. පසුගිය වර්ෂයේ වර්ෂාව තදින් ඇතිවූ නිසා හුඟක් මහාමාර්ග අබලන් තත්ත්වයකට වැටුණා. ඒවායේ තත්ත්වය හැම කෙනෙකුගේම විවේචනයට ලක්වුණා. නමුත් තව මාස කිහිපයක් ඇතුළත ඒවා ඉතාම සුදුසු තත්ත්වයකට පත්වෙනවා ඇති.

ශාල මුදලක් වැය කරන්නට අපට සිදුවී තිබෙන, දැනට යථා තත්ත්වයට පත්ව තිබෙන, හැම පාර්ලිමේන්තු ආසනයකම ගරු මන්ත්‍රීවරුන් හුඟක් උනන්දුවෙන්, මහන්සියෙන් වැඩ කරන, පක්ෂ භේද කිසිවක් ගැන නොතකා අපි කවුරුත් සතුටුවන තැනක් තමයි මේ අධ්‍යාපන කටයුතු. 1977 න් පසුව, හැම හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ තම තමන්ගේ කොට්ඨාශවල මේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට කටයුතු කර තිබෙනවා. අපේ රට නිදහස ලබා ගත්තාට පසුව, පසුගිය හත් අවුරුද්දේදී තරම් පාඨශාලා ගොඩනැගිලි ඉදිවුණු කාලයක් තිබුණේ නැතැයි මම මේ ගරු සභාවට දන්වන්න කැමතියි. පක්ෂ භේදයෙන් තොරව, පාසල් ගොඩනැගිලි රාශියක් ඉදි වී අධ්‍යාපනයේ විශාල දියුණුවක් ඇතිවී තිබෙනවා.

අධ්‍යාපනයට ලබා දිය හැකි ඉතාම වැදගත් පහසුකමක් ගැන මම මතක් කරන්නට සතුටුයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ගුරුවර ගුරුවරියන් පක්ෂ භේදයෙන් තොරව, ඔවුනොවුන්ගේ ගම් ප්‍රදේශවලම සේවයෙහි යෙදවිය යුතුයි. පාසලට උදේ පහසුවෙන් යන්නටත්, පාසල අවසන් වී පහසුවෙන් එන්නටත් පුළුවන් වන ආකාරයට පදිංචි ස්ථානයට සමීප පාසල්වලට පත්වීම් ලබාදීමේ වැඩ පිළිවෙළක් අපි ඇතිකරගත්තොත් අපේ අධ්‍යාපනය මීට වඩා උසස් තත්ත්වයකට පත්කරගන්න පුළුවන් වෙනවා. එනිසා මේ ගැන ගරු මුදල් ඇමතිතුමාගේත්, අධ්‍යාපන ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්නැයි මම ඉල්ලා සිටිනවා. මෙය දේශපාලන පක්ෂ භේදයෙන් තොරව කලොත් එය අපේ අධ්‍යාපනයට කරන උසස්ම සේවය වනවාට කිසිම සැකයක් නැහැ.

මේ කටයුත්තේදී කෙනෙක් කියන්නට පුළුවන්, මේක කළහැක්කේ කොළඹ දිස්ත්‍රික්කයේ පමණක්ය, බදුලු දිස්ත්‍රික්කය, මොනරාගල දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය ආදී දිස්ත්‍රික්කවල සුදුසුකම් ඇති ගුරුවරුන් සොයාගැනීම අපහසුය කියා. එහෙමනම් තිබෙන්නේ ඒ ඒ දිස්ත්‍රික්කවලට යන්න කැමති ගුරුවරුන්ට නිවාස පහසුකම් දීලා — අළුතින් නිවාස හදා දීලා හෝ රජයේ නිවාස අරගෙන දීලා — ඔවුන් ඒ පළාත්වල පදිංචි කරවා ඒ ඒ පළාත්වල පාඨශාලා දියුණු කිරීමයි. මේ අනුව මොනරාගල දිස්ත්‍රික්කය, සබරගමු දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය හා අනුරාධපුර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්ක පාඨශාලා දියුණු කරන්නට විශේෂ වැඩ පිළිවෙළක් යොදන්නටය කියා මම ඉල්ලා සිටිනවා.

අයවැය ලේඛණයකින් බඩු මිළ අඩු කරනවාට වඩා හෝ බඩු මිළ ශත පහකින් වැඩි කරනවාට වඩා පස් අවුරුදු සැලැස්මක් ඇති කර තිබීමෙන් අපට යම්කිසි වැඩපිළිවෙළක් අනුව ඉදිරියට ගමන් කරන්නට පුළුවන් වෙනවා. මම එසේ ප්‍රකාශ කරන්නේ මෙන්න මේ නිසයි. අයවැය ලේඛණයක් ගැන කථා කරනකොට හුඟක් දේවල් ගැන කථා කරන්නට වෙනවා. ප්‍රවාහණ සේවාව ගැන කථා කළත් එයත් අයවැය ලේඛණයට සම්බන්ධ වෙනවා. ඒ අංශයෙනුත් ගරු මුදල් ඇමතිතුමාට මුදල් බේරා ගන්නා ක්‍රම තිබෙනවා. මේ අවස්ථාවේ මේ අයවැය ලේඛණය ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපි ස්තුති කරන අතරම අපට බර හුඟක් පැටවෙන්නේ නැතිව, මීටත් වඩා සැහැල්ලු අයවැයක් එතුමාට ලබන අවුරුද්දේ ඉදිරිපත් කිරීම සඳහා අපි දන්නා දේවල් ඉදිරිපත් කිරීම අපේ අරමුණ වියයුතුයි. මගේ අරමුණ නම් ඒකයි. මන්ද, මම ආර්ථික විශේෂඥයෙක් නොවන නිසා, මම මගේ ඡන්ද කොට්ඨාශයේම පදිංචි කරුවෙකු නිසා ගමේ මිනිසුන් මට ඇවිල්ලා කියන දේවල් මේ ගරු සභාවට මම ඉදිරිපත් කරන්නට ඕනෑ.

සමහර උදවිය කොළඹ කච්චේරියෙ රක්ෂාවට එන්නේ වාද්දුව වගේ දුර පළාත්වල ඉඳලයි. වාද්දුවෙන් උදේ පාන්දර පහට බස් එකට නැග්ග පුද්ගලයාට කොළඹ කච්චේරියට එන්න වෙන්නේ උදේ නවයට, දහයට නැත්නම් දහය හමාර පමණ වෙන විටයි. කාර්යාලයට පැමිණීමේ පොතේ නම අත්සන් කර තිබෙන්නේ උදේ 8.30 ටයි. කොහොමද දෙයියනේ, ඒ පුද්ගලයා ඔය වෙලාවට එන්නේ ?. කල්පනා කර බලන්න. හරි අමාරුයි එන්න. වාද්දුවේ ඉන්න පුද්ගලයා වාද්දුව පැත්තේ කාර්යාලයකට දාලා කොළඹ ඉන්න පුද්ගලයකු කොළඹට ගත්තොත් කොච්චර ලේසිද කියලා මම අහන්නට කැමතියි. මේ විධියේ ක්‍රමයක් අපි සකස් කර ගත්තොත් මුදල් ඇමතිතුමාට විශාල මුදලක් ඉතිරි වෙනවා. අපිටත් බස් ගමනාගමනය පහසු වෙනවා. බස්වල තෙරපිලා එන්න ඕනෑ නැහැ. බස් සේවය ගැන මෙන්න මේ කාරණය සඳහන් කළයුතුයි. මා ළඟ තිබෙනවා " ආර්ථික හැඩගැස්ම, 1984 – ප්‍රථම භාගය " නමැති පොත. එය ශ්‍රී ලංකා මහා බැංකුවෙන් ඉදිරිපත් කළ වාර්තාවක්. ඒ වාර්තාවේ ප්‍රවාහණය ගැන මෙන්න මේ විදියට කියලා තිබෙනවා :

උතුරු මැද පළාතට ඒ කාලයේ ගිය අපේ අත්තලා මුත්තලා මැරිලා. දැන් එහි සිටින්නේ තුන්වැනි හතරවැනි පරම්පරාවයි. ඒ අයට පසුගිය විසි වැනිද මම කිව්වා බෝධි පූජා පවත්වමු කියා. දේශපාලන පක්ෂ භේදයෙන් තොරව මින්නේරියේ ඇති හැම පන්සලකටම ඒ තරුණ තරුණියන් දහස් ගණනින් රැස්වෙලා එද බෝධි පූජා පැවැත්තුවා. උදය දනය, දවල් දනය ආදිය සූදනම් කළා. මම ඒ තරුණ තරුණියන්ගෙන් ඇහුවා—ඒ අයගේ වයස අවුරුදු විස්ස විසිපහ පමණ නිසා—ඒ අය මේවා කරන්න සහභාගි වන්නෙ ඇයි කියා. ' අපේ අත්තලා මුත්තලාටත් මේ ගමන්ම පින් දෙන්නයි අපි ආවෙ ; අපට ජන කතා අසන්නට ලැබී තිබෙනවා ; අශ්වයෙකුත් රේල්ලුවේ දමාගෙන එතුමා මේ ජනපදයට ඇවිල්ලා—මේක මේ ලංකාවෙ ඉතිහාසය—අපේ දුක සැප බැලුවාය ' කියා උත්තර දුන්නා. " අර කොමියුනිස්ට් කාරයොත්, සමසමාජ කාරයොත් ටිකක් අපේ ගම්වලට ඇවිත් කෑගල්ල දිස්ත්‍රික්කයෙන්, කොත්මලෙන් මිරිගමින් යන අයට කිව්වාය, ' අනේ අප්පච්චියේ, සහෝදරයෝ යන්න නම් එපා, ඔකේ ඉන්නවා කාක්කො තරම් මදුරුවො ඒ නිසා මැරෙන්න යන්න එපා, ඕවායේ ගිහින් වනාන්තරවල ජීවිතය ගත කරන්න ඕනෑ නැහැ, හාල් සේරුව සත හයයි " කියලා ඒ මුතුන් මිත්තන්ට කිව්වාලු. අද ඒ අය ඒ අන්දමටම තමයි මහවැලිය ගැන කියන්නෙත්. මහවැලිය කරන්නේ මොකටද, ඕකට අපේ සල්ලි වියදම් කරන්නෙ ඇයි, අපේ අයවැය ලේඛනයෙන් සියයට 10 ක්, 15 ක්, ඕකට පොළිය ගෙවන්න ඕනෑ නේද ආදී වශයෙනුයි කියන්නෙ. 1970 දීත් ඔය රෙකෝඩ් එකමයි ගැහුවෙ. මහවැලියෙ වැඩ කරන්න ජන්දය දෙන්න එපාය, හත් මුතු පරම්පරාවටම ඔය ණය ගෙවන්න වෙනවාය කියලයි එනකොටත් කිව්වෙ.

එද දූරදර්ශී කල්පනාවක් ඇතිව, ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කැබිනෙට්ටුවේ මුදල් ඇමති වශයෙන් සිටි, අපේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාණෝ අපට කිව්වා, එද ජයවර්ධන මැතිණියත් සමග 1943 දී මේ වැව් අමුණු බැලීමට මින්නේරියට ගිය බව. එතුමා නැවත වරක් තම නායකයින්ගේ අඩිපාරේ යමින් එක්සත් ජාතික පක්ෂය නංවා සිටුවමින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිස් අවුරුද්දකටවත් කරන්නට බැහැ කී ඒ මහා යෝධ මහවැලිය දැන් සම්පූර්ණ කර තිබෙනවා. අපි කියන්නෙ නැහැ සියල්ල සම්පූර්ණයි කියා. කොටසින් කොටසයි අවසන් කෙරෙන්නෙ. මම ග්‍රාමසංවර්ධන ඇමතිණිය වශයෙන් 1977 දී ඒ දුප්පත් ගම්වලට ගියා. ඒ ජනතාව වෙසෙන තැන්වලට මම ගිහින් ඔවුන්ගේ දුක සැප දෙකට පිහිට වෙනවා. එනිසයි මෙවර අතුරු මැතිවරණය සම්බන්ධ එක්සත් ජාතික පක්ෂයේ පළමුවැනි රැස්වීම 15 වැනිදා මම ගියාට පසුව පැවැත්තුවේ.

තිල්පාවින්, රතුපාටින්, එහෙත් මෙහෙත් වේදිකා ගහගෙන තිබුණත් ඒ ප්‍රදේශයේ මිනිස්සු ගියේ නැහැ ඒවාට, තමන්ගේ ගෙවල්වලම සිට ඒවාට ඇහුම්කන් දුන්නා හැරෙන්නට. ජනතාව පිළිගත්තා නායකයෙක් එනතුරු ඒ ජනතාව එළියට අවෙවත් නැහැ. අපි එනව දැකලා ආසාවට දුව දුව ගිහින් රැස්වීම් පටන්ගත්තා. අපේ මන්ත්‍රීවරුන් ටිකක් පැමුණුනාට පසුව සියලුදෙනාම එක්රැස්වී වැඩ කළා. ඒ ඇයි ? ඒ ජනතාවට පෙනී යනවා අද, ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ ප්‍රතිපත්ති හොඳයි, මේ මහවැලිය නිසා අපට දියුණුවක් තිබෙනවා, ආදී වශයෙන්.

මේ මහවැලියෙන් අපට ලැබෙන ප්‍රයෝජනය කුමක්ද කියන එකයි මම රැස්වීම්වලදී විස්තර කර දුන්නෙ. මම අහගෙනයි විපක්ෂයෙන් කියනවා, " අනේ මේ ඇමතිතුමිය නම් අපි කාටවත් බණින්නේ නැහැ, ගිය ගිය තැන කියන්නේ මහවැලියේ අගයයි " කියා. ඇයි එය කියන්නෙ නැතුව වෙන මොකක්ද මම කියන්නේ ? " තරුණ තරුණියනි, අනාගතය ඔබේ අතෙයි ; තරුණ ශ්‍රමය තමයි රටක් නංවන්නේ ; එහෙම නම් ලෑස්ති වෙන්න කුඹුරුට බහින්න. මහවැලි වතුර මින්නේරියට එනවා, පොළොන්නරුවට එනවා, ඒ දිය දෝතින් බඳගෙන ඒ සමග ඉහළට නගින්න " කියා මම ඒ අයට කිව්වා. අක්කර තුනහමාරක් පහක් පමණ දුන්නාම ගොවිතැන් කර, ගේ දොර හදගෙන කෙත් වතු වවාගෙන හොඳ ආදායමක් ලබාගන්න පුළුවන්. ඒ මගින් ඇඳුම් පැළඳුම් ආදියත් ලබාගෙන මේ ජලයෙන් ලැබෙන විදුලියෙන් ආලෝකයත් ලබාගෙන ඒ විදුලි ආලෝකය ගම්වලට ගෙන ගිහින් ගම්වල පාසල්වල විද්‍යාගාර ආදිය ඇති කරමින් රැකීරක්ෂා ප්‍රශ්නය විසදාගන්න පුළුවන්. ජනගහන ප්‍රශ්නයත් විසදාගන්න පුළුවන් ඒ මගින්.

අවිවාහක අයට මහවැලි ඉඩම් දෙන්නෙ නැත කියන ගැසට් නිවේදනය දුටු ගමන් අපේ තරුණ තරුණියන් පරීක්ෂණයට දවස් දෙකක් තිබියදී ගිහින් විවාහ වුණා, මහවැලියෙන් ඉඩම් ගන්න.

මම නැවත මහවැලිය ගැන කියන්නම්. මහවැලියෙන් ඉඩම් දෙන්නට ගැසට් නිවේදනය නිකුත් කළොත් සමගම අපේ ආසනවල තරුණයින් ඉඩම් ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා පරීක්ෂණයට නියමිත දිනට කලින්—දවස් දෙකක් තබා—විවාහ වුණා. හදිසියෙන් බැන්දෙ ඇයි කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මහත්මිය]

ඇසූ විට කසාද බැන්දේ නැත්නම් යන්න අමාරුයි ; ඒ නිසා කසාද බැඳලා මනමාලියත් සමඟම ඒ ඉඩම්වලට යනවාය කියනවා. එවිට මම කිව්වා අපි ඔක්කොම එකතු වී ගලිගමුවෙන් යන පිරිස කැන්දගෙන යනවාය කියා. සමහරු තමන් කරන රැකීරක්ෂා පවා අතහැර දමා යනවා. රක්ෂාවල් කළාට සත 5 ක් ගෙදරට ගෙනියන්න බැරි යයි ඔවුන් කියනවා. පසුගිය කාලයේ ඉංග්‍රීසිකාරයින්ට අපේ ගම්වලට ඇවිත් අක්කරය සත 50 බැගින් ඉඩම් අරගෙන තේවතු, රබර්වතු වවන්නට පුළුවන් වුණා නම් රටේ ආර්ථිකය නැති කරන්නට ත්‍රස්තවාදීන්ට පුළුවන් නම් අපි අපේ ත්‍රස්තවාදයත් අරගෙන කොළපාට විප්ලවයක් කරනවා, අපේ විප්ලවය නම් වැව් අමුණුවල තිබෙන කොළපාට වතුර අරගෙන වී ගොවිතැන පමණක් නොවෙයි එළවළු ගොවිතැන හා හරක් ඇති කිරීමයි කියනවා. එවිට ට්‍රැක්ටර් නැති කර, රසායනික පෝර යෙදීම නතර කර,පොහොර ලෙස ගොම යොදගෙන වගා කටයුතු කරන්න පුළුවන්. එමෙන්ම ඒ ඒ ප්‍රදේශවල පාසැල්, ඉස්පිරිතාල සහ කර්මාන්තශාලා ආදිය ඇති වීමෙන් ඒවායෙනුත් යම් යම් සංඛ්‍යාවකට රක්ෂා ලබා ගන්නට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහවැලිය යටතේ නන්තිරිගල කොත්මලේ ආදියට වැය කරන මුදල් අපතේ යනවාද, රටේ සෞභාග්‍යය නැවත වරක් ඇති කිරීමට අපේ පැරණි සිංහල රජදරුවන් ගිය පාරේ අපිත් යනවාද කියන එකට මේ අයවැය ලේඛනයෙන් පිළිතුරක් සපයා තිබෙනවා. එය කටවචනයෙන් දුන් පිළිතුරක් පමණක් නොවෙයි. මේ අවුරුද්දේ සිට හාල් පිටරටින් ගෙන්වන්නේ නැහැ. 1977 මම නාවික ඇමති තනතුරට පත් වන විට වරායේ කම්කරුවන් හඩ හඩා සිටි හැටි මට මතකයි. ඔවුන් වෙරළට වී සිටිනවා, සීනි නැව් නැහැ ; හාල් නැව් නැහැ ; රෙදි නැව් නැහැ කියා. බත්මුල විකුණාගෙන මිස ගෙදරට යමක් ගෙනියන්නට විධියක් නැහැ, ඒ නිසා මේ රජයේ පිහිටෙන්වත් අපවත් නැගිටවන්නැයි ඒඅය කිව්වා. මහවැලියේ පිහිටෙන් වරායේ කම්කරුවන්ට කොතරම් ආදායමක් ලැබෙන්නට ඇද්ද ? මහවැලියට ගෙන්වූ ට්‍රැක්ටර් බුල්ඩෝසර් ආදි නොයෙකුත් භාණ්ඩ වරායෙන් ගොඩබාන විට කම්කරුවන්ට රක්ෂාව ලැබෙනවා. ඒ නිසා ඔවුන්ගේ ආදායම වැඩිවුණා. එමෙන්ම වැඩි වැඩියෙන් සේවකයින් බඳවා ගන්නවා. ඒ වාසි ඔක්කොම යන්නේ ජනතාවටයි.

එපමණක් නොවෙයි. ඉන්ධනවලින් ක්‍රියා කරන විදුලිබල උත්පාදක යන්ත්‍ර සඳහා විශාල මුදලක් වියදම් කරන්නට සිද්ධ වෙනවා. ගරු කර්මාන්ත ඇමතිතුමා මෙතන ඉන්නවාද මම දන්නේ නැහැ. එහෙත් මෙහෙන් ඔළුවකුත් අතකුත් පෙනෙනවා. ඒ කර්මාන්ත ඇමතිතුමා වෙන්න ඇති. මහවැලිය මගින් ඇති කරන යෝධ ජලවිදුලි බලාගාර නිසා ඉන්ධන වැය නොකොට විදුලියත් ලබා ගන්නට පුළුවන්. එවිට මෙතෙක් ඉන්ධන සඳහා වියදම් කළ මුදලත් ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා. මේ හැම එකක්ම එකින් එක දම්වැලක පුරුක් වගේ සම්බන්ධ වෙනවා. මේවා ගැන අද හිනා වෙන හා කොලොප්පම් කරන උදවිය ඉතිහාසය දෙස බලන්න ඕනෑ. මියගිය අයට දොස් කියන එක හරි නැහැ. එහෙත් මෙය මතක් කරන්න ඕනෑ. අර්ථ ශාස්ත්‍රය දන්නා අය එද කිව්වා සත 6 ට හාල් සේරුව ගන්න පුළුවන්කම තිබෙන නිසා වී ගොවිතැන් කරන්නට එපාය කියා. එසේ කී සම සමාජ-කොමියුනිස්ට් පක්ෂවල නායකයින්ගේ නාම ලේඛනයට තමුන්නාන්සේලාත් එක් වන්නට එපා යයි විරුද්ධ පාර්ශවයේ සිටින තරුණ මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලනවා.

මට මින්නේරියේදී අසන්නට ලැබුණු දෙයක් මතක් කරන්න කැමතියි. මම එහි තරුණයින් සමඟ කථා කරන විට ඒ අය හොඳ හොඳ දේවල් කිව්වා. ඒ තරුණයින් මා සමඟ කිව්වා ගොවිතැන ගැන මෙහේදී නම් කථා කරනවා, නමුත් පාර්ලිමේන්තුවේදී අපි ගැන කථා කරන්නේ නැහැ. අපට වතුර නැහැ, ඉඩම් දීලත් නැහැ, ඔප්පුත් නැහැ, අපි තවම ඉන්නේ පැල්පත්වල, ඒවා ගැන කථා කරන්න කෙනෙක් නැහැ කියා. " ඇයි අපි කථා කරනවා " යයි කිව්වම ඒ අය කියනවා " අනේ නැහැ. අපි හැන්සාඩ් අරගෙන කියවනවා. හැන්සාඩ් වාර්තාවල නම් ඒවා ගැන කළ කථා දකින්න නැහැ " කියා. දැන් ගම්වල ඉන්නේ උගත් අයයි. මින්නේරියෙන් එව්වේ ජනපද වැසියෙක්ය, ගොවි පුතෙක්ය කිව්වාට එතුමා උපාධිකාරයෙක්—උපාධිධරයෙක්. මෙහේ වගේ කරදරයක් නැතිව එහාට වී විවේකීව ඉන්නා විට බණපොත වගේ මේවා—හැන්සාඩ් වාර්තා ආදිය—අරගෙන ගිහින් කියවා ප්‍රශ්න අහන විට උත්තර දෙන්නකෝ. මම ඒ අයට කිව්වා, " ඔය කියන දේවල් ගැන අපි පාර්ලිමේන්තුවේදී නොවෙයි, කථා කරන්නේ, කැබිනට් එකේදී අපි ඒවා කථා කරනවා ; ගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා ගරු මුදල් ඇමතිතුමා ආදී හැම කෙනෙක්ම එතන ඉන්නවා ; ඒ නිසා එතනදී මේවා හද එව්වාම නැවත ඉතින් පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන දවසක මිස වැඩිපුර කථා කරන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ," කියා.

ලංකාවේ සිටින සියයට 80 ක් පමණ වූ ග්‍රාමීය ජනතාවගෙන් සියයට 60 ක් පමණම ගොවි ජනතාවයි. ඒ ගොවි ජනතාවගේ ජන ජීවිතය ගැන මෙ පාර්ලිමේන්තුවේදී අපි මොකක්ද කරන්නේ ? ඒ ප්‍රදේශවල උදවිය අපි එහාට ගියාම මේ ගැන අපෙන් ප්‍රශ්න කරනවා. එයට හේතුවක් තිබෙනවා. කම්කරු ජනතාවට ලැබෙන සහන මොනවාද කියා තමුන්නාන්සේ දන්නවා. කම්කරු නායකයන් අදත් ඉන්නවා. 'ට්‍රේඩ් යූනියන් ' තිබෙනවා. ඒ මගින් නොයෙකුත් ඉල්ලීම් ඉදිරිපත් කරනවා. තේවතුවල වැඩ කරන කම්කරුවන්ට අවුරුද්දෙන් අවුරුද්ද පඩි වැඩි කරනවා. ඒ හැර තවත් නොයෙකුත් වරප්‍රසාදත් ඒ අයට ලැබෙනවා. නමුත් ගොවි ජනතාවට ලැබෙන සහන මොනවාද ? අවුරුදු තුනක් පිට පිටම වර්ෂාව නොලැබී යාම නිසා පොළොව වේලුණා. ගොවි ජනතාවට සහනාධාර වශයෙන්ය කියා කෝටි ගණනක ධනස්කන්ධයක් වැය කළා. ඒ මුදල් සමහර අයට ලැබෙන්න ඇති. නමුත් සමහර අයට ඒ මුදල් ලැබුණෙත් නැහැ කියල අපි ගියාම කන්නලව් කරන්න යෙදුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොහොර සහනාධාරය දීම ඉතාම වටිනා දෙයක් බව මම මතක් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මම ගරු මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. පොහොර සහනාධාරය දෙන විට එය ඇත්ත වශයෙන්ම සහනාධාරයක් හැටියට සැලකිය හැකි වන සේ අපි ක්‍රියා කරන්න ඕනෑ. මා එසේ කියන්නේ මෙන්න මේ හේතුව නිසයි. මේ මුදල් දෙන්නෙ බැංකු මගින්. නමුත් මේ බැංකුවලින් අය කරන පොළිය ටිකක් වැඩියි. මම මේ අන්දමට කථා කරන විට " කැබිනට් මණ්ඩලයේ ඉඳගෙන මෙතැන මොනවද කථා කරන්නෙ " කියල සමහර විට ඇතැම් අය අහන්න පුළුවන්. ඒ ගැනත් හිතන්න ඕනෑ තමයි. ගොවිතැනට පමණක් නොවෙයි. වෙන දෙයක් නියා එළදෙනෙක්, කුකුළෙක්, ගන්නට අවශ්‍ය මුදලක් පවා බැංකුවෙන් ණයට ගන්නට හුඟක් අය කැමති වෙන්නෙ නැහැ. ඇයි ඒ ? සියයට 20 ක නැත්නම් සියේට 25 ක පොළියකට ණයක් අරගෙන එවැනි දෙයකට යෙදවීමෙන් ලාභයක් ගන්න බැරි බවයි ඒ උදවිය කියන්නෙ. ඒ නිසා බොහෝ අය බැංකුවලින් ණය ගන්නෙ නැහැ. බැංකුවලින් ණයට මුදල් අරගෙන වැඩියෙන් වැඩ කරගන්නෙ යාපනයේ ඉන්න අයයි. අපේ කාන්තාවන් වගේ නොවෙයි, යාපනයේ කාන්තාවන් රන්තරන්මයි අඳින්නෙ. පළඳින්නෙ. ත්‍රස්තවාදීන් බැංකු කඩා හොරකම් කරගන්නෙ ඒ උදවියගෙ කණකර බඩු ටික තමයි. යාපනයේ ඉන්න අය බැංකුවලින් සල්ලි ගන්නෙ ඒ කණකර බඩු බැංකුවල තියලයි. ඒවා නනී රන්තරන් නිසා බැංකුවලට ගන්නවා. ඒ රන්තරන් ටික ඔක්කොම අරගෙන ත්‍රස්තවාදීන් අපේ ආර්ථිකය කඩා කප්පල් කිරීමට කටයුතු කරනවා. අපේ ආර්ථිකයට හානි කිරීම පිණිස ඒ රන්තරන් යොදවා ගත් බව අපි හිතට ගන්නට ඕනෑ. ඒ නිසා ඒ කටයුතුත් අපි වළක්වන්න ඕනෑ. ඒ සමඟම අපේ ගොවි ජනතාවගේ සුරක්ෂිතභාවය, දියුණුව පිණිසත් අපි ක්‍රියා කරන්න ඕනෑ. ඔවුන්ගේ සුරක්ෂිත භාවය සඳහා, දියුණුව සඳහා පිළියම් එකක් දෙකක් පමණක් ප්‍රමාණවත් වන්නෙ නැහැ. පොහොර මිල හැකි තරම් අඩු කිරීම ඔවුන්ට දෙන විශාල සහනයක් වෙනවා.

අපි දන්නවා, පසුගිය රජය කාලයේ පොහොර ගෙන්නුවේ නැහැ. ගොවියාට අවශ්‍ය උදැල්ල තිබුණේ නැහැ. කුඹුරට අඳින ලේන්සුව ගන්න තිබුණේ නැහැ. ඒ මිනිසුන් එද ජීවත් වුණේ අල බතල, නැත්නම් ගස්වල පොතු කාලයි. හොරොව්පතාන පැත්තේ මිනිසුන් කරත්ත බැඳගෙන ගිහින් මීවද කඩාගෙන ඇවිත් කැවා. ගස්වල පොතු ආහාරයට ගත්තා. අන්න ඒ වගේ තත්ත්වයකින් ජීවත් වුණු උදවියට අද විශාල සහනයක් ලැබී තිබෙනවා. ඔවුන්ට ලබා දී තිබෙන සහන ගැන උදම් අන අනා අපිට ආඩම්බර වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ අතරේ දිය යුතු තවත් සහන කීපයක් තිබෙනවා. මැලේරියා රෝගය මර්ධනය කිරීමට පියවර ගත යුතුව තිබෙනවා. අර සම සමාජ පක්ෂයෙ උදවිය කිව්ව වගේ කාක්කො තරම් මදුරුවන් නම් අද එහෙ නැහැ. නමුත් ගිය අවුරුද්දෙත් මහවැලි ප්‍රදේශය ආදී ප්‍රදේශවල මහා භයානක අන්දමට මැලේරියා රෝගය පැතිරී ගියා. ගලිගමුවෙත් ඒ රෝගය තිබුණා. කම්කරුවන්ට වඩා ගොවි ජනතාව මහන්සි වෙනවා. ගොවියා දුර්වල වුණොත් වැඩ කරන්න බැහැ. ඉස්සර ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේදී කම්කරු සලාකයට වැඩියෙන් හාල් සේරුවක් දුන්නා. කම්කරුවා හොඳට දෙවේලට බත් කන්න ඕනෑ, ඔවුන්ට හොඳට ශක්තිය තිබෙන්න ඕනෑ කියලයි ඒ විධියට දුන්නෙ. කුඹුරු වැඩ කරන මිනිසාටත් ශක්තිය තිබෙන්නෙ ඕනෑ. ට්‍රැක්ටර්වලින් හැම දෙයක්ම කරන්න බැහැ. දැන් ගැහැණු උදවියත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවිතැන් වැඩ කරනවා. පවුල් වශයෙන් ඇවිත් ගොවිතැන් වැඩවල යෙදෙනවා. ඒ නිසා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටත්, ඔවුන්ගේ දරුවන්ටත් හොඳ ආහාර වේලක් – පෝෂ්‍යදායක ආහාර වේලක් ලැබෙන්න ඕනෑ.

මැලේරියා රෝගය තුරන් කිරීමට අවශ්‍ය බෙහෙත් වර්ග අඩු නැතිව ලැබෙන්න ඕනෑ. අමෙරිකානු රජයෙනුත් අපට ඒ සඳහා ආධාර ලැබී තිබෙනවා. මැලේරියා මර්ධන බෙහෙත් විදින අයට ඒ සඳහා අවශ්‍ය දේවල් අපි සපයා දෙන්න ඕනෑ. ඒ කටයුත්ත භාර කණ්ඩායම් තවම ඒ වැඩ කටයුතු ආරම්භ කරලත් නැහැ. නැවතත් වරක් මැලේරියා වසංගතය පැතිරී ගියොත් මේ අයවැය ලේඛනයෙන් කරන්න සූදනම් වන හැම දෙයක්ම සුන් වී යන්න පුළුවන්. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් ක්‍රියා කිරීම අපේ පරම යුතුකමක්. අපේ රටේ කෘෂිකර්මය දියුණු කිරීමට මේ රජය විශාල පරිශ්‍රමයක් දරනවා. ඒ සමගම අපේ රටට වුවමනා කරන තවත් දේවල් තිබෙනවා. අපේ රට කෘෂිකාර්මික රටක්. මේ වර්ෂයේ ආදායමෙන් සියයට 60ක් ලැබී තිබෙන්නේ කෘෂිකර්මයෙනුයි. දැන් සහල් පමණක් නොවෙයි, කරාබු නැටි, ආදී කුළු බඩු වර්ග, අන්නාසි වැනි පලතුරු වර්ග පොල් ආදිය පිටරට යවනවා. එම නිසා කෘෂිකාර්මික රටක් වශයෙන් කර්මාන්ත දියුණු කරන අතරම කෘෂිකර්මාන්තයට ප්‍රමුඛත්වයක් දීමට ක්‍රියා කරන්න ඕනෑ. අපේ මුදල් ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරමින් කෘෂිකර්මාන්තය ආරක්ෂා කිරීමට පියවර ගෙන තිබෙනවා. තේ මිල වැඩි වන ඇතැම් කාලයට රබර් මිල අඩු වෙනවා. මේ අතර කෝපි මිල වැඩි වීම නිසා එයින් සමහරුන්ට යම් සහනයක් ලැබෙනවා.

දැන් යෝජනා කර තිබෙනවා, රබර්වලට "Stabilization Fund" යනුවෙන් අරමුදලක් ඇති කරන්නට. වැඩි වන ආදායමෙන් කොටසක් මේ අරමුදලෙහි තැන්පත් කලාම එයට පොලියකුත් ලැබෙනවා. තේ වතුවල ආදායම් අඩු වෙන විට උඩරට සුළු තේ වතු හිමියන් හිඟන්නන් බවට පත් වෙනවා. ඒ අයට ඉවසන්නට බැරි තැන උදැල්ල අරගෙන පොලොව කොටා මඤ්ඤොක්කා වගා කරනවා. වියදම් තත්ත්වය ඔරොත්තු දෙන්නේ නැති වන විට, නිෂ්පාදන විකුණා ගන්නට බැරි වන විට ඔවුන් ඒ තත්ත්වයට පත් වනෙවා. එම නිසා, ඒ වාගේ වගාවල යෙදී සිටින අයට මේ "Stabilization Fund" කියන අරමුදලෙන් විශාල සහනයක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මුදල් ඇමතිතුමා මේ තත්ත්වය ගැන හොඳාකාරව දන්නවා. එතුමා එන්නේ බුලත්සිංහල ආසනයේ ඉඳලයි. බුලත්සිංහල ප්‍රදේශය ගැන මමත් දන්නවා. එම ප්‍රදේශයේ රබර් වගාවේ යෙදී සිටින උදවිය අද ජීවත් වෙන්නේ අසහනයෙන්. ලැබෙන ආදායම වියදමට මදි. එපමණක් නොවෙයි, කඳු කඩා වැටීම රබර් ගස් යටවීම නිසා ණයට මුදල් ලබා ගෙන රබර් වගා කළ ඒ ඇත්තන්ට දැන් ණය ගෙවා ගන්නට බැහැ. නමුත් ඒ ණය කෙසේ හෝ ගෙවන්නට සිදු වී තිබෙනවා. ඒ ගැන සැලකිල්ල යොමු කර එයින් ඒ උදවිය මුද ගැනීමට කටයුතු කරනවා ඇතැයි විශ්වාස කරනවා. බුලත්සිංහල ආසනය ඇතුළු කළුතර දිස්ත්‍රික්කයේ මෙම පුනරුත්ථාපන කටයුතු සඳහා මුදල් ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු වෙනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

කෘෂිකර්මය ගැන කථා කරන විට හාල්වලින් පමණක් නොවෙයි, වෙනත් අතුරු භෝගවලිනුත් රට ස්වයම්පෝෂිත කළ යුතුයයි මම කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1982 දී අපේ මහලේකම්තුමාත් ඇතුළු පාර්ලිමේන්තු කණ්ඩායමක් සමග මම ' ෆිජී ' රටට ගියා. ඒ රට අපේ රටට වඩා කුඩා රටක්. ඒ රටේ ජනතාව ජීවත් වන්නේ උක් කර්මාන්තයෙන්. ගෘහ කර්මාන්තයක් වශයෙන් අක්කර දහස් ගණනක උක් වගා කරනවා. උක් කපන කාලය උක් කැපීම සඳහා අපේ දෑකැත්තට වඩා මදක් දිග උපකරණයක් ඒ අය පාවිච්චි කරනවා. කපන උක් බර කරත්තවල පටවා ගෙන ට්‍රේන් එතැනින් කුඩා රේල්ලුවලට දමා ගෙන, එහි තිබෙන එකම ලොකු ෆැක්ටරියට ගෙන යනවා. එහි නිෂ්පාදනය කරන්නේ දුඹුරු සීනියි. දුඹුරු සීනි ලාභයි. ඒවා සුද්ධ කරන්නට ඇමරිකාවට, ඉන්දියාවට යවනවා. නමුත් ඒ රටේ අය ආහාරයට ගන්නේ දුඹුරු සීනියි. සීනි නිපදවීමේදී ලැබෙන " residue " මොලසස් හදන්න, බීර හදන්න, වෙනත් බීම වර්ග හදන්න යොදා ගන්නවා. සීනි කර්මාන්තය මේ රටේ ඉතාමත්ම දියුණු මට්ටමක පවතිනවා. උක් වගා කරන ප්‍රදේශවල ගම්මාන පිහිටුවා තිබෙනවා. ළදරු පාසල් සහ සාමාන්‍ය පාසල් පිහිටුවා තිබෙනවා. මේ හා සමාන වැඩ පිළිවෙළක් අපේ රටෙත් ආරම්භ කර තිබෙනවා. එමගින් රටට අවශ්‍ය සීනි නිෂ්පාදනය කරන්නට පුළුවන් වනවා වාගේම විශාල පිරිසකට රැකියා සපයන්නටත් පහසුකම් සැලසෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට හාල්වලින් ස්වයම්පෝෂණය කලාක් මෙන් 1989 ට පෙර සීනිවලින්ද ස්වයම්පෝෂිත කරන්න පුළුවන් වෙයි. එවිට, අපට හාල් ටික තිබෙනවා. එළවළු ටික තිබෙනවා. කිරි එළදෙනුන්ගෙන් කිරි ටික ලැබෙනවා. මුං ඇට, මෑ, සෝයා බෝංචි ආදී ධාන්‍ය වර්ග ටික තිබෙනවා. සීනි ටික තිබෙනවා. එහෙමනම් ඒ කාලය වන විට විරුද්ධ පක්ෂය කියයි, අපට විරුද්ධ වෙන්නට දෙයක් නැහැ කියල. එහෙමනම් ඒ කාලය වන විට විරුද්ධ පක්ෂය අප සමග එකතු වෙනවාට කිසිම සැකයක් නැහැ. එහෙම කරන්නේ නැතුව රජයට විරුද්ධව ක්‍රියා කලොත් " මුන් වාගේ ජාතියක්, මෙපමණ වැඩ කරලත් රජයට බනිනවා " කියලා මිනිසුන් විරුද්ධ පක්ෂය සමග තවත් කලකිරෙයි. අපි මේ වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කර ගෙන ගියොත් මේ දෙකෙන් එකක් සිදු වෙයි. අයවැය ලේඛනයෙන්ම මේක කරන්නට බැහැ. අපේ මන්ත්‍රීවරු ටිකටයි, විරුද්ධ පක්ෂයටයි මේක කරන්නට බැහැ.

අපේ වත්තල මන්ත්‍රීතුමා (ජේ. ඒ. ඊ. අමරතුංග මහතා) කිව්වා වාගේ අපේ පාලන ක්‍රමයෙහිත් කිසියම් වෙනසක් සිද්ධ වෙන්න ඕනෑ. අපේ රටට නිදහස ලැබුණත් අධිරාජ්‍යවාදීන් අවුරුදු එකසිය විසි පහක පමණ කාලයක් ගෙන ගිය ක්‍රමයමයි අදත් ගෙන යන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ " වොක්සි කොමිෂන් සභාව " යනුවෙන් කොමිෂන් සභාවක් පත් කර තිබුණා. ඊකට සාක්ෂි දෙන්නට ගම්කාර්ය සභාවක සභාපති වශයෙන් සහ දිස්ත්‍රික්කයේ ගම්සභා සම්මේලනයේ සභාපති වශයෙන් මමත් කෑගල්ලේ කච්චේරියට ගියා. එම කොමිසමේදී අප කියා සිටියා, මෙම ගම්සභා ක්‍රමය, කච්චේරි ක්‍රමය අහෝසි කළ යුතුය කියා. දැන් සංවර්ධන සභා ඇති කිරීමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන් යම් යම් කටයුතු විමධ්‍යගත කර සුළු සුළු වෙනස්කම් ඇති කර තිබෙනවා. නමුත් අපි සතුටට පත් වුණේ නැහැ. අපි කියන්නෙත් ගම් සභාවට වඩා ඒක හොඳයි කියලයි. විවේචනයක් නොවෙයි. ඇත්ත කථා කරන්න ඕනෑ. මේවා වැඩිදියුණු කිරීමට මුදල් ඇමතිතුමා මුදල් ගැන පමණක් නොකියා මේ පාලන යම් ප්‍රතිසංස්කරණයන් කළ යුතුයි කියා යෝජනා කර තිබෙනව. ඒක ඉතාමත් අවශ්‍යයි. විරුද්ධ පාර්ශ්වය වුණත් කියනවා ඇති ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගත යුතුය කියා.

මට පේන්නේ අපේ දිස්ත්‍රික් අයවැය ලේඛනයේ දී අප සියලු දෙනෙක්ම දන්න දෙයක් අවිච්ඡේද වැඩ කියා ප්‍රශ්නයක් තිබෙන බව. 1984 සල්ලිවලින් අද වන විට බාගෙකට වඩා වැඩ කරගෙන නැහැ. ඒ මුදල් ආපසු භාණ්ඩාගාරයට යන්නෙත් නැහැ. දිස්ත්‍රික් ලේකම්ගේ ගිණුමට වැටෙනවා. දැන් බලාගෙන ඉන්නවා. අය වැයෙන් මොනවාද වැඩි වුණේ කියා. තාර වැඩි වුණාද, සිමෙන්ති වැඩි වුණාද, ශ්‍රම වියදම් වැඩි වුණාද කියා බලාගෙන සිට අර වැඩි වුණ ඒවා අල්ලා නැවතත් ඇස්තමේන්තු හදනවා. අප්‍රේල් වනතුරු ඒ වැඩ අවසන් කරන්නේ නැහැ. ඒවා අවසන් කර එන විට නැවතත් ඒ මුදල්වලින් අවිච්ඡේද වැඩ කියා ඉතුරු වෙනවා. ඉන් මිනිස්සු අපට දෙස් කියනවා පොරොන්දු ඉටු කළේ නැහැ කියා. ඒ ගැන මම දීර්ඝ වශයෙන් කියන්න යන්නේ නැහැ. විශේෂයෙන්ම මේ පාලනය ගැන වත්තල ගරු මන්ත්‍රීතුමා (ජෝන් අමරතුංග මහතා) පැයක් පමණ වේලා කථා කලා. මුදල් ඇමතිතුමා යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි කියා මම කියනවා.

ඊළඟට ගෙවල් ප්‍රශ්නය කොමියුනිස්ට් පක්ෂයේ නායකතුමා වන කම්කරුවන්ගේ රජා තමයි 1977 ට පෙර පැවති රජයේ ගෙවල් ඇමති වී සිටියේ. ඒ ඇමතිතුමාගේ කාලයේ දී මම නම් ගැන්නේ නැහැ ගෙවල් කීයක් හැදුවාද කියා. ඔය ගිය කොහේවත් මට නම් ගෙවල් හදනවා දකින්න ලැබුණේ නැහැ.

1956 ආණ්ඩු කාලයේදී එතුමා කොළඹ නගර සභා ඡන්දයේදීත් ඒ. ඩබ්ලිව්. ඒ. අබේගුණසේකර මහතාට පැරදුණා. ඒකත් එක්සත් ජාතික පක්ෂය අන්ත පරාජයට පත් වී සිටි වෙලාවක්.

මට පසුව කථා කරන්න ඉන්න මන්ත්‍රීතුමාගේ පියා වූ හිටපු කෘෂිකර්ම ඇමතිතුමා වාගේ කාරුණික අයත් හිටියා. එක්සත් ජාතික පක්ෂයේ නව සංවිධානය කියා අපි 5 දෙනෙක් සංවිධානය වෙලා නගර සභා සටනට ගියා. වර්තමාන ජනාධිපතිතුමා ජේ . ආර්. ජයවර්ධන මැතිතුමා ලේකම්. ඩඩ්ලි සේනානායක මැතිතුමා ලෙඩින් කියා ගෙදරට වෙලා හිටියා මොන පක්ෂයක් ගැනවත් කථා නොකර. මම උප ලේකම්. මේජර් ටී. එෆ්. ජයවර්ධන මහතා උප ලේකම්. අගමැතිතුමත් හිටියා. සර් උක්වත්තෙත් හිටියා. ඔය විධියට අපි පස් දෙනෙක් හිටියා. ඔය අතරතුර සමහරු කියනවා යූ. එන්. පී. කියන නම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මහත්මිය]

වෙනස් කරන්න ඕනැය කියා. අපි ඒකට විරුද්ධ වුණා. අපි අපේ තත්ත්වය උර ගා බලන්න නගර සභා මැතිවරණය තියමු කියා කිව්වා. අපි 45 දෙනෙකුගෙන් පස් දෙනයි නගර සභා ජන්දෙට වැඩ කරන්න හිටියේ සර් උක්වත්තෙත් එළියට ආවේ නැහැ. අපට ඒ වෙලාවෙ පුළුවන් වුණා, කොමියුනිස්ට් පක්ෂයේ නායකතුමාත් තවත් හුඟ දෙනෙකුත් පරාජය කරවන්නට. ඒ අපේ විශිෂ්ඨ ජයග්‍රහනය ලැබුවාට පස්සෙ අර හැංගිලා සිටි සියලු දෙනාම නැවත එක්සත් ජාතික පක්ෂය වටා රොක් වුණා.

එදු ගම්වල ගෙවල් නැති අයට ගෙවල් හැදුවෙ නැහැ. නමුත් අපි ඉතාමත්ම වෙහෙස මහන්සි වී අග්‍රාමාත්‍යතුමාගේ ගෙවල් ලක්ෂයේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්න පොරොන්දු වුණා. උදගම් යටතේ ගෙයකට රු. 45,000ක් පමණ යනවා. ඒ ව්‍යාපාරය අවසන් කරගෙන ගිහින් දැන් ආරම්භ කර තිබෙනවා ගෙවල් දස ලක්ෂයේ වැඩ පිළිවෙළ. ඒක ජනප්‍රියයි. බොහෝම හොඳයි. ඒ සඳහා රු. 7,500 දෙනවා. ඊට වැඩිය ඕනැ නම් තවත් දෙනවා. එවිට ස්වඋත්සාහයෙන් තමන්ගේ බිම් කැබැල්ලේ ගෙය හද ගන්න පුළුවන්. ඒ අනුව සැම කෙනෙකුටම නිවාසයක් දීමේ වැඩ පිළිවෙළ දැන් යොද තිබෙනවා. එය සාර්ථක කර ගැනීමට මුළු රටේම මහජනයා අප සමග එක්සත් වේවිය කියා මම කල්පනා කරනවා. තමන්ට ඉඩම තිබනවා නම්, ඒ ලැබෙන මුදල යොදවා වැඩ කිරීමෙන් නිවාස ප්‍රශ්නය පිළිබඳව සැහෙන සහනදයී තත්ත්වයක් ඇති කර ගන්න පුළුවන්.

නිවාස ප්‍රශ්නය විසඳීමේදී නිවාස තිබෙන අය ගැනත් මුදල් ඇමතිතුමා වපර ඇහින් නොවෙයි හොඳට ඇස් ඇරලා බලා තිබෙනවා. කොළපාට කන්නාඩියක් නොවෙයි සුදුම සුදු කන්නාඩියක් දමා බලා තිබෙනව. එක ගෙයක් තිබෙන පවුලක පිරිමි එක්කෙනා හෝ ගැහැණු එක්කෙනා හෝ කලින් මැරී බුදල් තඩුව තිබෙන වෙලාවෙ අනික් එක්කෙනාත් මැරුණාය කියා හිතමු. පවුලේ ඉන්න අම්මත් තාත්තත් දෙන්නාම මැරුණාම ඉතිරි වෙන්නේ දරුවන් පමණයි. එතකොට දරුවන් නැවතත් සැරයක් මුල ඉඳලා, " ටැක්ස් " ගෙවලා, " ඩෙත් ඩියුටි " ගෙවලා බුදල් තඩු කියන්නට ඕනැ. බෙදපු නැති ගෙයක් නිසා දැන් දරුවන් ඔළු පලාගන්නවා. දැන් ඉතින් මොකක්ද කරන්නේ ? බුදල් තඩුවක් කියන්න ගියාම අවුරුදු හතරක් පහක් යනවා. ඒක නම් ඉවර වෙන්නේ නැහැ. ඒක හරියට කියනවා නම් " කැන්සර් " රෝගයටත් අන්තයි. ගත්ත ණයවලට පොලී ගෙවන්නට බැරි නිසා ඒ අතරතුරේදී ඒ ඉඩමෙන් බාගයක් විකුණන්නට සිදු වෙනවා. ඒ අනුව ගෙයත් දෙකට කඩලා විකුණනවා. දරුවන් හතර පස් දෙනාටම අයිතිවන විධියට ඉතිරි වුණ කොටසේ " ෆ්ලැට් " එකක් කියලා එකක් ගහ ගන්නවා. ඊට පස්සේ එතැන ජීවත් වෙනවා. එහෙම නැතිව තමන්ටය කියා එක ගෙයක් හද ගන්නට විධියක් නැහැ. ඒ තත්ත්වය නැති කර බදු බරින් නිදහස් කර දීම ගැන එතුමාට සියලු දෙනාගේම ප්‍රශංසාව හිමි වෙන්න ඕනැ. එපමණක් නොවෙයි ඒ සියලු දෙනාම පින් දීමෙන් මෙය භාර ගන්නවා ඇති. මරණය කියන එක කාටත් හිමි වන දෙයක්. ඒ කෙසේ වුණත් කෙනෙක් මැරෙන විට එයින් අනාථ වන අයව බේරා ගැනීමට වැඩ පිළිවෙලක් යෙදීම ලොකු දෙයක්.

අද කෘෂිකර්මාන්තයට සහනයක් ලබා දී තිබෙනවා, රබර් කර්මාන්තයේ නියුතු වූවන්ට සහනයත් දී තිබෙනවා, තේ වවන්නන්ට සහනයත් දී තිබෙනවා. එක් ගෙයක් පමණක් හිමි පුද්ගලයන්ට සහනයක් දී තිබෙනවා. නමුත් දුප්පත් මිනිසුන් කන බොන දේවල්වලට අත තිබ්බෙ නැහැ. භූමිතෙල්වලට අත තිබ්බෙ නැහැ. පරිප්පුවලට අත තිබ්බෙ නැහැ. ලූණු ටිකට අත තිබ්බෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය ලූණු ටිකත් වැඩි කලා. මේ රජය ඒ කිසි දෙයකට අත තැබුවේ නැහැ. එහෙම නම් කාටත් සහනයත් දී තිබෙනවා. සමහර උදවිය සහනයත් දෙනවාය කියා එක පැත්තකින් බොරු සහනයක් දී අනික් පැත්තෙන් දිනපතා පත්තර අච්චු ගහන්නා වගේ කොළකෑලි අච්චු ගහනවා. ඒවා අරගෙන බෙදනවා. එයින් රටේ ආර්ථිකයට පහර වදිනවා. උද්ධමනය වැඩි වෙනවා. ඒවා කරන්නේ නැතිව, කොළ අච්චු ගහන්නේ නැතිව කරන්නට පුළුවන් කියන එක ගරු මුදල් ඇමතිතුමා පෙන්නුවා. මම හිතන විධියට කොළ අච්චු ගහන්නට ගරු මුදල් ඇමතිතුමාගේ කිසිම බලාපොරොත්තුවක් නැතිව ඇති. කොළ අච්චු ගහන්නේ නැතිව, සල්ලිම පාවිච්චි කරන, රත්තරන්, රිදී වටිනාකම අනුව සකස් කල ඩොලර්, පවුම් අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන මුළු ජාතියම ගරු මුදල් ඇමතිතුමාට ණයගැති වෙනවා.

මම දැන් කිව්වේ කෘෂිකර්මාන්තය, කැම බීම හා නිවාස සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයයි. ඇඳුම් පැළඳුම් අනික් අද වෙනදට වඩා ඉතා විශාල ලෙස දියුණු වී තිබෙනවා. සල්ලි තිබෙනවා නම් තමන්ට ඕනැ විධියකට අඳින්නට ඉඩකඩ තිබෙනවා. කාකි අඳින්නට ඕනැ අයට කාකි අඳින්නටත්, සිල්ක් අඳින්නට ඕනැ අයට සිල්ක් අඳින්නටත්, ලංකාවේ නිෂ්පාදනය කල රෙදි අඳින්නට ඕනැ අයට ලංකාවේ රෙදි අඳින්නටත් අවස්ථාව සලසා තිබෙනවා. කලිසම් අඳින්නට ඕනැ අයට කලිසම් අඳින්නට පුළුවන්කම තිබෙනවා. අද ගැහැණු උදවියත් කලිසම් අඳිනවා. පිරිමිත් කලිසම් අඳිනවා. ඒ අයට ඕනැ විධියකට අඳින්නට පළඳින්නට පුළුවන්කම තිබෙනවා. ගැහැණුත් වළලු දගන්නවා, පිරිමිත් වළලු දගන්නවා. කරේ දමන දේවලුත් ඒ විධියට ගැහැණු පිරිමි දෙගොල්ලන්ම දගන්නවා. ඒ ඕනැ එකකට නිදහස තිබෙනවා. නිදහස් අන්දමට, සල්ලි තිබෙන අන්දමට අඳින්නට පළඳින්නට මේ ආණ්ඩුව යටතේ අවස්ථාව සලසා තිබෙනවා.

අනික් ඒවා ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට කලින් ගොවිතැන ගැන මගේ අත්දැකීම් ටිකක් කියන්නට ඕනැ. සේරුවිල ගරු මන්ත්‍රීතුමා (එච්. ඩී. එල්. ලීලාරත්න මහතා) දැන් මේ ගරු සභාව තුල සිට ඉවතට ගියා. එතුමා මේ ගැන හොඳට දන්නවා. සීනි නිෂ්පාදනය සඳහා උක් වවන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව උත්සාහ කලා. උත්සාහයක් නොවෙයි නිකම් බොරු විජ්ජාවකුයි ඒ අය කළේ. ඒ විජ්ජාව බලන්නට ඕනැ නම් කන්තලේට යන්න. අක්කර හාර දහසක් අරගෙන එවකට සිටි ඇමතිතුමා—සූරියාරච්චි මහතා— " සූරියගම " කියා නම ගහගත්තා. සූරියගම කියා එකක් පටන්ගෙන මිනිසුන් එතැනට යැව්වා. මාවතැල්ල වගේ පලාත්වලිනුත්, මගේ ගලිගමුව ආසනයෙනුත් රේල්ලු පුරවලා එතැනට සෙනඟ පිටත් කලා. මේ රේල්ලුවෙන් ගියා, අනික් රේල්ලුවෙන් ආවා. ඇයි ? ඒ අයට ඉන්නට තැනක් නැහැ, බොන්නට වතුර ටිකක් නැහැ. ඒ අයව මහ විශාල කැලෑවකට ගිහින් දැම්මා. දැන් ඒ ඉඩම් තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order. please ! The Deputy Chairman of Committees will now take the Chair

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

***அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.***

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

කන්තලේ අසල සූරිය ඇල නමින් පොඩි ඇලක් තිබුණා. ඒ ඇලේ වතුර ප්‍රයෝජනයට අරගෙන තරුණයන් දහ අට දෙනෙක්, විසි දෙනෙක් පමණ එකතු වෙලා ග්‍රාම සංවර්ධන ස්වයං රැකියා වැඩ පිළිවෙලක් පටන් ගත්තා. අපි බැංකුවලින් ණය ගත්තේ නැහැ. ග්‍රාම සංවර්ධනයෙන් රුපියල් නව ලක්ෂයක් ආධාර දුන්නා. ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා එහෙනුත් ලක්ෂ දෙකක් දුන්නා. දැන් ඒ උදවිය ට්‍රැක්ටර් යනාදිය අරගෙන පවුලක් වශයෙන් නඩත්තු වෙනවා. මේ නිසා දැන් ඒ උදවිය පවුල් වශයෙන් නඩත්තු වෙනවා. අපි දුන්නුයි ඒ ඉඩම් ඔප්පු එක්ක දී තිබෙන්නේ. මාසයකට රුපියල් තුන් සිය පනහකට වැඩි ආදයමක් එක පවුලක් හොයනවා. තෙලන්නේ ගැහැනු. මිරිස් ටික තමන්ම වගා කරනවා. හේන් එළවළු තමන්ම වගා කරනවා. වී ගොවිතැන් කරලා තමන්ට අවශ්‍ය බිත්තර වී ආදිය තබාගෙන ඉතිරි කොටස විකුණා ගන්නවා. කුඹුරු වගා නැති කාලයට තමන්ම ට්‍රැක්ටර් එළවනවා. අනෙක් දවස්වලට ට්‍රැක්ටර් වෙනත් අයට කුලියට දෙනවා. පොදු ගොවි පොලක් වශයෙන් ඒක කරගෙන යනවා. තුන්සිය පනහේ ආදයම ලැබෙන්න වුණාට පස්සේ ඒ අයගේ හාල් පොත් ආපසු ගත්තා. ඔවුන් ඒ ගැන දොස් කිව්වේත් නැහැ. 1984 වන විට ලක්ෂ එක හමාරක් පමණ එකතු කර තිබුණා. කාන්තා සමිතියට වෙළඳ පොළක් ඇරීම සඳහා කන්තලේට රුපියල් පහළොස් දහක් ණයටත් දුන්නා. අනෙක් වාරයේ මම ගියාම මේ අය මොකක්ද ඉල්ලුවේ ? " අනේ මේ මහවැලියේ ඉඩම් අපිට ඔප්පු සමග දීලා අර ගෙවල් දස ලක්ෂයෙන් අපටත් ගෙවල් ලබා දෙන්න " කිව්වා. අපි ඒවා අරන් දුන්නා. දැන් ගෙවලුත් හදගෙන, සම්පූර්ණ පවුලක් එයින් නඩත්තු වෙනවා, එක ගොවියෙක් නිසා. ඒ ඇත්තන්ට අවශ්‍ය ආධාර සම්පූර්ණයෙන්ම ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ආදර්ශය දක්ක තවත් උදවිය දැන් ඉඩම් ඉල්ලා තිබෙනවා. සූරිය ගමෙන් පවුල් 100 කට අක්කර 350 ක් දී ඔවුන් පදිංචි කරවා දැන් ගෙවල් හදගෙන යනවා. අගමැතිතුමාගේ ග්‍රාමෝදය මණ්ඩල අරමුදලෙන් ඒ පවුල් සියයටම ගෙවල් හැදීමට ආධාර දී තිබෙනවා. මමත් එක සැරයක් ග්‍රාමෝදය මණ්ඩලයෙන් ලක්ෂයක් දුන්නා ට්‍රැක්ටර් ගන්න. පවුල් සියයටම ඒ වරප්‍රසාද ලැබී තිබෙනවා. සූරියගම, කන්තලේ ඉතිරි ඉඩම් කැලි තමයි, අපි මේ සඳහා ලබා ගත්තේ. මේක දිගේම තව හැතැප්ම දහයක් පමණ යන විට සේරුවිල පන්සල හමුවෙනවා. ඒ ඇලෙන් එගොඩ දෙමළ පවුල් ඉන්නවා. ඒ ඇත්තන්ටත් ත්‍රිකුණාමලයෙන් එන්න ඕනෑ නම් ඇලෙන් මෙගොඩ වී අපේ මේ තරුණයන් සිටින ප්‍රදේශය පසුකරගෙනයි එන්න වෙන්නේ. ත්‍රස්තවාදීන් ආවොත් ඒ අයත් ලෑස්තියි ඕනෑම වේලාවක ඔවුන්ට මුහුණ දෙන්න.

අපි මේවාගේ දේවල් ගැන හිතන්න ඕනෑ. මහවැලි වතුර නිසායි අපට මේවා මේ විධියට දියුණු කර ගන්නට පුළුවන් වුණේ. සේරුවිල ගරු මන්ත්‍රීතුමා දැන් ටිකකට ඉස්සෙල්ලා මෙතැන හිටියා. එතුමාට මම ස්තුති කරන්න ඕනෑ, මේ කටයුතුවලට ආධාර දීම ගැන. මම ඒ කිව්වේ අපේ තරුණයන් පවුල් වශයෙන් සංවිධානය වී තමන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ගත්තා අන්දමයි.

ඊළඟට කියන්න තිබෙන්නේ දරුවන්ගේ මන්ද පෝෂණය ගැනයි. මන්ද පෝෂණයත් මැලේරියාවත් තමයි අපට සටන් කරන්න තිබෙන අපේ හතුරෝ දෙන්නා. කාන්තාවන්ටත් විශේෂයෙන්ම ගර්භනී මව්වරුන්ටත් වයස අවුරුදු එකේ සිට පහ දක්වා දරුවන්ටත් මන්ද පෝෂණය තිබෙනවා නම් අපි ඒ ගැන විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ. ළඟදී පැවැත්වුණු ලෝක සෞඛ්‍ය සම්මේලනයේදීත් මේ ගැන තීරණයක් ගෙන තිබෙනවා. තුන්වැනි ලෝකයේ අනෙක් රටවලට වඩා අපේ රට දියුණුයි. මෙන්න මේ හතුරන් දෙන්නා නැති කරගත්තොත් අපි ඉතාම වටිනා ජනතාවක් වෙනවාය කියා එහිදී සඳහන් වී තිබෙනවා. ඊටත් ඉස්සෙල්ලා අපි 1981 දී ග්‍රාම සංවර්ධන අංශය මඟින් ඕස්ට්‍රේලියාවේ මිස්ප්‍රයි මෙහි ගෙන්වා මේ ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී මන්ද පෝෂිත දරුවන් ගම්වල සියයට 70 ක් පමණ සිටින නිසා ඒ ගැන විශේෂයෙන් ක්‍රියා කරන්න ඕනෑ බව කියා තිබුණා. ඒ දිස්ත්‍රික්ක තමයි, කෑගල්ල හා රත්නපුරය. ඒවායේ වැඩිපුර ඉන්නේ වතු කම්කරුවන්. මාතලේ හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල තමයි මන්ද පෝෂණයෙන් පෙළෙන උදවිය වැඩියම ඉන්නේ. ඒ ගැන අපි විශේෂයෙන්ම යම් පියවරක් ගන්න ඕනෑ. අපේ ගරු මුදල් ඇමතිතුමාත් ඒ ගැන සඳහන් කර තිබෙනවා. ඒ ගැන අවශ්‍ය කටයුතු කිරීමට මුදල් වෙන්කරලාත් තිබෙනවා. මන්ද පෝෂණය අතින් ප්‍රමුඛත්වය ගන්නේ මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, මඩකලපුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයි. රත්නපුරය, කෑගල්ල, මාතලේ හා ගාල්ල ඊළඟට. එම නිසා මේ සියල්ලම ශක්තිමත් කිරීම සඳහා විශේෂයෙන්ම අපේ රටෙනුත්, පිටරටවලිනුත් ආධාර සොයා ගෙන ලබන අයවැය ලේඛණයේදී මීට වඩා උසස් ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

මට කථා කරන්න නියමිතව තිබුණේ උදේ 9 ටයි. නමුත් මා ටිකක් ප්‍රමාද වී පැමිණීම ගැන සමාව අයදිනවා. මේ වේලාවේ කථා කිරීමට නියමිතව තිබුණේ අපේ මහරගම ගරු මන්ත්‍රීතුමාටයි. එතුමා මට කථා කරන්න අවසර දුන්නා. කෑමට පෙර මගේ කථාව අවසන් කරන්නම් කියා මම පොරොන්දුවක් දුන්නා. එම නිසා එතුමාගේ කථාවත් මට මේ ස්ථානයේ ඉඳගෙන අහගෙන ඉන්න පුළුවන්. මේ සියලු කරුණු ගැන තවත් හුඟක් දෙනෙක් කථා කරන්න සිටින නිසා මම විශේෂයෙන්ම කථා කළේ කෘෂිකර්මය, මන්ද පෝෂණය, පාලනය හා අපේ ජාතික ඉතිහාසය පිළිබඳවයි.

මේ සියල්ලටම වඩා තවත් වැදගත් දෙයක් තිබෙනවා. කොපමණ දක්ෂ ලෙස අපේ මුදල් ඇමතිතුමා මේ කටයුතු කර තිබුණත්, ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය හා මන්ත්‍රීතුමන්ලා කොපමණ උත්සාහවන්ත වුණත්, මහජනතාවගේ උපරිම සහයෝගය — සියයට සියයක් සහයෝගය — නොමැතිව කටයුතු සාර්ථකව කරන්න බැහැ. මේ අයවැය ලේඛනය කම්මැලියන්නට වාසි සලසන අයවැය ලේඛනයක් නොවෙයි. මෙය බොහොම මහන්සිවෙලා ක්‍රියා කරන්න තිබෙන අයගේ — hardworking people's — අයවැය ලේඛනයක්.

අපි බැංකු ඇති කිරීමේදී ඇමරිකාවේ තිබෙනවා වාගේ බැංකු ක්‍රමයක් ඇති කළ යුතුයි. ඇමරිකාවේ හැම මිනිසුන් දහකට එක ග්‍රාමීය බැංකුවක් තිබෙනවා. පෞද්ගලික අංශයෙනුයි ඒවා ක්‍රියාත්මක කරන්නේ. ඒ බැංකුවලට සේවකයින් පත් කිරීමේදී ඒ අයගේ සුදුසුකම් පමණක් නොවෙයි සලකා බලන්නේ. ග්‍රාමීය ජනතාව ගැන හැඟීමක් ඇල්මක් නැති අය ඒවාට පත් කරන්නේ නැහැ. dedication and devotion to rural development. එයටයි, ප්‍රමුඛත්වය දෙන්නේ. එසේ නැතිව දේශපාලන පක්ෂ අනුව වාසි දෙන්නට, ඒ අයගේ දේශපාලන පක්ෂ තිබෙන වේලාවට ඒ ඇත්තන්ට බොරු ණය හරි දෙන්න ඒ අය කටයුතු කරන්නේ නැහැ. ඒ අය කටයුතු කරන්නේ රටේ උන්නතිය සඳහායි.

මම 35 අවුරුද්දක් පමණ කාලයක් තිස්සේ 1953 සිට දේශපාලන කටයුතු කළා. මම ලංකාවේ පළමු වතාවට පත් වූ ගම් සභා නියෝජිතවරියක වශයෙන් — ගම්සභාපතිනියක වශයෙන් — කටයුතු ආරම්භ කළා. මෙතරම් කාලයක් ග්‍රාමීය ජනතාව වෙනුවෙන් ඇප කැප වී සිටින මා බලාපොරොත්තු වූ දේ මේ අවස්ථාවේදී මගේ ඇසින්ම දකින්නට ලැබීම ගැන මම ඉතාමත් සන්තෝෂ වෙනවා. කෘෂිකාර්මික කටයුතුවලින් ජීවිත ගෙවන ජනතාව සියයට අසූවක් වෙසෙන ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට යම් දියුණුවක් ලබා ගැනීමට අද අවස්ථාවක් ලබා දී තිබෙනවා. ඒ ගැන මම ඉතාමත් සන්තෝෂ වෙනවා. ගම්බද පාසල්ය නගරබද පාසල්ය කියා වෙනසක් නැතිව දැන් ඒ අයගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන නිසා ඔවුන්ට නවජීවනයක් ලැබෙන බව පෙනී යනවා. මව්ගේ කිරි බොන්නා වාගේ කොළපාට විප්ලවයේ සාරය උරා ගන්නා මේ දරු පරම්පරාව 1985 සිට අවුරුදු 30 ක් සඳහා පමණක් නොවෙයි, මුළු අනාගතයටම වගකීම සඳහා ඇතිවෙන දරු පරම්පරාවක්. අපි ඒ ඇත්තන් වෙනුවෙන් සටන් කළා. අපේ ජන ජීවිතය වෙනුවෙන් සටන් කළා. දැන් වියලි කලාපයේ ප්‍රදේශවල ළිං ඇති කරගෙන යනවා. සුළු වැව් අමුණු 4,000 ක් පමණ බැඳ ගෙන යනවා.

අපේ ගරු තිශ්ශංග ඇමතිතුමා කවි ලියන්න දක්ෂයෙක්. දැන් එතුමා මට මගේ කථාව ගැන ප්‍රශංසාකර යමක් ලියලා එවා තිබෙනවා. එය කියවන්නට ගියොත් මගේ කථාවට තවත් වෙලා ගත වෙනවා. මෙය ලියා එවීම ගැන එතුමාට මම ස්තුති වෙනවා.

අද තිබෙන ප්‍රතිඵල අනුව බලන විට තව අවුරුදු 5 ක් පමණ යනවිට උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සමත් ළමයින් ලක්ෂ 5 ක් පමණ පාසල්වලින් පිටවෙනවා. දෙමව්පියන් ගොවිතැන් කළාට ඒ ළමයිනුත් එම ගොවිතැන් කටයුතු කරන්න උදව් වෙනවා. ඒ ළමයින්ටත් උසස් අධ්‍යාපනයක් දීම සඳහා වහාම පාසල් නවීකරණයක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම ග්‍රාමීය ජනතාවට විදුලි ආලෝකය ලබා දී ඒ ජනතාවගේ කාර්මික තත්ත්වයේ දියුණුවක් ඇති කරන්න ඕනෑ. කර්මාන්ත දියුණුවක් ඇති කරන්නට ඕනෑ. කර්මාන්ත ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමා එහෙන් මෙහෙන් විශාල ධනයක් සොයා ගන්නවා. කරුණාකර ඒවා ගම්බද ප්‍රදේශවලටත් හරවන්න. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාත් එක්ක එකතුවී ගම්බද ප්‍රදේශවලත් කර්මාන්ත ඇති කරන්න.

තව අවුරුදු විස්සක් තිහක් ගත වන විට මේ රටේ අනාගතය භාර ගන්නට සිටින තරුණ තරුණියක් තමා අද අධ්‍යාපනය හදාරන්නේ. 1989 වන විට අද උසස් අධ්‍යාපනය හදාරන්නන්ට රට භාර වෙනවා. ඒ උදවිය තවත් අවුරුදු පනහක් පමණ ජීවත් වේවායි කියා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ අයට මේ කාලයට ගැළපෙන අධ්‍යාපනයක් දෙන්නට ඕනෑ. තුන්වන ලෝකයේ නොදියුණු නූගත් රටක් හැටියට අපේ රට තිබිය යුතු නැහැ. අපේ රට ඉන්දියාවට වඩා උගත්කමින් ඉහළයි. අපි දැන් නැවෙත් හාල් ගෙනෙන නෙක් බලාගෙන ඉන්නේ නැහැ. ඒ ප්‍රශ්න විසඳා අවසානයි. ඒ ප්‍රශ්න ගැන හිත යොමු නොකර අපි දැන් හිත යොමු කරමු, ඉදිරිය ගැන. අද අපේ පාසැල් දරුවන්ට තාක්ෂණික විද්‍යාව — technology, computor science — ඉගැන්වීම අවශ්‍යයි. ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඉගෙනගැනීම අවශ්‍යයි. එමගින් පාලනය ක්‍රමවත් ලෙස සහ වේගවත්ව කළ හැකි වෙනවා. එමගින් අපි දැන් ඉදිරිය ගැන කථා කරමු. මා විරුද්ධ පක්ෂයෙන් අහන්නෙත් ඉදිරිය මොකක්ද කියලයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ පක්ෂය මීත්තේරියේදී අන්ත පරාජයට පත් වන බව මා දැනගත්තා. මැතිවරණ කටයුතුවල යෙදෙන විට මගේ සිරිතක් තිබෙනවා, රාත්‍රී නවයහමාර දහය පමණ වන තෙක් සංචාරය කරමින් පසුවදාට පවත්වන රැස්වීම්වලට වේදිකාව සකස් කර ඇත්දැයි හොයා බැලීමට යාමේ. ජනාධිපතිතුමා පැමිණෙන්නට තිබූ හිඟුරක්ගොඩ රැස්වීමක වේදිකාව සූදානම්දැයි බලන්නට මා රාත්‍රී 8.30 ට පමණ පිටත් වුණා. ඒක භාරව හිටියේ මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමායි. ඒ ස්ථානයට මා යන විට ශ්‍රී ලංකා නිදහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මහත්මිය]

පක්ෂයේ රැස්වීමක් දැක්කා. ඒ ඉදිරිපස පෙට්‍රල් ෂෙඩ් එකක් තිබුණා. මට පෙට්‍රල් වුවමනා කළේ නැහැ. නමුත් ඒ අවස්ථාවේදී විපක්ෂ නායකතුමා කළ කථාව අහන්න මා වරක් දෙවරක් එහාට මෙහාට ගියා. ඒ පැත්තෙ ටිකක් කඩිප්පුවල සැරත් තිබුණා. ඒ පැත්තෙ කවුරුවත් මාව හඳුනනවා. සුළි සුළං කාලෙ මම ඒ පැත්තෙ ගියා. නියඟය නිසා මම ඒ පැත්තෙ යනවා. කොහොමත් අවුරුද්දකට වරක් මම ඒ පැත්තෙ යන එන නිසා ඒ මිනිස්සු කවුරුත් මාව හඳුනනවා. මම අහගෙන හිටියා, විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ කථාව. මම දැනගත්තා එතුමා යන පාර නම් වැරදි බව. බණිනවා. බණිනවා. බණිනවා. රැස්වීමට පැමිණි අය බලනවා තරුණයින් ගැන කියන්නේ මොකක්ද කියලා. ඒ කිසිම දෙයක් නැහැ. අරය ගැනයි මෙයා ගැනයි වල්පල් කථා කළාම ඒ මිනිස්සු ඡන්දය දෙයිද ? ඊළඟට මම ගියා පරණගමට. එතුමා කළේ අහගෙන ඉන්න පුළුවන් කථාවක් නොවෙයි.

අනුර බණ්ඩාරනායක මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(திரு. அனுர பண்டாரநாயக்க — எதிர்க்கட்சி முதல்வர்)
(Mr. Anura Bandaranaike– Leader of the Opposition)

ඔබතුමියට වේදිකාවට ඇවිත් අහගෙන ඉන්න තිබුණා නොවැ.

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

ඔවාගේ ඉන්නවා නොවැ නොයෙක් තරාතිරම්වල උදවිය. මම එතැන ඉඳල බැරි වෙලා හරි මොකක් හරි වුණා නම්.?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

ඒ කිසි දෙයක් වෙන්නෙ නැහැ.

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

කිසිම දෙයක් වෙන්න දුන්නෙ නැහැ, අපි. තමුන්නාන්සේත් ආවා එද මම හිටපු තැනට. ඊට පසුවද 150 ක් පමණ සෙනග අරන් ආවා. ඊළඟට 18 වැනිද රෑ තරුණයින් 15 දෙනෙකු පමණ අරන් ආවා, අපි හිටපු හෝටලයට. තමුන්නාන්සේගේ මවත් එතැන හිටියා. එතැන කිසිම ආරක්ෂාවක් තිබුණේ නැහැ. මම තමුන්නාන්සේගේ මවටත් කථා කළා. මම වහාම හොඳට ආරක්ෂාව දුන්නා. අපි ඒ උදවිය ආරක්ෂා කරනවා. මම දන්නේ නැහැ, ඒ අය අපට එහෙම කරයිද කියල. මොකක් වුණත් ඒක පැත්තක තියමු. මම ඊළඟට ගියා පරණගමට. ඒ වේදිකාවෙ වහල ගහල තිබුණේ නැහැ. මම ඇහුව එළි වෙන කොට ඒක හද ගන්න පුළුවන් වෙයිද කියල. එතකොට, " දැන් නම් මේව හැදුවත් නැතත් කමත් නැහැ, කිසිම බයක් නැහැ, අපි දිනනවාමයි " කියල ඒ අය කිව්වා. " විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ කථාව ටිකක් අහගෙන ඉදල මමත් ආවෙ, දැන් ඒ අයගේ සටන දෙවැනි තැන ගන්නෙ කවුද කියන එකය " කියා මම ඒ අයට කිව්වා. තරඟයෙන් දෙවැනි තැන ගන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද ? ශ්‍රී ලංකා මහජන පක්ෂයද ? අනාගතය රඳා පවතින්නේ දෙවැනි තැන ගත්තොත් බව ඒ උදවියට පෙනුණා. ඒකයි තිබුණු තත්ත්වය. " එක්සත් ජාතික පක්ෂය දහස් ගණනක වැඩි ඡන්දයෙන් මින්තේරිය ජයග්‍රහණය කරන බව අපි දන්නවා, මමත් ආවෙ ඒක කියල යන්න තමයි, එම නිසා අපි කලබල නොවී ඡන්දය දට ඡන්දය පාවිච්චි කරමු " ය කියා මා ඒ උදවියට කිව්වා.

ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාට එකක් කියන්න කැමතියි. අපි හිතන්න තරකයි, ගම්බද උදවිය නූගත්තුය, ආඥනයෝය, විකාරකාරයෝය කියා. අද ගම්බද දරුවනුත් හොඳට ඉගෙන ගන්නවා. ගම්බද උදවියටත් හොඳට පැසුණු බුද්ධියක් තිබෙනවා. ඒ නිසා ඒ අය ඔය රැස්වීම් හැම එකකටමත් දුවනවා. ඒ කට්ටිය යම්කිසි තීරණයක් ගත්තොත්, ආයෙත්, සැරයක් ඒ තීරණය හොල්ලන්න කාටවත් බැහැ. අපේ රජය බලාපොරොත්තු වන්නේ මේ රටේ අනාගතය තරුණයන්ට භාර දෙන්නයි. විශේෂයෙන් අපේ ගම්බද තරුණයන්ගේ, දරු—දැරියන්ගේ අනාගත දියුණුව සැලසීම අපේ ජනතාවට භාරයි. ඒ ජනතාව වෙනුවෙන් තමයි, මේ රජය ඇප—කැප වෙලා වැඩ කරන්නේ. අපේ මුළු කාලයම ගෙවෙන්නේ ඒ ග්‍රාමීය ජනතාවගේ ශුභසිද්ධිය සඳහායි. අපේ ගම්බද ජනතාව ප්‍රමුඛ මේ රටේ මුළු මහත් ජනතාවගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරන්න මේ රජයට පුළුවන්කම ලැබී තිබෙන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඉවසීමේ ශක්තියට, ඥනයට, ප්‍රඥවට, දූරදර්ශී භාවයට පින් සිද්ධ වෙන්නයි. 1977 දී එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කළ මැතිවරණය ප්‍රකාශනය අකුරටම ක්‍රියාවේ යොදවන්න අපට පුළුවන්කම ලැබී තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ බුද්ධියට පින් සිද්ධ වෙන්න බව මේ රටේ මුළු මහත් ජනතාව එක හඩින් පිළිගන්නවා. පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ වගේ දැන් නැවතත් මේ රටේ ආර්ථික තත්ත්වය ස්ථාවර වී තිබෙන බව, ගලේ කොටපු අකුරක් වගේ එය පැහැදිලි බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

1989 වන්නට ඉස්සෙල්ලා මේ රටේ අනාගත පරපුර මන්ද පෝෂණයෙන් බේරා ගෙන, අපේ රටට ඔබින විධියට ඒ අයට උසස් අධ්‍යාපනයක් ලබා දී හැම අංශයකින්ම අපේ රට නිදහස්, නිවහල් රටක් බවට පත් කරන්න අපට පුළුවන් වේ යැයි අපි බලාපොරොත්තු වෙනවා. අපේ අනාගතය, අපේ බාල පරපුරට—අනාගත පරපුරට—භාරයි. අව්වෙන්—වැස්සෙන් කරදරයක් නැතිව අපේ වගාවන් සරු වී ත්‍රිවිධ රත්නයේ පිහිටෙන් අපේ ජාතික ප්‍රශ්න විසඳන්න අපට හැකි වේවායයි අපි බලාපොරොත්තු වෙනවා ; ඒ වාගේම ප්‍රාර්ථනා කරනවා.

ගරු මුදල් ඇමතිතුමාත් අයවැය කථාවේදී කීප තැනකම සඳහන් කළා, " political stability " කියන වචන දෙක. මොකක්ද, ඒකෙ තේරුම ? එතුමා සඳහන් කළේ විරුද්ධ පාර්ශ්වයත්, ආණ්ඩු පක්ෂයත් යන අප දෙගොල්ල පිළිබඳව සලකා කෙරුණු " stability " එකක් ගැන නොවෙයි. යූ. එන්. පී. එකේ අපට මේ තිබෙන දේශපාලන ස්ථාවරත්වය හොඳටම ඇති. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කිව්වා වාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් හත් දෙනා මෙතැනට ඇවිල්ලා මොනවා කරන්නද ? නමුත් අපට ඒ හත් දෙනාගේ සහායත් වුවමනා කරනවා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

අපි හත් දෙනාට හුඟක් දේවල් කරන්න පුළුවනි. මම අර විධියේ දෙයක් කිව්වේ නැහැ.

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

එහෙම නම් මොකක්ද කිවේ, හත් දෙනා ගැන ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

අපි ඉන්නේ හත් දෙනායි. නමුත් ආණ්ඩුවට ඉන්නවා 145 දෙනෙක්. අද කථාව හින්ද එයින් 15 දෙනෙක්වත් යයි කියලයි, මම කිව්වේ.

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

ඉතින් ඒ කථාවේ සාරාංශය මොකක්ද ? මම ඒ කථාවෙන් තේරුම් ගත්තේ වෙනත් අර්ථයකුයි. තමුන්නාන්සේලාට හත් දෙනෙක් ඉන්නවා. මෙතැන අපිට ඉන්නවා, 145 දෙනෙක්. ඉතින් අවසාන තීරණය මොකක්ද ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

කාලයක් එක්සත් ජාතික පක්ෂයත් ආසන අටට බැස්සා. ඒ නිසා ආසන අඩුවීම ගැන ප්‍රශ්නයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විමලා කන්නන්ගර මහත්මිය
(திருமதி விமலா கன்னங்கரா)
(Mrs. Wimala Kannangara)

අපි දැන් ඒ විවාදය පැත්තකින් තියලා, මේක අවසන් කරමු. එහෙම නැත්නම් අර ගරු මන්ත්‍රීතුමා මට දුන් කාලයත් නිශ්ඵල වෙනවා. අපිට කියන්න තියෙන්නෙ මේකයි :

දැන් විරුද්ධ පාර්ශ්වයේත් ඔක්කොම ඉන්නෙ සිංහල උදවියයි. ඒ නිසා දැන් ජාති භේදයක් ඇත්තේත් නැහැ. මම දන්නෙ නැහැ, ආගම් භේදයක් තිබෙනවාද කියන්න. ඇත්ත වශයෙන්ම නම් ආගම් භේදයක් ඇති වෙන්නත් බැහැ. අපි කවුරුත් සිංහල ජාතියට අයත් උදවියයි. අපට දැන් තිබෙන්නේ ඉදිරි කාල පරිච්ඡේදයේදී නියඟයක් ඇති වෙන්නේ නැතිව, අව්වෙන් — වැස්සෙන් කරදරයක් වෙන්නේ නැතිව රටට සෞභාග්‍යය උදා කර ගන්න කටයුතු කරන්නයි ; එසේ වේවායි ප්‍රාර්ථනා කරන්නයි. අපේ රටේ සාමය පැවතුණොත් මේ රජය ගෙන යන මේ වැඩ ව්‍යාපාර අකුරටම ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනවා. අපේ තේවලට මේ විධියටම දිගටම ඉහළ මිලක් ලැබුණොත්, ඩොලර් එකේ වටිනාකම ටික ටික බැහැගෙන ගියොත් මේ අයවැය ලේඛනයේ වාගේම ඉදිරි අයවැය ලේඛනවලත් ආදායම් අතිරික්තයක් පෙන්වන්න ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්කම ලැබෙයි.

මම දැන් කියන්න යන ටික කියන්නේ ටී. යූ. එල්. එෆ්. එකට සහ ත්‍රස්තවාදීන්ටයි. මේ ගරු සභාව තුළ මේ වචන ටික මම කියන්නේ මින් බැහැර ඉන්න අර උදවියටයි. මට මතක හැටියට පසුගිය අයවැය විවාද කාලයේ වෙන්න ඕනෑ, අපේ හිතමිත්‍ර අමිර්තලිංගම් මහත්මයාගේ නායකත්වයෙන් යුත් ටී. යූ. එල්. එෆ්. එකේ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවෙන් පිටවී ගියේ. ඒ අයගෙන් සමහරු නම් — නවරත්නම් මහත්මය එහෙම — ආපසු එනවය කීවා. ඒ වුණත් ඒ අය ගියා ගියාමයි, ආපසු ආවෙ නැහැ. ඒ අය ගිහින් කළ වැඩේ මොකක්ද ? කිසි දෙයක් නැහැ. එදා සිට අද දක්වාත් — මේ අයවැය විවාදය පවත්වන මේ මොහොත දක්වාත් — ඒ අය ශ්‍රී ලංකාවෙ පුරවැසියෝ. ඒ අය මොන ජාතියකට අයත් වුණත්, මොන ආගමකට අයත් වුණත් පාර්ලිමේන්තුවේ පෙනී සිටියේ, මේ රටේ මහජනතාව වෙනුවෙනුයි. ඒ අයට තවමත් ප්‍රජා උරුමය තිබෙනවා. එම නිසා මහජන නියෝජිතත්වය ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

නමුත් ඒ අය පාර්ලිමේන්තු මන්ත්‍රීකම් අත්හැරලා දුවලා ගිහින් පැන ගත්තේ කොහේටද ? ඉන්දියන් සාගරයෙනුත් එතෙර ඉන්දියාවට ගිහිනුයි. ඒ අය නතර වුණේ. ඒ අය ඉන්දියාවට ගිහින් මොකක්ද, කළේ. මුළු ලෝකයාම ගරු කරන, කාන්තාවන්ගේ මුදුන් මල් කඩක් වශයෙන් සිටි ඉන්දිරා ගාන්ධි අගමැතිණියගේ පිහිට සොයාගෙනයි, ඒ අය ගියේ. මෙහෙ මොන සාකච්ඡා කෙරුණත් මෙහේ සාකච්ඡා ඉවර වුණු ගමන් දුවලා ගිහින් අන්තිම තීරණය ගත්තේ එහෙදියි. එතුමියගෙ අවසාන කාලයේදී ඒ තිබුණු දහසකුත් ප්‍රශ්න සමග මේ මිනිස්සු ගිහින් කොපමණ වද කළාද එතුමියට. හැම දේකටම ගිහින් ගාන්ධි මැතිණිය හමුවුණා. දැන් ඉතින් දෙයියන්ගෙම පිහිටයි. කරුණාකරල දැන්වත් ඇස් ඇරගන්න. අපි කනගාටු වෙනවා ශෝක වෙනවා එතුමියගේ අකල් මරණය ගැන.දැන් ආපසු අමිර්තලිංගම් මහත්මයාට දෙවියන්ගේ පිහිට පමණක් නොවෙයි, සොයන්න වෙන්නෙ ; ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේත් පිහිටයි. මේ පාර්ලිමේන්තු සභාවෙ පිහිටයි. අපේ ලක්වැසි ජනතාවගේ පිහිටයි.

මේ විධියට ත්‍රස්තවාදීන් බෝ කරමින් අපේ ධනස්කන්ධය විනාශ කරනවා නම්, මේ බදු ගෙවන්නට වෙන්නේ අපේ ජනතාවටයි. අපේ බැංකු කඩනවා ; බස් ගිනි තියනවා ; පොලීසියට වෙඩි තියනවා ; අපේ වටිනා රූපවාහිනිය ආදිය නැති කරන්න යනවා. අපේ උදවියත් කොපමණ කල් මේවා ඉවසයිද ? බුද්ධාගම අදහන රටක් නිසා ඉවසීමෙන් බලාගෙන ඉන්නවා. එනිසා ආපසු ඇවිත්, කකුල් දෙක පොළොවේ ගහලා, ලක් පොළවේ ඉඳගෙන අප සමග කටයුතු කරන්නය කියා මම ඒ උදවියගෙන් ඉල්ලනවා.

ඒ කට්ටිය කියනවා ඊලාම් ඕනෑමයි කියා. අපි කියනවා, " දෙන්නෙම නැහැ ; ලංකාව කඩන්නෙම නැහැ " කියා. අපි සිංහලයෝ එකා පිට එකා වැටුණත් දෙන්නෙම නැහැ. ගැණු පිරිමි ඔක්කොම ලෑස්තියි. අර අපි මින්නේරියේදී කිව්වා වාගේ මම කියනවා. එදා අපට කිව්වා චන්ඩි ඇවිල්ලා ඉන්නවාය, සුද්දයි සුද්දියි, අරයයි මෙයයි ඇවිල්ලා ඉන්නවාය කිව්වා. අපි කිව්වා, " ඕනෑ එකෙක් ආවදෙන්, අපේ ගොවි ජනතාවගේ කාන්තාවන්ට තිබෙනවා මෝල්ගහයි, කැත්තයි. කොහෙන්හරි කවුරු හරි සටනට ආවොත්, මුලින්ම එන්නේ කාන්තාවොයි " කියා. නමුත් එහිදී කිසි සටනක් වුණේ නැහැ. බොහොම සාමකාමී ලෙස ඡන්දය අවසන් වුණා.

අපි කියන්නේ කරුණාකරලා දැන් සමගිවෙලා මේක මොකක්හරි තේරුමක් බේරුමක් කර ගනිමු කියලයි. ලංකාවේ ඉඳගෙන, ආපසු අපේ පාර්ලිමේන්තුවටත් ඇවිත් අපි ටික මේ අයවැය ලේඛනය සාර්ථක කර අපේ රටේ ජනතාව නිවහල් ජාතියක් වශයෙන් ඉදිරියට ගෙන යමු. දෙමළුත් හෝ වේවා, මුස්ලිම් හෝ වේවා, බර්ගර් හෝ වේවා, සිංහල හෝ වේවා, ඉන්දියන් හෝ වේවා, අපේ පුරවැසියන් සියලු දෙනාම නිවහල් ජාතියක් වසයෙන් සිටින්නට අත්වැල් බැඳගනිමු. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති තුමාගේ ආණ්ඩුවේ මුදල් ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනය ක්‍රියාත්මක කර, එන අවුරුද්දේ මෙතැනට එන විට අපට කියන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ අපි මන්දපෝෂණයත් නැති කළාය, මැලේරියාවත් නැති කළාය කියා. 1967 දී පැවැත්වුණු ලෝක සම්මේලනයකට මම ගිය අවස්ථාවේ " මැලේරියා ඉරැඩිකේටඩ් " කිව්වා. ඒ කී දේ ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒවාත් ඉෂ්ට කරලා, අපේ ලොකුම හතුරා වන ත්‍රස්තවාදීන්ට — සිංහල හෝ දෙමළ හෝ — මම කියනවා අප සමඟ අත්වැල් බැඳගන්න කියා. ඒ වාගේම විරුද්ධ පක්ෂයත් මේ සමුළුවට අප සමග සම්බන්ධ වෙලා ලබන අයවැය ලේඛනයේදී අපට සමගිය සාමය, සදාචාරය ඇතිකරගන්න උදව්වෙන්න කියා ඉල්ලනවා. අපේ බුදුරජාණන්වහන්සේගේ වචනය අනුව සාමය ඇති වී, නිවහල් ජාතියක් වශයෙන් වැජඹීමට ත්‍රිවිධ රත්නයේ පිහිටත් සියලු දෙවියන්ගේ ආරක්ෂාවත් අපට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචනවලට සවන් දුන් සියලු දෙනාටම ස්තූති කරමින් මෙතෙක් වේලා කථා කිරීමට මට අවසර දුන්නාවූ නියෝජ්‍ය කාරක සභාපතිතුමාටත් ස්තූති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

---

*[ඉතිරි වැඩ කටයුතු සඳහා 1984 නොවැම්බර් 20 වන අඟහරුවාද නිල වාර්තාව බලන්න]*
*[நிகழ்ச்சித் தொடரை, 1984 நொவெம்பர் 20, செவ்வாய்க்கிழமைய அதிகார அறிக்கையிற் பார்க்க.]*
[ *For continuation of Proceedings see OFFICIAL REPORT for Tuesday 20th November, 1984.* ]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1984 දෙසැම්බර් 3 වන සඳුදා

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි

குறிப்பு

*அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு*

1984 டிசம்பர் 3, திங்கட்கிழமைக்குப் பிந்தாமற்

*கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.*

**NOTE**

**Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD**

**not later than**

**Monday, 3rd December 1984**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 1.30 p.m. on 16.11.1984 to 11.27 a.m. on 19.11.1984** |
| **Final set of manuscripts received from Parliament** | **:** | **7.10 p.m. on 19.11.1984** |
| **Printed copies despatched** | **:** | **20.11.1984 morning.** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org